# 2012

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report



අධ්‍යාපන අමාත්‍යාංශය    கல்வி அமைச்சு    Ministry of Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2012

අධ්‍යාපන අමාත්‍යාංශය

නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

2013 අගෝස්තු

නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**අධ්‍යාපන ලේකම්ගේ පණිවිඩය,**

2012 වර්ෂයේ අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කළ සමස්ත අධ්‍යාපන සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඇතුළත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි.

නිදහස් අධ්‍යාපනය තුළින් ජයග්‍රහණ රැසක් අත්පත් කර ගැනීමට සමත් වූ රටක් ලෙස එම අධ්‍යාපන ප්‍රතිපත්ති තවදුරටත් සුරකිමින් ගුණාත්මක සංවර්ධනය වඩාත් කඩිනමින් හා අර්ථාන්විත වූ ප්‍රවේශයකින් යුතුව මෙහෙයවීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛතම ඉලක්කය වී ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්ම පුනර්ජීව වැඩසටහනට සමගාමීව 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රමුඛතම සංවර්ධන වැඩසටහන ලෙස මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් හා ඊට අනුබද්ධ වූ ළමා මිතුරු ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන හැඳින්විය හැක. නිශ්චිත ඉලක්ක සහිතව සෑම දරුවෙකුට ම සමාන හා ගුණාත්මක බවින් ඉහළ අධ්‍යාපනයක් ලබා දී විශ්ව පුරවැසියකු බිහි කිරීමේ පුළුල් අරමුණකින් යුතුව ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන සඳහා දේශීය මුදල් මෙන්ම විදේශීය අරමුදල් ද ප්‍රමුඛතාවකින් යුතුව ආයෝජනය කිරීමට පියවර ගෙන ඇත්තෙමු.

ගුරුභවතුන්, විදුහල්පතිවරුන්, අධ්‍යාපන කළමණාකරුවන් හා පරිපාලනයේ යෙදෙන පිරිස් විධිමත්ව බඳවා ගැනීම හා අවශ්‍යතාව මත ස්ථානගත කිරීම මෙන්ම ඔවුන්ගේ වෘත්තීය කුසලතා ඔප්නංවාලීම අධ්‍යාපන සංවර්ධනයෙහිලා ප්‍රමුඛත ම අවශ්‍යතාවයක් සේ හඳුනාගෙන ඒ සඳහා වැදගත් පියවර ගණනාවක් මෙම වසර තුළ ගනු ලැබිණි.

ගුණාත්මක අධ්‍යාපනය සඳහා මෙන් ම යහපත් පුරවැසියන් බිහි කිරීම සඳහා පාසල් ශක්තිමත් කිරීමට මෙන් ම අධ්‍යාපන කළමනාකරණය හා සංවර්ධනය මෙහෙය වන පාසලට ආසන්නතම ආයතන ලෙස කොට්ඨාස හා කලාප කාර්යාල වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම, ගත වූ වර්ෂයේ ප්‍රමුඛ අවධානයක් යොමු වූ වැඩ සටහනකි.

මෙවැනි වූ වැඩ සටහන් රාශියක් තුළින් පාසල් අධ්‍යාපනයේ සමස්ත ගුණාත්මකභාවය ඉහළ නංවමින් අප රට දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ ඉදිරි දැක්ම සාක්ෂාත් කරගැනීම අපගේ අභිප්‍රායයයි.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2012.12.31 දිනට)

**අධ්‍යාපන අමාත්‍ය**

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා

**නියෝජ්‍ය අමාත්‍ය**

ගරු විජිත් විජිතමුණි ද සොයිසා මැතිතුමා

**අධීක්ෂණ මන්ත්‍රී**

ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා

**අධ්‍යාපන ලේකම්**

එස්. එම්. ගෝඨාභය ජයරත්න මැතිතුමා

**සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**

අතිරේක ලේකම් - එස්.යූ. විජේරත්න මයා

**අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය**

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක මයා

**අධ්‍යාපන සේවා ආයතන අංශය**

අතිරේක ලේකම් - එච්.එම්.ආර්.බී හේරත් මයා

**පාසල් සැපයීම්, සේවා හා ඉදිකිරීම් අංශය**

අතිරේක ලේකම් - අනුර දිසානායක මයා

**පාලන හා මුදල් අංශය**

අතිරේක ලේකම් - එන්.එච්.එම්. චිත්‍රානන්ද මයා

ප්‍රධාන ගණකාධිකාරී - බී.ඒ.කේ. ජයසිංහ මයා

# පටුන

## 1. අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම හා කාර්යභාරය


දැක්ම 1
මෙහෙවර 1
අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම 1
අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය 2
අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන 2


## 2. ජාතික අධ්‍යාපන සංවර්ධන ඉලක්ක සහ ක්‍රමෝපායික සැලැස්ම 2012 - 2016


2.1 ජාතික අධ්‍යාපන සංවර්ධන ඉලක්ක 3
2.2 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2012 - 2016 3


## 3. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගීත්වය සහතික කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග


3.1 මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් හා ප්‍රාථමික පාසල් 5000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන 5
3.2 අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම 9
3.3 අන්තර්කරණ අධ්‍යාපනය 9
3.4 ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් 9
3.5 ජාතික පාසල් සංවර්ධනය 9
3.6 විශේෂ සංවර්ධන අවශ්‍යතා සහිත පාසල් සඳහා වූ වැඩසටහන් 10
3.7 පිරිවෙන් අධ්‍යාපනය 11
3.8 නොවිධිමත් අධ්‍යාපනය 11
3.9 විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ අධ්‍යාපනය 12


## 4. විෂයය හා විෂයය සමගාමී වැඩසටහන් වල ගුණාත්මක සංවර්ධනය


4.1 ප්‍රාථමික අධ්‍යාපනය 13
4.2 ගණිත අධ්‍යාපනය 14
4.3 විද්‍යා අධ්‍යාපනය 15
4.4 ජාතික භාෂා අධ්‍යාපනය 15
4.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය 16
4.6 ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය 16
4.7 මානව ශාස්ත්‍ර අධ්‍යාපනය 18
4.8 සෞන්දර්ය අධ්‍යාපනය 18
4.9 කෘෂිකර්ම හා පරිසර තාක්ෂණ අධ්‍යාපනය 19
4.10 තාක්ෂණ අධ්‍යාපනය 19
4.11 වාණිජ හා ව්‍යාපාර අධ්‍යාපනය 20
4.12 ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා කුසලතා දියුණු කිරීම 20
4.13 ආගමික හා සාරධර්ම අධ්‍යාපනය 21
4.14 ද්වි භාෂා අධ්‍යාපනය 21
4.15 ත්‍රි භාෂා ශ්‍රී ලංකා වැඩසටහන 22
4.16 පාසල් පුස්තකාල සංවර්ධනය 22
4.17 සෞඛ්‍ය ප්‍රවර්ධන හා පෝෂණ වැඩසටහන 23
4.18 සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපනය 25
4.19 ශිෂ්‍ය මාර්ගෝපදේශ හා උපදේශන සේවාව 25
4.20 විෂය සමගාමී ක්‍රියාකාරකම් 26
4.21 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන 26

**5.** **මානව සම්පත් සංවර්ධනය**

5.1 ශ්‍රී ලංකා ගුරු සේවය 27
5.2 ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම් 28
5.3 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම් 28
5.4 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම් 28
5.5 විවිධ පුහුණු වැඩසටහන් 28

**6.** **භෞතික සම්පත් සංවර්ධනය**

**7.** **ඵලදායී සේවා සැපයීම් ශක්තිමත් කිරීම සහ කාර්යසාධන ඇගයීම**

7.1 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම හා පළාත් සභා සමඟ සම්බන්ධීකරණය 31
7.2 විදේශීය සහයෝගිතාව හා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය තුළින් ගුණාත්මක ප්‍රවේශයන් කරා යොමුවීම. 32
7.3 අමාත්‍යාංශය තුළ නව සංවර්ධන ප්‍රවේශයන් 32
7.4 කාර්යසාධනය ඇගයීම 33

**8.** **මූල්‍ය ආයෝජනය සහ වියදම් පිළිබඳ ප්‍රගතිය**

8.1 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් සාරාංශය 35
8.2 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් සාරාංශය 36
8.3 සාමාන්‍ය අධ්‍යාපනය සඳහා සමස්ත වියදම 36
8.4 අධ්‍යාපන සංවර්ධනය සඳහා විදේශාධාර හා ආයෝජන 37
8.5 දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකු ආධාර) - EKSP 38
8.6 දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම (ලෝක බැංකුව) 39
8.7 යුනිසෙෆ් ආධාර ලද වැඩසටහන් 40
8.8 කොරියන් (KOICA) ආධාර ලද වැඩසටහන් 40
8.9 නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය (දේශීය අරමුදල්) 40

**9.** **ගුණාත්මක දර්ශක ඇසුරින් කාර්යසාධනය විශ්ලේෂණය**

9.1 තෝරාගත් ප්‍රධාන දර්ශක කිහිපයක් ඇසුරෙන් සංසන්දනයක් 41
9.2 පාසල් පද්ධතිය 42
9.3 ශිෂ්‍ය ප්‍රවේශය සහ සහභාගීත්වය 44
9.4 සුදුසුකම් සපිරි ගුරු පරපුරක් 45
9.5 ශිෂ්‍ය සාධන මට්ටම් ඉහළයාම 46
9.6 ජාත්‍යන්තර විද්‍යා ගණිත ඔලිම්පියාඩ් ජයග්‍රහණ 48

**10.** **මූලික සංඛ්‍යා දත්ත**

## ඇමුණුම්

**ඇමුණුම 1 : සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව** **53**
**ඇමුණුම 2 : 2012 වර්ෂයේ දී නිකුත් කළ චක්‍රලේඛ** **54**
**ඇමුණුම 3 : අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරු හා නිලධාරීන් 2012.12.31 දිනට** **56**

# 1. අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම හා කාර්යභාරය

## දැක්ම

ශ්‍රී ලාංකීය අනන්‍යතාවයේ හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මගින් ජාත්‍යන්තර සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

## මෙහෙවර

පාර්ශවකරුවන් තෘප්තිමත් භාවයට පත්වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මක භාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද හා නූතන ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි මව්බිමට ආදරය කරන යහපත් දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම



## අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීම, සඳහා *'මහින්ද චින්තනය ඉදිරි දැක්ම'* නව ශ්‍රී ලංකාවක් කරා ප්‍රතිපත්ති රාමුව යටතේ තිරසර සංවර්ධනයක් උදෙසා රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් අතර අධ්‍යාපන සංවර්ධනයට හිමි ව ඇත්තේ ප්‍රමුඛස්ථානයකි.

ආසියාවේ දැනුම් කේන්ද්‍රය ලෙස ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමේ දැවැන්ත කාර්යභාරයට දායකත්වය සැපයීමේ සුවිසල් වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුය.

*'හොඳ ම දේ දරුවන්ටයි'* යන සංකල්පය යථාර්ථයක් බවට පත් කරලීම සඳහා කිසිදු විෂමතාවයකින් තොර ව සෑම දරුවෙකුට ම එක හා සමාන අධ්‍යාපනයක් ලබාදීම උදෙසා සියලු අභියෝග හමුවේ ශක්තිමත් ව නව සංවර්ධනාත්මක ප්‍රවේශයකින් යුතු ව වැඩසටහන් රැසක් ක්‍රියාවට නැංවීමට අධ්‍යාපන අමාත්‍යාංශය සියලු පියවර ගෙන ඇත.

ජාතික අධ්‍යාපන අරමුණු ඉටු කරගැනීම සඳහා පළාත් සභා සමඟ නිරන්තර මනා සම්බන්ධතාවක් පවත්වා ගනිමින් ඉලක්ක ගත සංවර්ධනයක් උදෙසා අවශ්‍ය සියලු පාර්ශ්වයන් යොමු කිරීමේ වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය නොපිරිහෙලා ඉටු කරයි.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම හා නවීකරණය පිළිබඳව ජාතික අධ්‍යපන කොමිසමට නිර්දේශ හා ප්‍රතිපෝෂණ සපයමින් අධ්‍යාපනයේ පුළුල් අරමුණුවල පිහිටා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති අර්ථකථනය හා භාවිතය.

- ජාතික අරමුණුවලට හා ප්‍රතිපත්තිවලට අනුකූල ව අධ්‍යාපනික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නියාමනය, ප්‍රගති සමාලෝචනය හා ඇගයීම.

- අධ්‍යාපන සංවර්ධනය සඳහා ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික විදේශ සබඳතා පවත්වා ගැනීම, කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගී ව කටයුතු කිරීම.

- සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රමිති නිර්ණය කිරීම හා එම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු යෙදීම සහ පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතනයන්හි නිර්මාණශීලී ක්‍රියාකාරකම් වර්ධනය කිරීම.

- සාමාන්‍ය අධ්‍යාපනය, ගුරු අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය හා පිරිවෙන් අධ්‍යාපනයට අදාළ විෂයමාලා සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.

- අධ්‍යපන සංවර්ධනය සඳහා පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනාගෙන පර්යේෂණ පැවැත්වීම හා එම ප්‍රතිඵල අධ්‍යාපන ක්‍රියාවලියෙහිලා ප්‍රයෝජනයට ගැනීම.

- ජාතික මට්ටමේ සහතික විභාග, විෂය විභාග හා අභියෝග්‍යතා පරීක්ෂණ සඳහා සුදුසු ඇගයීම් ක්‍රම පවත්වාගෙන යාම සහ සමාලෝචනය.

- ප්‍රබල ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ගුරු අධ්‍යාපනික ආයතන හා ජාතික පාසල්වල කළමනාකරණය හා කාර්යසාධනය ඇගයීම.

- අධ්‍යාපන කළමනාකරණය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව පළාත් අධ්‍යාපන බලධාරීන්ට උපදෙස් සැපයීම, සම්බන්ධීකරණය හා සමාලෝචනය.

- විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.

- ඉගෙනුම් ආධාරක, අධ්‍යාපන ගොඩනැගිලි හා උපකරණ සඳහා පිරිවිතර හා ප්‍රමිති නිශ්චය කිරීම හා සැලසුම් සංවර්ධනය කිරීම.

- පෙළපොත්, නිල ඇඳුම් හා ජාතික මට්ටමින් සැපයිය යුතු සේවා හා භාණ්ඩ සැපයීම.

- අධ්‍යාපන විෂය යටතේ සියලු ම ප්‍රාග්ධන වියදම් ද, අධ්‍යාපන අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල පුනරාවර්තන වියදම්ද ඇස්තමේන්තු කිරීම හා මුදල් වෙන් කිරීම සහ ක්‍රමවත් මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

- අධ්‍යාපන ක්ෂේත්‍රය යටතේ ඇති සියලු ම සේවාවන්වල ව්‍යවස්ථා පරිපාලනය කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල මනා අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම.

## අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- ජාතික අධ්‍යාපන ආයතනය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම

# 2. ජාතික අධ්‍යාපන සංවර්ධන ඉලක්ක සහ ක්‍රමෝපායික සැලැස්ම 2012 - 2016

## 2.1 ජාතික අධ්‍යාපන සංවර්ධන ඉලක්ක

මහින්ද චින්තන ඉදිරි දැක්ම (2010) ඇතුළු රාජ්‍ය ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිමය රාමුව ශක්තිමත් ව ගොඩනැඟීමට පාදක වී ඇත. එසේ ම සැමට අධ්‍යාපනය හා සහශ්‍ර සංවර්ධන ඉලක්ක යන ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සංගත වී ඇත. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් හා බැඳුණු සංවර්ධන ඉලක්ක 11ක් 2012 - 2016 කාලරාමුව සඳහා හඳුනාගෙන ඇති අතර 2016 දී එම ඉලක්ක අත්පත් කර ගැනීමේ අභිමතාර්ථය උදෙසා ශක්තිමත් ක්‍රමෝපායික සැලැස්මක් සකස් කරනු ලැබ ඇත.

1. අනිවාර්ය අධ්‍යාපන වයසේ සියලු ම දරුවන් සඳහා අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා සහතික කිරීම හා අ.පො.ස. (සා.පෙළ) දක්වා සහභාගීත්වය 85% සිට 90% දක්වා ඉහළ නැංවීම.
2. මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් සහ ළමා මිතුරු ප්‍රවේශය සහිත ප්‍රාථමික පාසල් 5000ක් ප්‍රතිනිර්මාණය කිරීම
3. අ.පො.ස. (සා.පෙළ) සමත් ප්‍රතිශතය 61% සිට 75% දක්වා ඉහළ නංවාලීම
4. අ.පො.ස. (උ.පෙළ) සමත් ප්‍රතිශතය, විද්‍යා විෂයය ධාරාව 50% සිට 53% දක්වා , වාණිජ විෂයය ධාරාව 51% සිට 60% දක්වා, කලා විෂයය ධාරාව 59% සිට 63% දක්වා ඉහළ නැංවීම.
5. අ.පො.ස. (උ.පෙළ) සහභාගීත්වය, විද්‍යා හා තාක්ෂණ විෂයය ධාරාව 21% සිට 30% දක්වාත් , වාණිජ විෂයය ධාරාව 27% සිට 34% දක්වා සහ කලා විෂයය ධාරාව විෂයය ඵලදායීව විවිධාංගීකරණය කිරීම.
6. වෘත්තීය සුදුසුකම් සපිරි ගුරු ප්‍රතිශතය 81% සිට 90% දක්වා වැඩි කිරීම.
7. ශිෂ්‍ය තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව 30% සිට 60% දක්වාත්, තොරතුරු තාක්ෂණ කුසලතා සහිත ගුරු සංඛ්‍යාව 30% සිට 65% දක්වාත් ඉහළ නැංවීම.
8. අ.පො.ස. (සා.පෙළ) සහ (උ.පෙළ) හදාරා පාසල් හැරයන සිසුන් 100,000ට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සඳහා පදනම පාසල් මට්ටමින් සැපයීම.
9. සමාජ සංහිඳියාව අගයන ගුරු - සිසු පිරිසක් බිහිකිරීමේ පදනම ලෙස 9,931ක් වූ සියලු ම පාසල්වල ත්‍රිභාෂා ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීම.
10. උසස් පෞරුෂයක් සහ ශාරීරික යෝග්‍යතාව සහිත දරු පරපුරක් බිහිකරලීමේ පදනම ලෙස 9,931ක් වූ සියලු ම පාසල්වල ක්‍රීඩා, සෞන්දර්යය හා විෂය - සමගාමී ක්‍රියාකාරකම් අවස්ථා පුළුල් කිරීම.
11. සියලු ම අධ්‍යාපනික ආයතන විශිෂ්ට සේවා සැපයීම පිළිබඳ ජාතික ඵලදායීතා ප්‍රමිතීන් සපුරාලන ආයතන බවට පත්කිරීම.

## 2.2 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2012 - 2016

2012 - 2016 ජාතික අධ්‍යාපන ක්‍රමෝපායික සැලැස්මෙහි සුවිශේෂී අරමුණු වී ඇත්තේ අනාගත දැනුම් පාදක ආර්ථිකයකට, හා සමාජයට අවශ්‍ය මානව ප්‍රාග්ධනයෙහි පදනම ලෙස ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය සූදානම් කරලීමයි.

එබැවින් මෙම ක්‍රමෝපායික සැලැස්ම "දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම" ලෙස හඳුන්වනු ලැබ ඇත.

*"සමස්තයක් වශයෙන් ගත් කළ, අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (2012-2016), අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම ප්‍රධාන අරමුණු කොටගෙන ඇත. එහිලා අනාගත දැනුම් පාදක ආර්ථිකයන් හි ඇති ඉල්ලුමට සරිලන පරිදි විෂයමාලා විවිධාංගීකරණය තුළින් සිසුන්ගේ දැනුම, කුසලතා හා අගනාකම් ඉහළ නැංවීමට අදාළ වැඩසටහන්, ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම තවදුරටත් වූ අරමුණු වේ. 1 - 5 ශ්‍රේණි දක්වා වූ ප්‍රාථමික අවධිය, ද්විතීයික අධ්‍යාපනයෙහි පදනම වේ. එබැවින් ප්‍රාථමික අධ්‍යාපන කාලසීමාව ළමා කාලයෙහි සමෝධානික කාලපරිච්ඡේදයක් බැවින් එම ශ්‍රේණිවල සිසුන් තුළ භෞතික, මානසික, චිත්තවේගය, සිතුම් පැතුම් හා සමාජීය සංවර්ධන කුසලතා වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ." ( විධායක සාරාංශය, ජාතික ක්‍රමෝපායික සැලැස්ම, අධ්‍යාපන අමාත්‍යාංශය 2012)*

ජාතික ක්‍රමෝපායික අධ්‍යාපන සැලැස්ම පහත සඳහන් පරිදි ප්‍රතිපත්තිමය තේමාවන් 3ක් සහ පදනම් තේමාවක් යටතේ සංවිධානය කොට ඇත.

**තේමාව 1 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ හා සහභාගීත්ව අවස්ථා ඉහළ නැංවීම**

- නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය අඛණ්ඩ ව පවත්වාගෙන යාම තහවුරු කිරීම.
- අවුරුදු 06 සිට 14 දක්වා වූ අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාව අවුරුදු 6 සිට 16 දක්වා දීර්ඝ කිරීම.
- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රවේශ අවස්ථා සම්බන්ධ විෂමතාවයන් අවම කිරීම
- පාසල් යායුතු වයසේ සිටින එහෙත් පාසල් නොයන ශිෂ්‍ය සංඛ්‍යාවන් අවම කිරීම
- නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ව්‍යාප්ත කිරීම
- විධිමත් හා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ අධ්‍යාපන හිමිකම් තහවුරු කිරීම
- පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීම
- පාසල තුළ ආරක්ෂිත හා සුරක්ෂිත ඉගෙනුම් වාතාවරණයක් සහතික කිරීම
- පාසල් සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම
- වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සංස්කෘතික අනන්‍යතාවට ගැළපෙන පරිදි විෂයමාලා යාවත්කාලීන කිරීම.
- පාසල් මට්ටමින් උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම
- අවාසි සහගත ප්‍රදේශවල ජීවත්වන පාසල් සිසුන් සඳහා නැවත පාසල්ගත කිරීමේ වැඩසටහන්, මහ හැරුණු ඉගෙනුම් අවස්ථා නැවත ලබාදීම සඳහා මැදිහත් වීම
- ප්‍රාථමික හා ද්විතීයික සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය තහවුරු වන පරිදි කාර්යක්ෂම ද්විතීයික පාසල් දහසක් සහ ප්‍රාථමික පාසල් සහිත පාසල් ජාල ස්ථාපිත කිරීම.

**තේමාව 2 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම**

- නිපුනතා පදනම් වූ සාධාරණ හා සමබර විෂයමාලා විවිධාංගීකරණය හා සංවර්ධනය
- විද්‍යා අධ්‍යාපනය සඳහා සමසාධාරණ ද්විතීයික අධ්‍යාපන පහසුකම් ඇති කිරීම
- උතුර, නැගෙනහිර පළාත්වල ගැටුම් නිසා බලපෑමට ලක් වූ ප්‍රදේශ වල අධ්‍යාපන සංවර්ධනය.
- මූලික පහසුකම් සහ උසස් මට්ටමේ ඉගෙනුම් පහසුකම් ජාතික ප්‍රතිමානවලට අනුව සෑම පාසලකට ම සැපයීම
- මව් භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ ද්විභාෂා අධ්‍යාපන අවස්ථා ඇති කිරීම.
- සෑම ශිෂ්‍යයකුට ම ක්‍රීඩාවෙහි පහසුකම් සැපයීම
- අ.පො.ස. (උ.පෙළ) සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍ය සංඛ්‍යා ප්‍රතිශතය ඉහළ නැංවීම හා අ.පො.ස. (උ.පෙළ) විද්‍යා හා වාණිජ විෂයධාරා ඉගෙනීමට ඇති අවස්ථා පුළුල් කිරීම
- සිසුන්ගේ විෂය ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගැනීම
- විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි ඇතුළු සියලු ම විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු ස්ථාපනය විචාරවත් කිරීම හා එම විෂයයන් ඉගැන්වීමට නවීන තාක්ෂණික ඉගෙනුම් හා ඉගැන්වීම් උපකරණ සැපයීම
- ගුරුවරුන්ගේ වෘත්තිකභාවය හා ගරුත්වය ඉහළ නැංවීම.
- ශිෂ්‍ය මාර්ගෝපදේශ සහ උපදේශක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සමාජ ඒකාග්‍රතාවය හා ආගමික සාමූහිකත්වය පාසල් හරහා ප්‍රවර්ධනය කිරීම
- සාරධර්ම අධ්‍යාපන හා මානව අයිතිවාසිකම් පාසල් විෂයමාලාවට අන්තර්ගත කිරීම.
- ඇගයීම්, තක්සේරුකරණය හා විභාග ක්‍රමය නවීකරණය
- පාසල් පෙළපොත් විෂය අන්තර්ගතයන් හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම

**තේමාව 3 : අධ්‍යාපනයේ යහපාලනය හා සේවා සැපයීම් ශක්තිමත් කිරීම**

- පාසල් පාදක සැලසුම්කරණය හා පාසල් නඟා සිටුවීමේ වැඩසටහන ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම
- සෑම ප්‍රාථමික පාසලක ම ළමා මිතුරු පාසල් ප්‍රවේශය ශක්තිමත් කිරීම
- කළමනාකරණ හා මූල්‍යමය තීරණ ගැනීමේ බලතල පාසල් වෙතම පැවරීම
- විදුහල්පතිවරුන්ගේ සහ අධ්‍යාපන නිලධාරීන්ගේ වෘත්තීමයභාවය ඉහළ නැංවීම
- විදුහල්පති පුහුණු ඇකඩමියක් ස්ථාපිත කිරීම
- කලාප අධ්‍යාපන කාර්යාල, අධ්‍යාපන කළමනාකරණ ඒකක ලෙසත්, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල අධ්‍යාපන උපකාරක හා සහාය ඒකක ලෙසත් ශක්තිමත් කිරීම

**පදනම් තේමාව : අධ්‍යාපන ආංශික සංවර්ධන පෙරළුම් සැලැස්ම**

- ආර්ථික විද්‍යාත්මක සම සාධාරණත්වය හා කාර්යක්ෂමතාව තහවුරු වන අන්දමින් සම්පත්කරණය, මූල්‍යකරණය හා සැලසුම්කරණය
- සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපන සැලසුම්කරණය, අයවැයකරණය, පර්යේෂණ හා නියාමන හා ඇගයීම් සංස්කෘතීන් ශක්තිමත් කිරීම
- අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම
- ජාතික ඇගයීම් පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම හා ඉන් අනාවරණය වන තොරතුරු අධ්‍යාපන සැලසුම් වල දී ප්‍රයෝජනයට ගැනීම

**හරස් ක්‍රියාකාරකම**

ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම් රාමුව ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම

සමස්තයක් වශයෙන් මෙම මධ්‍ය කාලීන වැඩසටහන ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය හා ප්‍රාදේශිය සංවර්ධනය අභිමුඛ කරමින් ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රාදේශීය ව දැනුම හා කුසලතා පූර්ණ ප්‍රජාවක් බිහිකිරීම හරහා සමාජ ආර්ථික පරතරයන් පියවීමට එය දායක වනු ඇත. එසේ ම ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය තුරන් කිරීමට උපකාරී වීම ද මැදි ආදයම් ලබන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය තහවුරු කිරීමට උපකාරී වීම ද මෙම වැඩසටහනේ දිගුකාලීන අපේක්ෂාව වේ.

# 3. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගීත්වය සහතික කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග

## 3.1 මහින්දෝදය ද්විතීයික පාසල් 1000ක් හා එම පාසල් හා ජාලගත ප්‍රාථමික පාසල් 5000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2012 - 2016 දක්වා වූ මධ්‍යකාලීන සංවර්ධන වැඩසටහනේ ප්‍රමුඛත ම අධ්‍යාපන සංවර්ධන ක්‍රියාදාමය ලෙස ද්විතීයික පාසල් 1000ක් සහ ඒ හා ජාලගත ප්‍රාථමික පාසල් 5000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඇරඹීම 2012 වර්ෂය තුළ ලද විශාල ජයග්‍රහණයකි.

ප්‍රාදේශීය වශයෙන් අධ්‍යාපනික අවස්ථා පිළිබඳ පවත්නා විෂමතා , සම්පත් බෙදීයාමේ අසමානතා, ඌන සාධනීය මට්ටම්, නාගරික පාසල්හි ශිෂ්‍ය ගහණය වැඩිවීම සහ සිසු සෞඛ්‍ය හා පෝෂණ ගැටළු වැනි විවිධ ගැටළු රැසක් සඳහා ප්‍රායෝගික විසඳුම් ළඟා කර ගැනීමට මෙම වැඩසටහන මගින් පුළුල් පදනමක් සපයා ඇත.

ශ්‍රී ලංකාවේ අනාගත දැනුම් කේන්ද්‍රයට අවශ්‍ය මානව ප්‍රාග්ධන පදනම බිහි කිරීමට හැකි ගුණාත්මක අධ්‍යාපන අවස්ථා සමසාධාරණ ලෙස සිසුන් වෙත සැපයීමේ පුළුල් අපේක්ෂාවෙන් යුතු ව මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

### 3.1.1 වැඩසටහනේ අභිමතාර්ථයන් සහ අරමුණු

- ප්‍රාදේශීය හා ආයතනික වශයෙන් පවතින සම්පත් විෂමතා අවම කොට සියලු දරුවන්ට සම අධ්‍යාපන අවස්ථා ලැබීමේ අයිතිය තහවුරු කිරීම.
- වැසියාමේ තර්ජනයට ලක් ව ඇති දුෂ්කර හා අවාසි සහගත ප්‍රදේශවල පිහිටා ඇති පාසල් කෙරෙහි සුවිශේෂ අවධානය යොමුවීම හරහා අධ්‍යාපන සම්පත් උපයෝජනය ඉහළ නැංවීම හා එමගින් ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ ඉහළ නැංවීම.
- පරිපාලනමය, කළමනාකරණ හා ශික්ෂණමය ව්‍යවහාරයන් උසස් මට්ටමකට රැගෙන ඒම තුළින් ඉහළ ගුණාත්මක බවින් යුත් ප්‍රියජනක ඉගෙනුම් අත්දැකීම් සහිත ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීම.
- සියලු ම විෂයයන් හා විෂය ධාරාවන් ඉගෙනීම සඳහා අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ඉල්ලුමට සරිලන කුසලතා පිරි තරුණ ශ්‍රී ලාංකික පුරවැසියන් පිරිසක් බිහිකිරීම.
- ශාස්ත්‍රීය කුසලතා මෙන්ම සන්නිවේදන කුසලතා, නායකත්ව කුසලතා, වාණිජමය හුරුකම්, ආදී මෘදු කුසලතාවලින් හෙබි සිසු පරපුරක් බිහිකිරීම.
- ධනාත්මක ආකල්ප වලින් සපිරි මානවීය ගුණාංගවලින් පිරි නිරෝගී සෞඛ්‍ය සම්පන්න දරු පරපුරක් බිහි කිරීම සඳහා අවශ්‍ය පදනම සැපයීම.
- මෘදු කුසලතා ඔප්නැංවෙන හා වැඩිදියුණු වන සුවිශේෂී වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පාසල ශක්තිමත් කළමනාකරණයකින් යුත් යහපත් ප්‍රජා සම්බන්ධතා සහිත ඵලදායී ආයතන ලෙස සංවර්ධනය කිරීම .

### 3.1.2 වැඩසටහනේ ප්‍රධාන සංරචකයන්

1. අධ්‍යාපනික ගුණාත්මක සංවර්ධන ප්‍රමුඛතා

- අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස.(උසස් පෙළ) ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ වැඩසටහන.
- අ.පො.ස.(උසස් පෙළ) විද්‍යා අධ්‍යාපන ධාරාව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අවම වශයෙන් පාසල් 03කවත් ආරම්භ කිරීම.
- ගණිතය , තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ විදෙස් භාෂා ඉගැන්වීමේ ක්‍රමවේද දියුණු කිරීම සහ පහසුකම් සැපයීම.
- ක්‍රීඩා, සෞන්දර්ය සහ විෂය සමගාමී කේෂ්ත්‍රයන් සඳහා යොමු වීමට අවස්ථා සැපයීම හා දරුවන් දිරි ගැන්වීම.
- ජාතික විභාග අවසන් කර පාසලින් ඉවත්වන දරුවන්ට මූලික නිපුනතා සහතිකයක් ලබා දී නිපුනතා සංවර්ධනයට සහ වෘත්තීය පුහුණුවට යොමු කිරීම

2. මානව, භෞතික, යටිතල හා මූල්‍යමය සම්පත් සැපයීම සංවර්ධනය

- මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය තුළින් ගණිතය , තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ විදෙස් භාෂා ඉගෙනීම සඳහා නවීන පහසුකම් ලබාදීම.
- අවශ්‍ය පරිදි පුහුණුව ලත් ගුරුවරුන් ලබාදීම සහ අඛණ්ඩ ගුරු පුහුණුව.

3. යහපාලනය සහ සේවා සැපයීම බලාත්මක කිරීමේ ප්‍රමුඛතා

- දක්ෂ නිර්මාණශීලී විදුහල්පතිවරුන් පත් කිරීම සහ උසස් කළමනාකරණ පුහුණුවක් ඔවුන්ට ලබා දීම.
- සුදුසු පරිදි පාසල වෙත මූල්‍ය හා කළමනාකරණ බලතල ලබා දීම.

### 3.1.3 ද්විතීයික පාසල් සහ ප්‍රාථමික පාසල් තෝරා ගැනීම


නිර්ණායක මූලික ක්‍රමවේදයක් යටතේ පාසල් සිතියම්කරණ අභ්‍යාසයක් මගින් ප්‍රාදේශීය අග්‍රගණ්‍ය ද්විතීයික පාසලක් සහ ඊට ආසන්න පෝෂිත පාසල් සහිත පාසල් ජාලයක් ඇතුළත් වන පරිදි පාසල් තෝරා ගන්නා ලදී. විශේෂයෙන් පළාත් මට්ටමේ මැදිහත් වීම සහිතව සියලු පාර්ශවයන්ගේ එකඟතාවය මත මෙම පාසල් තෝරාගැනීම ගැටළු අවම වන අයුරින් සිදුකරන ලදී.

ඒ අනුව 2012 – 2013 වර්ෂ සඳහා ප්‍රමුඛතාවයෙන් යුතු ව ද්විතීයික පාසල් 632ක් ද, ඒ හා බැඳුණු ප්‍රාථමික පෝෂිත පාසල් 2000ක් ද සංවර්ධනය සඳහා තෝරා ගන්නා ලදී.

### 3.1.4 ද්විතීයික පාසල් 1000 සංවර්ධනය කිරීමේ ප්‍රගතිය

#### i මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම

මහින්දෝදය විද්‍යාගාර 2ක් රත්මලාන කොතලාවලපුර විද්‍යාලයයේ සහ පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලයයේ ඉදිකොට අවසන් කර සිසු අයිතියට පවරා එම ආකෘතීන් අනුව 2012 වසර තුළ තවත් විදුහල් 409ක් තුළ මෙම මහින්දෝදය විද්‍යාගාර ඉදිකිරීමට කටයුතු කරන ලදී.




3.1.1 වගුව : පළමු අදියර යටතේ (2012 දී ආරම්භ කළ) ඉදිවන මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සංඛ්‍යාව හා සෘජුව ම ප්‍රතිලාභ ලබන ශිෂ්‍ය සංඛ්‍යාව

| පළාත | සංවර්ධනය කරනු ලබන පාසල් සංඛ්‍යාව | ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | 41 | 35,060 |
| මධ්‍යම | 25 | 20,660 |
| දකුණු | 46 | 34,087 |
| උතුර | 28 | 9,739 |
| උතුරු මැද | 27 | 32,452 |
| වයඹ | 68 | 36,478 |
| සබරගමුව | 61 | 37,445 |
| නැගෙනහිර | 72 | 54,031 |
| ඌව | 41 | 31,359 |
| එකතුව | 409 | 282,311 |

#### ii මානව සම්පත් සැපයීම සහ ගුරු සංවර්ධනය

සෘජුව ම ද්විතීයික පාසල් 1000 ඉලක්ක කොට තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි, විද්‍යාව සහ ගණිතය නව උපාධිධාරී ගුරුභවතුන් 3000ක් පාසල් පාදක ව බඳවා ගැනීමේ ඉලක්කයට අනුව පහත සඳහන් ගුරු සංඛ්‍යා 2012 වර්ෂයේ දී බඳවාගෙන පත් කරනු ලැබිණි.

- තොරතුරු තාක්ෂණ උපාධිධාරීන් - 922
- විද්‍යා උපාධිධාරීන් - 485
- ගණිත උපාධිධාරීන් - 488
- ඉංග්‍රීසි උපාධිධාරීන් - 201

#### iii විදුහල්පතිවරුන් පත් කිරීම

මෙම ද්විතීයික පාසල් සඳහා කළමනාකරණ කුසලතාවලින් හෙබි දක්ෂ විදුහල්පතිවරුන්ගේ සංචිතයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. එහි පළමු පියවර ලෙස විදුහල්පතිවරු 69 දෙනෙකුට දින 05ක ආරම්භක පුහුණුවක් ලබා දෙන ලදී.

#### iv පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන ලබාදීම

ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ මුල් අදියරේ පාසල් 405ක් සඳහා අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රවේශ රාමු (ESDFP/ TSEP) වැඩසටහන මගින් පාසල් පාදක සංවර්ධන කටයුතු සඳහා එක් පාසලකට රු. ලක්ෂ 5ක මූල්‍ය ප්‍රතිපාදනයන් ලබා දෙන ලදී.

#### v ආසියානු සංවර්ධන බැංකු ආධාර ලබන දැනුම් සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP) යටතේ ද්විතීයික පාසල් 104ක් පාසල් 1000 වැඩසටහන යටතේ ප්‍රතිනිර්මාණය කිරීම.

දිවයිනේ ද්විතීයික පාසල් 1400ක් වෙත අත්‍යාවශ්‍ය නඩත්තු අලුත්වැඩියා හා භෞතික සම්පත් සංවර්ධන ක්‍රියාදාම වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා රුපියල් ලක්ෂය බැගින් වන සේ පාසල් පාදක මූල්‍ය ප්‍රදානයක් ලබා දෙන ලදී. මෙහි විශේෂත්වය වනුයේ මෙම මූල්‍ය සම්පත් ආයෝජනය කිරීමේ දී තීරණ ගැනීම, සැලසුම් සැකසීම හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලය පාසලට පවරා දී වඩාත් ප්‍රියමනාප ක්‍රියාදාමයක් හා පසුබිමක් සකස්කර දී තිබීමයි.

ව්‍යාපෘතියෙහි ආයෝජනය යටතේ පාසල් 100ක් අ.පො.ස. (උ.පෙළ) විද්‍යා ධාරාව සඳහා අංග සම්පූර්ණ විද්‍යාගාර 3ක් සහිතව රු.මි. 2000 කට ආසන්න ආයෝජනයක් යොදවමින් සංවර්ධනය කරන ලදී. පාසල් 32ක් සිසු අයිතියට පත් කර ඇත.

**3.1.2 වගුව : ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කෙරෙමින් පවතින ද්විතීයික පාසල් සංඛ්‍යාව**

| පළාත | පාසල් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 14 |
| මධ්‍යම | 12 |
| දකුණු | 12 |
| උතුරු | 17 |
| නැගෙනහිර | 11 |
| වයඹ | 8 |
| උතුරු මැද | 8 |
| ඌව | 8 |
| සබරගමුව | 10 |
| ශ්‍රී ලංකාව | **100** |








රත්මලාන කොතලාවලපුර විද්‍යාලයයේ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය විවෘත කිරීම



හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයයේ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය විවෘත කිරීම



මහින්දෝදය විද්‍යාගාරය තුළ අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාරයක්.....



ගණිතය ප්‍රියාමනාපව ඉගෙනීමට ගණිතාගාරයක්.....





යාපනය ස්කන්ධවරෝදය විද්‍යාලය සංවර්ධනය කිරීමට පෙර සහ EKSP ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමෙන් පසු







කල්පිටිය මාම්පුරී විද්‍යාලය සංවර්ධනය කිරීමට පෙර සහ EKSP ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමෙන් පසු

මෙම පාසල් 50 ද ඇතුළත් ව ව්‍යාපෘතිය මගින් ගුණාත්මක සංවර්ධනයක් ඇති කළ ආරම්භක ද්විතීයික පාසල් 100හි වර්ධනීය ප්‍රවනතා පහත ප්‍රස්තාරවලින් දැක්වේ.

3.1.1 රූපසටහන




3.1.2 රූපසටහන




### 3.1.5 ප්‍රාථමික පාසල් 5000ක් ළමා මිතුරු ප්‍රවේශය අනුව සංවර්ධනය කිරීම

ජනාධිපති කාර්යාලයේ සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ද්විතීයික පාසල් 1000 සංවර්ධනය හා සමගාමී ව එම පාසල් හා ජාලගත වන පරිදි හඳුනාගත් පෝෂිත ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛතම වැඩසටහනක් ලෙස 2012 වර්ෂයේ ක්‍රියාත්මක විය. ප්‍රාථමික අවධියේ අධ්‍යාපනය ළමා සංවර්ධනය සඳහා අතිශයෙන් වැදගත් බව සලකමින් ඊට උචිත ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා සපයන ඉතා ප්‍රිය ජනක, සුරක්ෂිත ළමා මිතුරු පාසල් 5000 ලෙස මෙම ප්‍රාථමික පාසල් ජාලය සංවර්ධනය කිරීම සිදුවේ.

2012 වර්ෂයේ පාසල් 1680ක් ළමා මිතුරු පාසල් ලෙස සංවර්ධනය කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දායකත්වය ලබාගත් අතර, ඒ අනුව සෑම ප්‍රාථමික පාසලක් සඳහා ම රු. ලක්ෂ 5 බැගින් වූ මූල්‍යමය ප්‍රදානයක් පාසල් මට්ටමට ලබාදෙමින් සනීපාරක්ෂක පහසුකම්, පානීය ජල පහසුකම්, පාසල් අලංකරණය ඇතුළු සමස්ත පාසල් පිරියත සංවර්ධනය කිරීමේ අවස්ථාව පාසලට ලබා දෙන ලදී.

ළමා මිතුරු පාසල් වැඩසටහන යටතේ පළාත් සභා සමඟ ඒකාබද්ධ ව තෝරාගත් කලාප 25ක් ආශ්‍රිත ව ආදර්ශ වැඩසටහනක් ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශ මට්ටමින් බහු ආංශික දායකත්වය ලබාගැනීමට කටයුතු කර ඇත.

**3.1.3 වගුව : 2012 වසර තුළ සංවර්ධනය කළ ප්‍රාථමික පාසල් සංඛ්‍යාව**

| පළාත | පාසල් සංඛ්‍යාව |
|---|---|
| සබරගමුව පළාත | 370 |
| බස්නාහිර පළාත | 161 |
| උතුරු මැද පළාත | 178 |
| නැගෙනහිර පළාත | 232 |
| මධ්‍යම පළාත | 152 |
| උතුරු පළාත | 129 |
| ඌව පළාත | 97 |
| දකුණු පළාත | 184 |
| වයඹ පළාත | 177 |
| එකතුව | 1680 |





*ළමා මිතුරු ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් .......*

## 3.2 අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

වර්තමානයේ අවුරුදු 5-14 ලෙස පවතින අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව අවුරුදු 5-16 ලෙස දීර්ඝ කිරීමට අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීමට පියවර ගෙන ඇත. මේ අනුව සියලු ම ළමයින් අවම වශයෙන් 11 වන ශ්‍රේණිය දක්වා පාසලේ රැදීසිටීම අපේක්ෂා කරන අතර, ළමා ශ්‍රමිකයින් බවට පත්වීමේ අවදානම එමඟින් මඟහැරෙනු ඇත.

## 3.3 අන්තර්කරණ අධ්‍යාපනය

සැමට අධ්‍යාපන අරමුණු කරා ළඟාවීමේ ප්‍රවේශයක් ලෙස අන්තර්කරණ අධ්‍යාපනය, එනම් සියලු ම දරුවන්ට උචිත ඉගෙනුම් අවස්ථා පන්ති කාමරය තුළ ස්ථාපිත කිරීම, පාසල් පද්ධතිය තුළ වර්ධනය කිරීමට හා ශක්තිමත් කිරීමට පියවර ගනු ලැබුණි.

ගුරුවරුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපන උපකරණ කට්ටලයක් සකස් කොට එහි පිටපත් 20,435ක් පන්ති කාමරවල භාවිතය සඳහා බෙදාහැරීමට පියවර ගනු ලැබිණි.

විද්‍යුත් ඉගෙනුම් පැකේජයක් සංවර්ධනය කිරීමට සහ තෝරාගත් ගුරු මධ්‍යස්ථාන 13ක එහි නියමු වැඩසටහන් පැවැත්වීමට පියවර ගන්නා ලදී.

සැමට අධ්‍යාපන දශක අග ඇගයීම් වාර්තාව (2005-2010) පිළියෙල කිරීම තුළින් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය පිළිබඳ ව විශ්ලේෂණය කිරීමට හා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ ව නිර්දේශ ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

## 3.4 ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්

- **නොමිලේ පෙළපොත් ලබාදීම**

සියලු ම රජයේ හා රජයෙන් ආධාර ලබන පෞද්ගලික පාසල්වල ද පිරිවෙන්වල ද ඉගෙනුම ලබන ලක්ෂ 41කට ආසන්න ශිෂ්‍ය පිරිසකට 1 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා විෂයමාලාවට අදාළ පෙළපොත් වර්ග 437ක් රජය විසින් නොමිලේ බෙදා හරින ලදී.

- **නොමිලේ නිලඇඳුම් රෙදි ලබාදීම**

සියලු ම රජයේ හා රජයෙන් ආධාර ලබන පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල ශිෂ්‍යයින් ලක්ෂ 40 කට අවශ්‍ය නිලඇඳුම් රෙදි පැකට් ලක්ෂ 65ක් බෙදා හරින ලදී.

- **ශිෂ්‍යාධාර ලබාදීම**

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ සාධන මට්ටමක් පෙන්වන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාසල් අධ්‍යාපනය අවසන් වන තුරු ශිෂ්‍යාධාර පිරිනමනු ලැබේ. 2012 වර්ෂයේ දී මෙලෙස ශිෂ්‍යාධාර ලබන සමස්ත ශිෂ්‍යයින් සංඛ්‍යාව 85,000 කට ආසන්න විය.

**3.4.1 වගුව : ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්**

| වැඩසටහන | ආයෝජනය රු.මි. | | | |
|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 |
| පෙළපොත් | 2,196 | 2,200 | 2,329 | 2,400 |
| පෝෂණ වැඩසටහන් | 2,251 | 2,382 | 2,800 | 2,850 |
| නිලඇඳුම් | 1,260 | 949 | 1,363 | 2,214 |
| ශිෂ්‍යාධාර හා ශිෂ්‍යත්ව | 260 | 200 | 294 | 240 |
| **එකතුව** | **5,967** | **5,731** | **6,786** | **7,704** |

- **දිවා ආහාර හා කිරි වීදුරුවක් ලබා දීම**

දිවයින පුරා පාසල් 7,625ක සිසුන් දස ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් සඳහා දිවා ආහාර ද, පාසල් 1,446ක සිසුන් තුන් ලක්ෂයකට පමණ කිරි වීදුරුවක්ද ලබාදීමට පියවර ගන්නා ලදී.

## 3.5 ජාතික පාසල් සංවර්ධනය

දිවයින පුරා ව්‍යාප්ත ව ඇති 342කින් යුත් ජාතික පාසල් ජාලය සෘජු ව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වේ. ජාතික පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය , භෞතික සම්පත් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

2012 වාර්ෂික කාර්යසාධනය

- අ.පො.ස.(සා.පෙළ) හා (උ.පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- උසස් ප්‍රතිඵල ලබාගත් දූ දරුවන් ඇගයීම

- රු.මිලියන 10ක ප්‍රතිපාදන ජාතික පාසල් 342ක් වෙත ලබාදීම.
- මාර/දෙණියාය ජාතික පාසලට රැස්වීම් ශාලා පුටු ලබාදීම.
- ජාතික පාසල් 64 ක් සඳහා නේවාසිකාගාර, මුළුතැන්ගෙයි උපකරණ මිල දී ගැනීමට ප්‍රතිපාදන මුදාහැරීම.
- ජාතික පාසල් විදුහල්පතිවරුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා දින දෙකක නේවාසික පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

## 3.6 විශේෂ සංවර්ධන අවශ්‍යතා සහිත පාසල් සඳහා වූ වැඩසටහන්

### 3.6.1. කුඩා පාසල් සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ ළමුන් 50ට වඩා අඩු කුඩා පාසල් ප්‍රමුඛතාවයකින් යුතු ව හඳුනාගෙන සුවිශේෂී අරමුණු මත පදනම් වූ සංවර්ධන ක්‍රියාදාමයක් දියත් කොට ඇති අතර, මේ සඳහා ජනාධිපති කාර්යාලයයේ අනුග්‍රහය ලබා දී ඇත. එවැනි පාසල් 1,590ක් මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කරනු ලැබේ.

මෙම වැඩසටහන සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ සහ පෞද්ගලික ආයතනවල දායකත්වය ලබාගැනීම සඳහා උපක්‍රමික ප්‍රවේශයක් දියත් කර ඇත.

පහත දැක්වෙන සංවර්ධන ප්‍රවේශයන් මෙම පාසල්වල ක්‍රියාත්මක වේ

- අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සම්පූර්ණ කිරීම.
- පානීය ජල පහසුකම් අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- ප්‍රාථමික පාසලකට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- පරිගණක තාක්ෂණ පහසුකම් ඇතුළු නවීන ප්‍රාථමික තාක්ෂණික මෙවලම් ලබාදීම.
- ගුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම

### 3.6.2. වතු පාසල් සංවර්ධනය

අවාසිදායක පරිසරයන්හි ජීවත්වන දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීමෙහි ලා රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් අතර, වතු පාසල් සංවර්ධනය ප්‍රමුඛ වේ. වතු පාසල්වල ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීම, විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන්ගේ දැනුම වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් 2012 වර්ෂයේ පහත සඳහන් වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

- ප්‍රාථමික අධ්‍යාපනය සඳහා බහුතල ඉගෙනුම් උපකරණ සකස් කිරීමේ වැඩමුළු 02 ක් මධ්‍යම පළාතේ පැවැත්වීම.
- බහුතල ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳ වැඩමුළු 2ක් සහ 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ගුරු පුහුණු වැඩමුළු 03 ක් ඌව පළාතේ පැවැත්වීම.
- අ.පො.ස(සා.පෙළ) ප්‍රතිඵල වැඩිදියුණු කිරීමේ ශිෂ්‍ය පාදක හා ගුරු පුහුණු වැඩසටහන් දකුණු, සබරගමුව, මධ්‍යම හා ඌව පළාත් වල පැවැත්වීම.

### 3.6.3. දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය

දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ට අධ්‍යාපනයේ සම අවස්ථා ලබාදීම අරමුණු කරගෙන දෙමළ මාධ්‍ය පාසල්වල භෞතික හා මානව සම්පත් සපුරාලීම සඳහාත්, ඉගෙනුම් ක්‍රියාවලිය දියුණු කිරීම සඳහාත් පහත සඳහන් වැඩසටහන් 2012 වර්ෂයේ දි ක්‍රියාත්මක කරන ලදී.

- මන්නාරම් හා මුතූර් කලාපවල විදුහල්පතිවරුන් සඳහා පාසල් පාදක සංවර්ධන ක්‍රියාවලිය හඳුන්වාදීම.
- පාසල් 20ක ශිෂ්‍ය නායකයින් දෙදින නායකත්ව පුහුණු වැඩසටහනට සහභාගි කරවීම.
- උතුරු පළාතේ දෙමළ පාසල් 20ක් අධීක්ෂණය කිරීම
- මඩු අධ්‍යාපන කලාපයට අයත් පාසල් 46කට ද, වවුනියා - උතුර පාසල් 85කට ද එක් පාසලකට පොත් 30 බැගින් පුස්තකාල පොත් ලබාදීම.
- පාසල පදනම් කොට ගුරුපත්වීම් ලබාදීමට දෙමළ පාසල්වල විද්‍යා, ගණිත, ඉංග්‍රීසි ගුරුවරු හිඟය පිළිබඳ තොරතුරු සොයා ගැනීම.

### 3.6.4. මුස්ලිම් පාසල් සංවර්ධනය

දිවයින පුරා පිහිටි මුස්ලිම් සිසුන් බහුතරයක් ඉගෙනුම ලබන පාසල් පිළිබඳ ව සුවිශේෂී අවධානය යොමු කොට, ඉස්ලාමීය සංස්කෘතිය රැකෙන අනන්‍ය පරිසරයක් තුළ ඔවුන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

2012 වර්ෂයේ දි ඉටුකරන ලද වැඩසටහන් පහත දැක්වේ.

- ඉස්ලාමීය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා පාසල් දියත් කරන කාර්යයන් දිරි ගැන්වීම.
- පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීම සඳහා පාසල් බාහිර ඇගයීම් ශක්තිමත් කිරීම.
- සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා දායක වීම.
- අතපසු වී ගිය විශ්‍රාම ගැන්වීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා යුද සමයේ අවතැන් වූ අධ්‍යාපන නිලධාරීන්ගේ ලිපිගොනු උතුරු සහ නැගෙනහිර අධ්‍යාපන කාර්යාලවලට ලබාදීම 50%කින් අවසන් කිරීම.
- මුස්ලිම් පාසල් විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ නිපුනතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 3.7 පිරිවෙන් අධ්‍යාපනය

### 3.7.1 අරමුණු සහ ඉලක්ක

- වාර්ෂික පිරිවෙන් පරීක්ෂණ පවත්වා පිරිවෙන් ආධාර ලබාදීම.
- ගුරුවරුන්ගේ පත්වීම් අනුමත කිරීම.
- පැවිදි ශිෂ්‍යයන්ගේ ආකල්ප සංවර්ධනය.
- කෘත්‍යාධිකාරි පරිවේණාධිපති කළමනාකරණ පුහුණුව ලබා දීම.
- පිරිවෙන් ගුරු උපදේශකවරු පුහුණුකිරීම.
- පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධන කිරීම.
- මූලික පිරිවෙන් පෙළපොත් නැවත ලිවීම.

### 3.7.2 වාර්ෂික කාර්යසාධනය

- පසුගිය වර්ෂයේ ආධාර නොලැබුණ පිරිවෙන් 115කට හිඟ ආධාර ලබාදීම.
- පිරිවෙන් නඩත්තුව සඳහා 25%ක දායකත්වයක් ලබා දීම.
- පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි සංවර්ධනය සඳහා විද්වත් සාකච්ඡාවක් මරදාන විද්‍යෝදය පිරිවෙනෙහි දී පැවැත්වීම සහ පිරිවෙන් සංවර්ධන සැලසුමක් සකස් කිරීම.
- පිරිවෙන් පැවිදි ගිහි ශිෂ්‍යයින්ගේ ආකල්ප සංවර්ධනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම.
- පිරිවෙන් 366 ක කෘත්‍යාධිකාරි පරිවේණාධිපති කළමනාකරණ පුහුණුව අවසන් කිරීම.
- සිංහල, පාලි, සංස්කෘත, ගණිතය හා ඉංග්‍රිසි යන විෂයන් සඳහා පත්කළ පිරිවෙන් ගුරු උපදේශකවරු පුහුණු කිරීම හා උපදේශකවරු 112 කට විෂය නිර්දේශ හා පෙළපොත් භාවිතය පිළිබඳ පුහුණු කිරීම.
- පිරිවෙන් පුස්තකාල සඳහා වැය වන මුදලින් 30%ක් ලබාදීම.
- දෙමළ පෙළපොත් 5 ක් පිරිවෙන් 355 කට ලබාදීම හා දෙමළ විෂය භාර ගුරුවරුන් දෙමළ පෙළපොත පිළිබඳ ව දැනුවත් කිරීම.

## 3.8 නොවිධිමත් අධ්‍යාපනය

### 3.8.1 අරමුණු සහ ඉලක්ක

- අවු.5-16 වයසේ පාසල් නොයන සියලු ම ළමයින් පාසලකට හෝ නොවිධිමත් අධ්‍යාපන අවස්ථාවකට යොමු කිරීම
- අනිවාර්ය අධ්‍යාපන වයසේ සීමාවේ අධ්‍යාපන සහභාගිත්වය තහවුරු කිරීම
- පාසල් හැරයන ළමයින්ගේ කුසලතා සංවර්ධනය කර ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම

### 3.8.2 වාර්ෂික කාර්යසාධනය

- පළාත් මට්ටමින් අනිවාර්ය අධ්‍යාපන කමිටු 4,800ක් ශක්තිමත් කිරීම.
- සාක්ෂර පන්ති උපදේශකවරු 8,450ක් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහ 03 ක් සකස් කිරීම.
- දිවයින පුරා ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන 178 ක් පවත්වාගෙන යාම.
- සාක්ෂර උපදේශකවරු 80 ක් ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා යොමු කිරීම.
- දිවයින පුරා කාර්යබද්ධ සාක්ෂර පන්ති 45 ක් ක්‍රියාත්මක කිරීම.
- NVQ සහතික සඳහා දායකවන වෘත්තීය පුහුණු පාඨමාලා 15ක් ආරම්භ කිරීම.
- පාසල් නොයන දරුවන් හඳුනා ගැනීම සඳහා අධ්‍යාපන කොට්ඨාස 12ක සමීක්ෂණයක් පැවැත්වීම.

## 3.9 විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ අධ්‍යාපනය

### 3.9.1 අරමුණු සහ ඉලක්ක

විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම සැමට අධ්‍යාපනය යථාර්ථයක් බවට පත්කර ගැනීමේහිලා අත්‍යවශ්‍යයෙන් ම ඉටු කළ යුතු කාර්යයකි. වර්තමානයේ මෙවැනි දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට දෙමාපියන් දක්වන උනන්දුව ද විශාලය. ජාතික විභාගවලට පෙනී සිටීමට අවශ්‍ය පහසුකම් සලසාදීමට විභාග දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇති අතර, එවැනි විභාගවල දි විශිෂ්ට දක්ෂතා දැක්වීමට විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමත්වීම මෙම ක්ෂේත්‍රය තවදුරටත් දියුණු කිරීම පිණිස ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

### 3.9.2 වාර්ෂික කාර්යසාධනය

- විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා ඇස්කණ්ණාඩි සහ සවන්වහල් සැපයීම
- දෘෂ්ටි ඌනතා සහිත සිසුන් සඳහා ඉගෙනුම් ද්‍රව්‍ය සැපයීම
- ජාතික පාසල් 50ක විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ ලබා දීම.
- පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක 04ක් නවීකරණය
- ජාතික පාසල්හි නව විශේෂ අධ්‍යාපන ඒකක 02ක් ඉදිකිරීම
- බ්‍රේල් මුද්‍රණාලයය නවීකරණය
- විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි වෘත්තිකයන් 63කගේ ධාරිතා සංවර්ධන වැඩසටහනය
- ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපනයට වසර 100 සපිරීම නිමිත්තෙන් ජාතික වැඩසටහනක් කොළඹ ලුම්බිණි විද්‍යාලයයේ දී පැවැත්වීම.

# 4. විෂයය හා විෂයය සමගාමී වැඩසටහන්වල ගුණාත්මක සංවර්ධනය

## 4.1 ප්‍රාථමික අධ්‍යාපනය

### 4.1.1 අරමුණු හා ඉලක්ක

- ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම
- ප්‍රාථමික අංශයේ සිසුන්ට ඉගෙනුම් උපකරණයක් ලෙස පරිගණක යොදා ගැනීමට පහසුකම් ලබාදීම
- ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ශක්තිමත් කිරීම
- ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා ළමා මිතුරු පාසල් ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම

**ළමා මිතුරු පාසල් ප්‍රවේශය පහත සඳහන් මානයන් 6 ඔස්සේ ක්‍රියාත්මක වේ**

I. අයිතිවාසිකම් පාදක ව සක්‍රිය ව අන්තර්කරණය වීම
II. ස්ත්‍රී පුරුෂ සමාජනුභාවයට ප්‍රතිචාරී වීම
III. ළමයින් ගේ ගුණාත්මක ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම
IV. ළමයින් ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම
V. ශිෂ්‍යයින්, පවුල් සහ ප්‍රජාවගේ සක්‍රිය දායකත්වය
VI. ළමා මිතුරු පද්ධති, ප්‍රතිපත්ති, පරිචය හා රෙගුලාසි මගින් සහාය ලැබීම

### 4.1.2 වාර්ෂික කාර්යසාධනය

- ළමා මිතුරු පාසල් වැඩසටහන ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කොටගෙන, ඒ පිළිබඳ සම්මන්ත්‍රණයක් (Symposium) දේශීය හා විදේශීය අධ්‍යාපනඥයින්ගේ සහභාගිත්වයෙන් කොළඹ දී පැවැත්වීම.

- ද්විතියික පාසල් 1,000 වැඩසටහනට අයත් පෝෂිත ළමා මිතුරු පාසල් 1,680 කට මූලික යටිතල පහසුකම් ලබා දීම.

- "ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා ළමා මිතුරු ප්‍රවේශය පිළිබඳ" උපදෙස් සංග්‍රහය සියලුම ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන්ට හා පෝෂිත ප්‍රාථමික පාසල් වලට ලබා දීම.

- තෙවන ප්‍රධාන අවධියට අදාළ ඉගෙනුම් නිපුණතා ප්‍රවීණතාව කරා සිසුන් ළඟා කරවීමේ ව්‍යාපෘතියක් නැගෙනහිර,උතුර,මධ්‍යම හා ඌව පළාත්වල අඩු සාධන මට්ටම් පෙන්වන කලාප 18ක ක්‍රියාත්මක කිරීම.

- සිසුන්ගේ ගණිත විෂයය සංවර්ධනය සඳහා ගුරු වැඩමුළු 11ක් හා සිසු කඳවුරු 11ක් පැවැත්වීම හා ගණිතය ඉගැන්වීම් උපකරණ සකස් කිරීමේ කුසලතා ගුරුවරුන්ට ලබාදීම.

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ප්‍රවර්ධනයට ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වැඩමුළු 11ක් හා සිසු කඳවුරු 11ක් පැවැත්වීම.

- සිසුන් ද්විතියික අවධියේදී ද්විභාෂා අධ්‍යාපනයට යොමු කිරීම සඳහා නියාමන වැඩසටහනක් ගුරුවරුන් 25දෙනෙකු හා සිසුන් 100ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.

- පූර්ව භාෂා කුසලතා හා පූර්ව ගණිත කුසලතා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන් 115ක් දැනුවත් කිරීම.

- ජාතික පාසල් 14 ක ප්‍රාථමික අංශයේ 4, 5 ශ්‍රේණි සිසුන් සඳහා මධ්‍යම ප්‍රමාණයේ ඩෙස් හා පුටු ලබාදීම.

- ජාතික පාසල් 8ක ප්‍රාථමික අංශ සඳහා ඉගෙනුම් උපකරණයක් ලෙස පරිගණක ලබාදීම.

- ජාතික පාසලක් සඳහා නව ගොඩනැගිලි ලබාදීම හා ජාතික පාසල් 3ක් සඳහා ගොඩනැගිලි අළුත්වැඩියාවන් සිදුකිරීම.

- ජාතික පාසල් 208 කට ප්‍රාථමික අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිල දී ගැනීමට හා පාසල් 210 කට විද්‍යා ගණිත උපකරණ මිල දී ගැනීමට මුදල් ලබාදීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 125.3*

* ජනාධිපති කාර්යාලයය සමඟ ඒකාබද්ධ ව සිසුන් 50ට අඩු වැසී යාමේ තර්ජනයට මුහුණ දී ඇති ප්‍රාථමික පාසල් නගා සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. මේ යටතේ 2012 වර්ෂයේ දී සංවර්ධනය කළ යුතු පාසල් 1076ක් හඳුනා ගන්නා ලදී. ඒ අතරින් පාසල් 170ක් ජාතික පාසල්වලට සම්බන්ධ කර සංවර්ධනය කරනු ලබන අතර, පළාත් මට්ටමින් ද වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

* පූර්ව ළමාවිය අධ්‍යාපනය ප්‍රාථමික අධ්‍යාපනයට ශක්තිමත් පදනමක් බවට පත්කිරීමේ අරමුණින් අන්තර් අමාත්‍යාංශ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

## 4.2 ගණිත අධ්‍යාපනය

### 4.2.1 අරමුණු හා ඉලක්ක


- අ.පො.ස (සා.පෙළ) ගණිත විෂය සමත්වීමේ ප්‍රතිශතය 2015 වන විට 70% දක්වා වර්ධනය කිරීම.
- අනාගත ගණිතඥයන් බිහි කිරීමේ පසුබිම සඳහා සුහග සිසුන්ගේ දක්ෂතා වර්ධනය කිරීම.
- ගණිතය ජනප්‍රිය විෂයයක් බවට පත් කිරීම.
- අ.පො.ස (උසස් පෙළ) ගණිතය සමත්වීමේ ප්‍රතිශතය 2015 වන විට 60% දක්වා වර්ධනය කිරීම.
- ගණිත ගුරුවරුන් ,ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන් සවිබල ගැන්වීම.
- ගණිතය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරුන් සියලු ම පාසල්වලට ලබාදීම.
- ගණිතය සරල ව පහසුවෙන් විනෝදජනක ව ඉගෙනීමට අවැසි නව ඉගෙනුම් අවස්ථා සම්පාදනය.

### 4.2.2. වාර්ෂික කාර්යසාධනය

- 6 වන ශ්‍රේණියේ සිසුන් 15000 ක් සහ 11 වන ශ්‍රේණියේ සිසුන් 30000ක් සඳහා කලාප මට්ටමින් ප්‍රතිකාර්ය අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක වූ අතර, ශිෂ්‍ය සහභාගීත්වය ඉලක්ක ඉක්මවිය.
- සුහග සිසුන් සඳහා වූ ඔලිම්පියාඩ් වැඩසටහන යටතේ ඉන්දියාවේ ලක්නව් හි දී පැවැති අන්තර්ජාතික හා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේදි (IMSO) රන් පදක්කම් 1ක් රිදී පදක්කම් 3ක් හා ලෝකඩ පදක්කම් 5ක් බැගින් සියලු ම සිසුන් පදක්කම් ලබාගැනිම විශේෂ ජයග්‍රහණයක් විය.
- තායිවානයේ පැවති අන්තර්ජාතික ගණිත තරගාවලියේ දි (TAIMC) රිදී පදක්කම් 1ක්, ලෝකඩ පදක්කම් 2ක්, කුසලතා සහතික 4ක් සමග කණ්ඩායම් තරගයේ 3 වන ස්ථානය දිනා ගැනීමට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් විය.
- ගණිත දැනුම මිනුම හා ගණිත නාට්‍ය ඇතුළත් ජාතික මට්ටමේ ගණිත තරගාවලියක් පවත්වා නාට්‍ය අංශයෙන් ජයග්‍රහණය කරනු ලැබූ මුල් කණ්ඩායම් 10 ජාතික රූපවාහිනියේ විකාශය කිරීමට පියවර ගැනීම.
- ද්විතියික පාසල් 1000 ට අයත් පාසල් හි ගුරු අවශ්‍යතා සපුරාලීම සංයුක්ත ගණිත සඳහා ගුරුවරුන් 490කට පත්වීම් ලබා දිම.
- ගුරුවරුන්ගේ ජ්‍යාමිතික දැනුම වර්ධනය කිරීම සඳහා පළාත් සම්පත් පුද්ගලයින් මඟින් උපාධිධාරී ගුරුවරු 3017 ක් හා විද්‍යාපීඨ ගුරුවරු 422ක් තෝරා ගෙන පුහුණු කිරීම.
- ගණිත නොවන ගුරුවරුන් පුහුණු කිරිම සඳහා මොඩියුලක් සැකසීම ආරම්භ කිරීම.
- ගණිතාගාර ක්‍රියාකාරකම් පිළිබඳ සියලු ම පලාත් සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම.
- ගණිතාගාර සඳහා උපකරණ කට්ටල 43ක් මිල දී ගැනීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 4.3*

**4.2.1.** රූපසටහන : අ.පො.ස. ( සා. පෙළ ) විභාගය **2008-2011** ගණිතය විෂයයෙහි සමත් ප්‍රතිශතය



## 4.3 විද්‍යා අධ්‍යාපනය

### 4.3.1 අරමුණු හා ඉලක්ක


- මානව හා භෞතික සම්පත් සංවර්ධනය.
- ද්විතියික පාසල් 1,000 ගුණාත්මක විද්‍යා අධ්‍යාපනයක් ඇති කිරීම.
- නව විෂය නිර්දේශ ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් තුළින් විද්‍යා අධ්‍යාපනය සංවර්ධනය.
- සුභග සිසුන් වෙත අන්තර් ජාතික තරග සඳහා අවස්ථා ලබාදීම තුළින් ඔවුන්ගේ දක්ෂතා වැඩි කිරීම.
- 2016 වන විට අ.පො.ස. (සා.පෙළ) සමත් ප්‍රතිශතය 80% දක්වා ඉහළ යාම.
- අ.පො.ස. (උ.පෙළ) සමත් සිසුන් සංඛ්‍යාව 40% දක්වා වැඩිකිරීම.
- උසස් පෙළ විද්‍යා අංශ සහිත පාසල් සංඛ්‍යාව 1,500 දක්වා වැඩි කිරීම.

### 4.3.2. වාර්ෂික කාර්යසාධනය

- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන ආයතනය සමඟ එක්ව විද්‍යා විෂයය භාර නිලධාරීන් 240 දෙනෙක් පුහුණු කිරීම.
- සිසුන් 18 දෙනෙකු අන්තර් ජාතික ඔලිම්පියාඩ් තරගාවලියට ඉදිරිපත් කරන ලද අතර, ඔවුන් විද්‍යා විෂය සඳහා රන් පදක්කම් 4ක්, රිදී පදක්කම් 8ක් හා ලෝකඩ පදක්කම් 6ක් ලෙස පදක්කම් දිනා ගන්නා ලදී.
- සියලු ම පාසල් සඳහා විද්‍යා උපකරණ හා රසායනික ද්‍රව්‍ය වාර්ෂික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පියවර ගැනීම.
- ද්විතියික පාසල් 1000 ව්‍යාපෘතිය යටතේ විද්‍යා ගුරුවරු පුහුණු කිරීම සඳහා ගුරු පුහුණු මොඩියුලයක් සකස් කිරීම.
- පළාත් සම්පත් පුද්ගල සංචිත පිහිටුවා පළාත් 7ක නිලධාරීන් 350ක් පුහුණු කිරීම.
- ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන 37 භාර නිලධාරීන් සමග පරිසර වැඩසටහන් ඇතුළු වැඩසටහන් රැසක් ශිෂ්‍යයින් සඳහා සංවිධානය කිරීම

*2012 වර්ෂයේ වියදම : රු .මි. 24.3*

**4.3.1** රූපසටහන **: අ.පො.ස. ( සා. පෙළ ) විභාගය 2008-2011**
විද්‍යාව විෂයයෙහි සමත් ප්‍රතිශතය




## 4.4 ජාතික භාෂා අධ්‍යාපනය

### 4.4.1 අරමුණු හා ඉලක්ක

- සිංහල හා දෙමළ මාධ්‍ය සිසුන්ගේ චතුර්විධ භාෂා කුසලතා ඉහළ නැංවීම
- නිර්මාණශීලී කුසලතා ඉහළ නැංවීම
- ගුරුවරුන්ගේ භාෂා ඉගැන්වීම් කුසලතා දියුණු කිරීම.

### 4.4.2. වාර්ෂික කාර්යසාධනය

- සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලි පැවැත්වීම
- සමස්ත ලංකා දෙමළ භාෂා කුසලතා තරග පැවැත්වීම
- අම්පාර දිස්ත්‍රික්කයේ දෙමළ ගුරුවරුන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අ.පො.ස (උ.පෙළ) සිසුන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම

*2012 වර්ෂයේ වියදම : රු .මි. 2.0*

## 4.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය

### 4.5.1. අරමුණු හා ඉලක්ක

- ප්‍රාථමික අධ්‍යාපනය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් ඉගැන්වීමේ ක්‍රම ප්‍රවර්ධනය.
- පාසල් පරිගණක විද්‍යාගාර ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම.
- නිදහස් හා විවෘත මෘදුකාංග භාවිතය ප්‍රචලිත කිරීම.
- සිසුන් වෙත ඉගෙනුම් ආධාරක අන්තර්ජාලය ඔස්සේ ළඟා කරවීම.
- මහින්දෝදය ද්වීතියීක පාසල් 1000 තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා ආකල්ප සංවර්ධනය.
- පරිගණක දෘඪාංග හා ජාලගතකරණය පිළිබඳ දැනුම ලබා දීම.
- 1 සිට 6 ශ්‍රේණිය දක්වා සියලු ම පාසල් සිසුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීම.
- පාසල් හැරයන සිසුන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් වෘත්තිය පුහුණු කෙරෙහි යොමුකිරීම.
- පාසල් සිසුන් හා ගුරුවරුන් තුළ නිර්මාණ හැකියාවන් සංවර්ධනය කිරීම.

### 4.5.2 වාර්ෂික කාර්යසාධනය

- 1-6 ශ්‍රේණි වල සියලු ම විෂයයන් සඳහා සකස් කරන ලද මෘදුකාංග ඇතුළත් කර ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය දියත් කිරීමට පියවර ගැනීම.
- රත්මලාන කොතලාවලපුර සහ පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලයයේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර යටතේ පරිගණක විද්‍යාගාර විවෘත කිරීම.
- ද්විතියික පාසල් සඳහා බඳවා ගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිධාරී ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- පාසල් සිසුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික වෘත්තීය නිපුණතා සහතික පත්‍ර (NVQ) මට්ටම ලබා දීම සම්බන්ධ ව අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.
- *තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ* තරගාවලින් පවත්වා නිර්මාණය කරන ලද මෘදුකාංග ඇගයීම හා ත්‍යාග ප්‍රදානය.
- පාසල් පද්ධතියේ පරිගණක උපාංග අවශ්‍යතා සපුරාලීම.
- Isuru Linux නිදහස් හා විවෘත මෘදුකාංග මෙහෙයුම් පද්ධතිය හඳුන්වාදීම සඳහා මොඩියුලය සකස් කිරීම 80% ක් නිම කිරීම.
- තොරතුරු තාක්ෂණ ගුරු පුහුණු ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

*2012 වර්ෂයේ වියදම: රු 45.9*

## 4.6 ඉංග්‍රිසි භාෂා අධ්‍යාපනය

### 4.6.1. අරමුණු හා ඉලක්ක

- අ.පො.ස.( සා.පෙළ) ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම.
- ප්‍රාථමික හා ද්විතියික ශ්‍රේණිවල ඉගැන්වීමේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම.
- ඉංග්‍රිසි භාෂාවේ විවිධ කුසලතා ඔප නැංවීමට සිසුන්ට අවස්ථා ලබාදීම.
- ඉංග්‍රිසි භාෂාව සඳහා විවෘත ඉගෙනුම් අවස්ථා සම්පාදනය.
- පුහුණුකරුවන්ගේ වෘත්තීය හා ධාරිතා සංවර්ධනය.

### 4.6.2. වාර්ෂික කාර්යසාධනය

- ත්‍රිකුණාමලය, බදුල්ල, මහනුවර, මුලතිවු, කිලිනොච්චි සහ මොණරාගල වැනි අඩු සාධන මට්ටම සහිත දිස්ත්‍රික්කවල විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ව ගුරු පුහුණුවක් ලබාදීමට, නිලධාරීන් දැනුවත් කිරීමට හා අතිරේක ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීමට පියවර ගැනීම.
- ප්‍රාදේශීය ඉංග්‍රිසි උපකාරක මධ්‍යස්ථාන ( RESC ) 30 ක් හරහා ප්‍රාථමික හා ද්විතීයික ඉංග්‍රිසි ඉගැන්වීම වැඩිදියුණු කිරීමට පියවර ගැනීම.
- ජාතික ඉංග්‍රිසි භාෂා දින තරග කොට්ඨාස, කලාප හා ජාතික මට්ටමින් පැවැත්වීම.
- අන්තර්ජාලය හරහා විවෘත ඉගෙනුම් අවස්ථා වැඩි කරමින් දුෂ්කර ප්‍රදේශවල දරුවන්ට අ.පො.ස. ( උ.පෙළ) සාමාන්‍ය ඉංග්‍රිසි ඉගෙනීම සඳහා මාර්ගගත පාඨමාලාවක් දියත් කිරීම.
- ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය ව්‍යාපෘතිය යටතේ ඉංග්‍රිසි උපාධිධාරීන් 1,000 ක් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා 201 දෙනෙකු තෝරා ගැනීම
- භාෂා විද්‍යාගාර 2ක් ඉදිකිරීම

*2012 වර්ෂයේ වියදම: රු .මි. 27*





ගම්බද පාසල් වලටද පරිගණක පහසුකම්......



ගණිතය විනෝදයෙන් ඉගෙන ගැනීමේ අවස්ථාවක්.....



ආකර්ෂණීය ළමා මිතුරු පාසල් පරිසරයක්.......



පරිගණකය ඉගෙනුම් උපකරණයක් ලෙස.....



ගණිතය ක්‍රියාකාරකම් තුළින් ඉගෙන ගැනීමේ අවස්ථාවක්.....

### 4.6.3 ජීවන කුසලතාවයක් ලෙස ඉංග්‍රීසි වැඩසටහන

- පාසල් සිසුන්ගේ ඉංග්‍රීස කථන හා ශ්‍රවණ හැකියා දියුණු කිරීමේ අරමුණින් සහ ඉංග්‍රිසි ගුරුවරුන් නොමැති පාසල්වල භාවිතා කළ හැකිවන සේ 9, 10, 11 ශ්‍රේණි සඳහා සංයුක්ත තැටි සකස් කර බෙදාහරින ලදී.
- 6, 7, 8 ශ්‍රේණිවල සිසුන් සඳහා ක්‍රියාකාරකම් 90කින් යුත් ඉගෙනුම් උපකරණයක් සකස් කරන ලදී.
- පළාත් 9හි භාෂා විද්‍යාගාර 9ක් තැනීම සඳහා මූලික සැලසුම් සිදුකරන ලදී.
- අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු විද්‍යාලවල ගුරු පුහුණුව සඳහා උපදෙස් සංග්‍රහයක් නිකුත් කරන ලදී.
- සිසුන්ගේ ඉංග්‍රිසි කථන හා ශ්‍රවණ හැකියා දියුණු කිරීම සඳහා ගුරුවරුන් සඳහා දින 10ක පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

## 4.7 මානව ශාස්ත්‍ර අධ්‍යාපනය

### 4.7.1. අරමුණු හා ඉලක්ක

- අ.පො.ස (සා.පෙළ) ශිෂ්‍ය සාධන මට්ටම 2015 වන විට 10%කින් ඉහළ නැංවීම.
- වෙරළබඩ සම්පත් කළමනාකරණය සංරක්ෂණය පිළිබඳ ශිෂ්‍ය නිපුණතා ඉහළ නැංවීම.
- ජාතික උරුමයන් ආරක්ෂා කිරීමේ වැදගත්කම සම්බන්ධව සිසුන් තුළ උනන්දුවක් ඇති කිරීම.

### 4.7.2. වාර්ෂික කාර්යසාධනය

- ඉතිහාසය විෂයය සංවර්ධනය සඳහා උතුරුමැද, දකුණ හා සබරගමුව පළාත්වල ඉතිහාසය ගුරුවරුන් 850ක් පුහුණු කිරීම.
- දුෂ්කර පාසල් සඳහා ජාතික සිතියම් සංග්‍රහය ලබාදීම යටතේ උතුර, ඌව, මධ්‍යම හා නැගෙනහිර පළාත් පාසල් 39 සඳහා පොත් බෙදා දීම.
- 2011 සමස්ත ලංකා සමාජ විද්‍යා තරගාවලියේ ජයග්‍රාහී සිසුන් 650 කට ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කිරීම හා 2012 සමස්ත ලංකා තරගාවලිය පවත්වා සිසුන් 471 කට ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කිරීම.
- භූගෝල විද්‍යා උපදෙස් සංග්‍රහය සිංහල හා දෙමළ මාධ්‍ය පිටපත් පළාත්වලට යැවීම.
- භූගෝල විෂයය සංවර්ධනය සඳහා ද්විතීයික පාසල් 550 ක භූගෝල විද්‍යා සංගම් පිහිටුවීම.
- වෙරළබඩ සම්පත් කළමනාකරණය ක්ෂේත්‍ර අධ්‍යාපන වැඩසටහනට අදාළ සංයුක්ත තැටි 15ක් සැකසීම හා අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන් ඇතුළු නිලධාරීන් 70 කගේ නිපුණතා සංවර්ධනය සිදු කිරීම.
- 6 -11 ද්විතීයික ශ්‍රේණි පැවැත්වෙන පාසල් වල ජාතික උරුමයන් සම්බන්ධව ශිෂ්‍ය සංසද පිහිටුවීමට පියවර ගැනීම.

*2012 වර්ෂයේ වියදම : රු 2.9*

## 4.8 සෞන්දර්ය අධ්‍යාපනය

### 4.8.1 අරමුණු හා ඉලක්ක

- සිසු කුසලතා ඇගයීම.
- සෞන්දර්යය උපකරණ පාසල්වලට ලබාදීම.
- පාසල් හැරගිය සිසුන්ගේ කුසලතා සංවර්ධනය.
- වාද්‍ය භාණ්ඩ පුහුණුව සඳහා සිසුන් යොමු කිරීම.

### 4.8.2. වාර්ෂික කාර්යසාධනය

- සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර, නැටුම්, සංගීතය, නාට්‍ය හා රංගකලා තරග දරුවන් 425,000 ක් පමණ සහභාගීත්වයෙන් පැවැත්වීම.
- අවශ්‍යතා හඳුනාගෙන ප්‍රාථමික පාසල් 65කට සෞන්දර්ය උපකරණ ලබාදීම.
- ආනන්ද සමරකෝන් ගුණ සමරුව මත පදනම් ව හෝමාගම සහ ගාල්ල අධ්‍යාපන කලාපවල සිසුන් 100 ක් සඳහා රසවින්දන වැඩසටහන් පැවැත්වීමට පියවර ගැනීම.
- ශ්‍රී ලංකාවේ පාසල් දරුවන්ගේ සෞන්දර්ය කුසලතා ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් පවත්වනු ලබන ලොව විශාලත ම ඇසළ මහා සිසු පෙරහැර පාසල් 400ක සිසුන් 15,000ක ගේ සහ පාසල් වාදකයින් 4,000කගේ සහභාගීත්වයෙන් කොළඹ දී පැවැත්වීම.
- ස්වයං රැකියා සඳහා යොමු කිරීමට බහු ශිල්ප පාසල් තුළින් දරුවන් 6,000 කට පුහුණුව ලබාදීම.

*2012 වර්ෂයේ වියදම : රු 27.1*

## 4.9 කෘෂිකර්ම හා පරිසර තාක්ෂණ අධ්‍යාපනය

### 4.9.1. අරමුණු හා ඉලක්ක

- ♦ කෘෂිකර්ම විෂය හැදෑරීම සඳහා සිසුන් නැඹුරු කිරීම.
- ♦ පාසල් භූමිය ආදර්ශමත් ගොවිපලක් බවට පත් කිරීම.
- ♦ පාසල් මට්ටමින් කෘෂි ව්‍යවසායක අවස්ථා නිර්මාණය කිරීම.
- ♦ කෘෂිකාර්මික වෘත්තීය පුහුණු අවස්ථා සඳහා සිසුන්ට මඟ පෙන්වීම. (NVQ)
- ♦ භූමිය ඉඩකඩ නොමැති පාසල් සඳහා නාගරික කෘෂිකර්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ♦ පාසල් හා කාර්යාල පරිශ්‍ර අලංකරණ කිරීම.
- ♦ පරිසරය පිළිබඳ පර්යේෂණ හා ව්‍යාපෘති කිරීමට සිසුන් යොමු කිරීම.
- ♦ බලශක්තිය, ජලය, පස සහ කසල කළමනාකරණය නිසි ලෙස පාසල් තුළ ක්‍රියාත්මක කිරීම.
- ♦ කෘෂිකර්ම ගුරුවරුන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම.

### 4.9.2 වාර්ෂික කාර්යසාධනය

- ‘*සිසු සවියෙන් - රන් අස්වනු* ’පාසල් ගොවිපළ තරගය කලාප,පළාත් හා සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීම.
- පාසල් සිසුන්ගේ සහභාගීත්වයෙන් සිංහල හින්දු අලුත් අවුරුදු නැකතට පැල ලක්ෂ 40ක් සිටුවීමේ වැඩසටහන ‘*අද වවමු පැළයක් - හෙට නෙළමු ඵලයක්*’ තේමාවෙන් ක්‍රියාත්මක කිරීම.
- ‘*කප් රුකයි - සිප් නැණයි* ’ වැඩසටහන යටතේ ගෙවත්තේ පොල් රෝපණය කළ හැකි 6 ශ්‍රේණියේ සිසුනට පොල් සංවර්ධන අමාත්‍යාංශය මගින් පොල් පැළ ලබාදීම.
- දිවි නැගුම ජාතික ව්‍යාපාරය සමග එක් ව පාසල් ආදර්ශමත් ගොවිපලක් බවට පත්කිරීම පිළිබඳ සියලු අංශ දැනුවත් කිරීම
- භූමි අලංකරණය හා ප්‍රායෝගික කෘෂිකර්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරුන් 110ක් පුහුණු කිරීම
- ජල අධ්‍යයනය, වායුගෝල අධ්‍යයනය, පාංශු අධ්‍යයනය හා GLOBE වැඩසටහන යටතේ භූමි ආවරණ අධ්‍යයනය පිළිබඳ කෘෂිකර්ම ගුරුභවතුන් 100ක් දැනුවත් කිරීම
- ජාතික පාසල් 20කට කෘෂිකර්ම උපකරණ ලබාදීම
- හරිත පාසල් පරිසර අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ ගුරුභවතුන් 100ක් පුහුණු කිරීමට හා පාසල්වල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ආරම්භ කිරීමට පියවර ගැනිම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 4.1*

## 4.10 තාක්ෂණ අධ්‍යාපනය

### 4.10.1 අරමුණු හා ඉලක්ක

- ♦ තාක්ෂණ විෂයය භාර ගුරුභවතුන්ගේ විෂය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කිරීම.
- ♦ විෂය භාර නිලධාරීන් හා ගුරු උපදේශකවරුන්ගේ රාජකාරි භූමිකා සංවර්ධනය.
- ♦ පාසල් සිසුන්ගේ නව නිර්මාණ හැකියා සංවර්ධනය.
- ♦ සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය.

### 4.10.2 වාර්ෂික කාර්යසාධනය

- වයඹ හා දකුණු පළාත්වල තාක්ෂණ ගුරු භවතුන් 117ක් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- තාක්ෂණ හා ගෘහ ආර්ථික විද්‍යාව විෂයය භාර නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- “සහසක් නිපැයුම්” ජාතික තරගයේ දී පාසල් නව නිපැයුම් 250ක් ජයග්‍රහණය ලැබීම.
- ජාතික පාසල් 40ක් සඳහා තාක්ෂණ උපකරණ ද පාසල් 20ක් සඳහා ගෘහ ආර්ථික විද්‍යා විෂයය උපකරණ ද ලබා දීම.
- නවක තාක්ෂණ ගුරුභවතුන් 46 දෙනෙකුගේ වෘත්තිය සංවර්ධනය සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
- අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල අවම වූ විල්ගමුව කලාපයේ ගුරු භවතුන් 50ක් සඳහා සංවර්ධන වැඩමුළුවක් පැවැත්වීම.

## 4.11 වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය

### 4.11.1 අරමුණු හා ඉලක්ක

- විෂය සංවර්ධනය සඳහා වෘත්තීය ආයතනවල සහාය ලබාගැනීම.
- ශිෂ්‍ය සාධන මට්ටම දියුණු කිරීම.
- ශිෂ්‍ය ප්‍රයෝගික කුසලතා ඔප් නැංවීම.
- ජාතික පාසල්වල වාණිජ අංශයන්ට පරිගණක ලබාදීම.
- දැනුම මිනුම තරග, විවිධ වැඩමුළු හා ජාතික පාසල් මට්ටමින් තරග පැවැත්වීම.
- ද්විතියික පාසල් 1000 වාණිජ අධ්‍යාපන නැංවීම.
- ගුරු පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම.

### 4.11.2 වාර්ෂික කාර්යසාධනය

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතනවල සහයෝගයෙන් ගුරු හා ශිෂ්‍ය පාදක වැඩසටහන් පැවැත්වීම.
- ගණකාධිකාරී ශිල්පීය ආයතනය සමග එක් ව හොඳම වාර්ෂික ගිණුම් වාර්තාව පිළිබඳ ජාතික පාසල් තරගාවලිය පැවැත්වීම.
- 2012 අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ පැවැත්විම.
- වාණිජ ශිෂ්‍ය සංගම් ක්‍රියාකාරී ව පවත්වාගෙන යාම සඳහා පාසල්වලට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීමට පියවර ගැනීම.
- ද්විතියික පාසල් දහස වැඩසටහනට අයත් පාසල් 405ක විදුහල්පතිවරු වාණිජ අධ්‍යාපනය ඉහළ නැංවීම පිළිබඳ දැනුවත් කිරිම
- පාසල් සමූපකාර නැවත ක්‍රියාත්මක කිරීම සඳහා සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ ව කටයුතු කර චක්‍රලේඛයක් කෙටුම්පත් කිරීම.
- වාණිජ විෂයය සංවර්ධනය පිළිබඳ ව විශ්ව විද්‍යාල පීඨාධිපතිවරු, මහාචාර්යවරු, ආචාර්යවරු, විෂය අධ්‍යක්ෂවරු, ගුරු උපදේශකවරු හා ගුරුවරු සමග සාකච්ඡා කිරීම සහ වාණිජ විෂයය සංවර්ධනය උදෙසා විද්වතුන් 13කුගෙන් යුත් කමිටුවක් පත් කිරීම.
- ගුරු පුහුණු අවශ්‍යතා හඳුනාගෙන පුහුණු වැඩසටහනක් පැවැත්විම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 3.3*

## 4.12 ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා කුසලතා දියුණු කිරීම

### 4.12.1 අරමුණු හා ඉලක්ක

- ප්‍රාථමික අංශයේ සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාව සංවර්ධනය කිරීම.
- සෑම අධ්‍යාපන කලාපයක් තුළ ම තෝරාගත් ක්‍රීඩා 6 ක් සංවර්ධනය කිරීම.
- තෝරාගත් ක්‍රීඩා 6 සඳහා දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා පුහුණු සංචිත බිහිකිරීම.
- ජාත්‍යන්තරය ජයගත හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් රටට බිහිකිරීම.

### 4.12.2 වාර්ෂික කාර්යසාධනය

- ක්‍රීඩා 27 ක් සඳහා දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ එම දක්ෂතා සමස්ත ලංකා මට්ටමින් ඇගයීමට ලක්කිරීම.
- ක්‍රීඩා වලින් දක්ෂතා පෙන්නුම් කරනු ලබන පාසල් දිරිමත් කිරිම සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම.
- සෑම අධ්‍යාපන කලාපයකින් ම එක් ගුරුවරයෙකු බැගින් සම්පත් පුද්ගලයන් 86 ක් පුහුණු කිරීම.
- සෑම කලාපයක් ම ඇතුළත් වන සේ ක්‍රීඩා 6 ට අදාළ ව ක්‍රීඩා උපදේශකවරුන් 120 දෙනෙකු පුහුණු කිරීම.
- ඇරෝබික්ස් ජිම්නාස්ටික් ක්‍රීඩාව සඳහා ජාතික මට්ටමින් දක්ෂතා පෙන්නුම් කර ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් 40 දෙනෙකු පුහුණු සංචිතයකට යොමු කිරීම.
- ක්‍රීඩා පාසල් සඳහා අදාළ දිස්ත්‍රික්කවල දක්ෂතා ඇති සිසුන් බඳවාගැනීම.
- ද්විතියික පාසල් 50 කට ක්‍රීඩා උපකරණ සැපයීම.
- ජාතික පාසල් 342 ක් සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 56.1*

## 4.13 ආගමික හා සාරධර්ම අධ්‍යාපනය

### 4.13.1 අරමුණු හා ඉලක්ක

- ♦ බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ උපදෙස් සහ මාර්ගෝපදේශ ලබාදීම.
- ♦ අ.පො.ස. (සා.පෙළ) ආගමික විෂයයන්හි සාධන මට්ටම ඉහළ නැංවීම.
- ♦ පාසල් සිසුන් තුළ සාරධර්ම වර්ධනය කිරීම.

### 4.13.2. වාර්ෂික කාර්යසාධනය

- බෞද්ධ උපදේශක මණ්ඩල රැස්වීම පවත්වා පෙළපොත්, ගුරු උපදෙස් සංග්‍රහ සහ බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ උපදෙස් ලබාදීමට පියවර ගැනීම.
- බුද්ධ ධර්ම විෂය සංවර්ධනය සහ සාරධර්ම පිළිබඳ ව නැගෙනහිර, උතුරු මැද සහ උතුරු පළාත්වල විෂය අධ්‍යක්ෂකවරුන් කොට්ඨාස හා කලාප අධ්‍යක්ෂකවරුන් සහ ගුරු උපදේශක වරුන් දැනුවත් කිරීම.
- බෞද්ධ ශිෂ්‍ය සංගම් නියෝජිත වැඩසටහන පැවැත්වීමට පියවර ගැනීම.
- 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් ආරම්භ කරන ලද විශේෂ වැඩසටහනක් ලෙස සෑම වෙසක් පෝය දිනකට ම ආසන්න සිකුරාදා දිනයේ බෞද්ධ ශිෂ්‍යයන් ඉගෙන ගන්නා පාසල්වල සියලු ම ශිෂ්‍යයින්ගේ සහභාගීත්වයෙන් සීල සමාදාන වැඩසටහනක් පැවැත්වීම.
- අ.පො.ස. (සා.පෙළ) සියලු ම ආගමික විෂයයන්හි සාධනය නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි හා කතෝලික ආගම්වලට අදාළ ව පාසල් සිසුන් තුළ සාරධර්ම වර්ධනය කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.
- ගුරු ආචාර ධර්ම පද්ධතිය සකස් කර එළිදැක්වීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 1.2*

## 4.14 ද්විභාෂා අධ්‍යාපනය

### 4.14.1. අරමුණු හා ඉලක්ක

සිංහල හා දෙමළ මව් භාෂාව ඉගෙනුම් මාධ්‍යය ලෙස ප්‍රාථමික අවධියේ දී භාවිතය තහවුරු කරන අතර ම, ද්විතීයික ශ්‍රේණිවල සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් කිහිපයක් ඉගැන්වීම තුළින් පුළුල් ඉගැනුම් අවස්ථා ලබාදීම ද්විභාෂා අධ්‍යාපනයේ පරමාර්ථයයි.

- ♦ ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන සඳහා පළාත් සම්පත්දායක සංචිතයක් ඇති කිරීම.
- ♦ ද්විභාෂා අධ්‍යාපන ජාතික අරමුණුවලට ගැළපෙන සේ විෂය - භාෂා සමෝධානිත ඉගෙනුම් ප්‍රවේශය සඳහා ජාතික මට්ටමේ සංකල්ප රාමුවක් සකස් කිරීම හා ඊට ගැළපෙන පරිදි පවතින පාඨමාලා සකස් කිරීම.
- ♦ ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන සහිත පාසල් සංඛ්‍යාව වැඩි කිරීම.
- ♦ ද්විභාෂා අධ්‍යාපන ගුරු හිඟයට උපාය මාර්ගික විසඳුමක් වශයෙන් පද්ධතියේ සිටින ගුරුවරුන්ගේ උපයෝගීතාව වැඩිදියුණු කිරීම.

### 4.14.2 වාර්ෂික කාර්යසාධනය

- විද්‍යාව සහ ගණිතය විෂයයන් සඳහා පිළිවෙලින් සම්පත්දායකයින් 49 ක් හා 59 ක් පුහුණු කිරීම හා එම සම්පත්දායකයින් යොදා ගනිමින් පළාත් ගුරු පුහුණු වැඩසටහන් සිදු කිරීම.
- විෂය - භාෂා සමෝධානිත ඉගෙනුම් ප්‍රවේශය සඳහා ජාතික මට්ටමේ සංකල්ප රාමුවේ මූලික පිටපත හා අත් පොත සකස් කිරීම.
- ද්විභාෂා අධ්‍යාපනය සම්බන්ධ සම්මන්ත්‍රණයක් (Symposium) පැවැත්වීම.
- ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන සහිත පාසල් සංඛ්‍යාව 937 සිට 1100 දක්වා වැඩි කිරීමට පියවර ගැනීම.
- අදාළ විෂයයන් උගන්වන ගුරුවරුන් ද්විභාෂා අධ්‍යාපන ගුරුවරුන් ලෙස සංවර්ධනය කිරීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 0.3*

## 4.15 ත්‍රි භාෂා ශ්‍රී ලංකා වැඩ සටහන

### 4.15.1 අරමුණු හා ඉලක්ක

සිංහල, දෙමළ හා ඉංග්‍රිසි යන භාෂා තුන ම පිළිබඳ දැනුම හා භාවිත හැකියාව ඇති අනාගත පරපුරක් බිහිකිරීම ජාතික සමගිය ඇති කිරීම සඳහා ඉවහල් වන ප්‍රමුඛ ජාතික අවශ්‍යතාවක් ලෙස රජය හඳුනාගෙන ඇත. එම අවශ්‍යතාවය ඉටුකිරීම සඳහා ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් ආයතන සමග විශේෂ වැඩසටහනක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

- 1-5 ප්‍රාථමික ශ්‍රේණිවල සිංහල, දෙමළ හා ඉංග්‍රිසි ත්‍රෛභාෂික දැනුම ප්‍රගුණ කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රය තුළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ත්‍රෛභාෂික දැනුම වර්ධනය කිරීම.

### 4.15.2 වාර්ෂික කාර්යසාධනය

- 1-5 ශ්‍රේණිවලට අදාළ විෂය පථය I, II, III අදියර ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් 8,545 කට උපදෙස් ලබා දීම.
- උතුරු - නැගෙනහිර පළාත්වල පාසල් දරුවන්ගේ ( 1-5 ශ්‍රේණි ) ත්‍රෛභාෂික දැනුම ප්‍රගුණ කිරීම.

## 4.16 පාසල් පුස්තකාල සංවර්ධනය

### 4.16.1 අරමුණු හා ඉලක්ක

- පාසල් පුස්තකාල ද්‍රව්‍ය එකතුව වර්ධනය.
- ජාතික පාසල් පුස්තකාල පහසුකම් ඉහළ නැංවීම.
- පාසල් දරුවන් අතර කියවීම ප්‍රවර්ධනය.
- ළමා කියවීම් ද්‍රව්‍ය සකස් කිරීම පිළිබඳ නිර්ණායක සකස් කිරීම.
- නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ප්‍රවර්ධනය.
- සාර්ථක සම්පත්දායකයන් බිහි කිරීම.
- ළමා කියවීම් ද්‍රව්‍යවල ගුණාත්මක බව ඉහළ නැංවීම.

### 4.16.2 වාර්ෂික කාර්යසාධනය

- ජාතික පාසල් 115 ක් සඳහා පුස්තකාල පොත් මිල දී ගැනීමට රු.මිලි 8.69 අරමුදල් ලබාදීම.
- ජාතික පාසල් 13 ක් සඳහා රු. මිලි 1.5 ක් වටිනා පුස්තකාල ලී බඩු සැපයීම.
- කියවීමේ කඳවුරු පැවැත්වීම.
- ළමා කියවීම් ද්‍රව්‍ය සකස් කිරීම පිළිබඳව ලේඛකයින් දැනුවත් කිරීම වැඩමුළු 6 ක් පැවැත්වීම.
- ජාතික අධ්‍යාපන ආයතනය සමඟ එක්ව අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහන් 85ක් නිෂ්පාදනය කිරීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 12.0*

## 4.17 සෞඛ්‍ය ප්‍රවර්ධන හා පෝෂණ වැඩසටහන

### 4.17.1. අරමුණු හා ඉලක්ක

- ♦ පාසල් සිසුන් තුළ යහපත් චර්යා හා සෞඛ්‍ය පුරුදු ප්‍රවර්ධනය කිරීම.
- ♦ පාසල් සිසුන්ගේ පෝෂණ තත්ත්වය නගා සිටුවීම.
- ♦ දෛනික පැමිණීම ඉහළ නැංවීම.
- ♦ යහපත් ආහාර පුරුදු සිසුන් තුළ ප්‍රචලිත කිරීම.
- ♦ පාසල් තුළ ජල හා සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීම.
- ♦ සෞඛ්‍යමත් පාසල් පරිසරයක් ඇති කිරීම .
- ♦ අධ්‍යාපනය සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය වැඩි කිරීම.
- ♦ සෞඛ්‍යමත් පාසල් පරිසරයක් පිළිබඳ ශිෂ්‍ය කඳවුරු 34 ක් පවත්වන ලදී.

### 4.17.2 වාර්ෂික කාර්යසාධනය

- පාසල් පරිශ්‍රය තුළ ආහාර පරිභෝජනය වෙනස් කිරීම පිළිබඳ ආපනශාලා චක්‍රලේඛය ක්‍රියාත්මකවීම නියාමනය කිරීම.
- ජලය හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට ප්‍රතිපාදන පළාත්වලට යැවීම.

4.17.1. වගුව ජල හා සනීපාරක්ෂණ පහසුකම් ලබා දුන් පාසල් සංඛ්‍යාව - 2012

| පළාත | පහසුකම් ලබන පාසල් සංඛ්‍යාව |
|---|---|
| උතුර | 50 |
| උතුරු මැද | 50 |
| ඌව | 56 |
| මධ්‍යම | 51 |
| නැගෙනහිර | 50 |
| බස්නාහිර | 7 |
| දකුණ | 8 |

- මධ්‍යම, ඌව, නැගෙනහිර යන පළාත් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන ගුරු පුහුණු සැසි 35ක් පැවැත්වීම.
- ශිෂ්‍ය කඳවුරු 40ක් පැවැත්වීම.
- ඩෙංගු මදුරු මර්දනය සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව පාසල් ක්‍රියාත්මක වේ ද යන්න සොයා බැලීම.
- මොරටුව ප්‍රදේශයේ ඩෙංගු මර්දන සිසු පාගමනක් පැවැත්වීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන හා (HIV/AIDS)නිවාරණ වැඩසටහන යටතේ ශිෂ්‍ය කඳවුරු 35 ක් හා ගුරු පුහුණු වැඩමුළු 3ක් පැවැත්වීම.

**4.17.2 වගුව : පෝෂණ වැඩසටහන්-2012**

| පෝෂණ වැඩසටහන | ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව | ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| සිසුන් සඳහා දිවා ආහාර ලබාදීම | 6,775 | 839,643 |
| සිසුන් සඳහා කිරි වීදුරුවක් ලබාදීම | 1,701 | 210,655 |
| ලෝක ආහාර වැඩසටහන | 850 | 175,258 |

- 10වන ශ්‍රේණියේ සිසුන් සඳහා සෞඛ්‍ය දැනුම මිනුම තරගාවලිය පැවැත්වීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ සිංහල හා දෙමළ මාධ්‍ය වැඩසටහන් 26ක් මාධ්‍ය මගින් විකාශය කිරීමට පියවර ගැනීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සහතිකකරණය 2012 වසරට යෝජිත කලාප 28 තුළ ක්‍රියාත්මක කිරීම.
- සිසුන් තුළ යහපත් සෞඛ්‍ය පුරුදු හා චර්යා ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 43ක් පැවැත්වීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජනාධිපති කාර්යාලයය ඒකාබද්ධව සංවිධානය කරන සෞඛ්‍ය වැඩසටහන් සඳහා පාසල් ළමුන් සහභාගී කරවීම.

**දිවා ආහාරය ලබාදෙන පාසල්වල සිසුන්ගේ දෛනික පැමිණීමේ වර්ධනය**

| 2009 | | 2011 |
|---|---|---|
| 80 % | → | 83.4 % |

**දිවා ආහාරය ලබාදෙන පාසල්වල පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වයේ ලකුණු 70ට වැඩියෙන් ලබාගැනීමේ ප්‍රතිශතය**

| 2005 | | 2011 |
|---|---|---|
| 20 % | → | 49 % |

ජාතික පෝෂණ සභාව එක්ව පාසල් සිසුන්ගේ පෝෂණ ඌණතා අඩු කිරීම සඳහා පහත පියවර ගනු ලැබුණි.

- පාසල් සිසුන්ට කිරි වීදුරුවක් ලබාදීම.
- සතියකට බිත්තර 2ක් සහිත වූ දිවා ආහාර වේලක් ලබා දීමට පියවර ගැනීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 3428*




ඩෙංගු පා ගමන




ඇසළ මහා සිසු පෙරහැර



‘අද වවමු පැළයක් - හෙට නෙළමු ඵලයක්’
ජාතික වැඩසටහන



දිවා ආහාර ලබාදීමේ වැඩසටහන



2012 ජාතික පාසල් ක්‍රීඩා



## 4.18 සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපනය

### 4.18.1 අරමුණු හා ඉලක්ක

- ♦ සාමූහිකත්වය, එක් ව ජීවත්වීමේ කුසලතා හා මානව දයාවෙන් පිරි ප්‍රජාවක් පාසල් පද්ධතිය තුළින් සමාජයට දායාද කිරීම.
- ♦ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රජාතන්ත්‍රවාදය සහ සාරධර්ම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ළඟාකරදීම.
- ♦ ජාතිය ගොඩනැගීම පිළිබඳ සාමූහික ව ක්‍රියාකිරීමේ ආකල්ප සංවර්ධනය කිරීම.
- ♦ උතුරු නැගෙනහිර මාපිය රැකවරණය අහිමි පාසල් දරුවන් සඳහා දකුණේ පාසල්වල දෙමාපියන්ගේ රැකවරණය සැලැස්වීම.

### 4.18.2. වාර්ෂික කාර්යසාධනය

- *සෙනෙහසක තක්සලාව,* අන්තර් වාර්ගික මිත්‍රත්ව පාසල් වැඩසටහන පිළිබඳ බණ්ඩාරවෙල - කල්කුඩා පාසල් 30ක් , මන්නාරම - කුරුණෑගල පාසල් 30ක් කුලියාපිටිය - මඩු පාසල් 30ක් ලෙස තෝරාගත් පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීම.
- පාසල්, පළාත් හා ජාතික මට්ටමින් ශිෂ්‍ය පාර්ලිමේන්තු පිහිටුවීම හා සක්‍රියව ක්‍රියාවට නැංවීම.
- උතුරු, නැගෙනහිර සෙනෙහසක තක්සලාවට සම්බන්ධ වන පාසල්වල මා පිය රැකවරණය සැපයීම සඳහා මව පියා අහිමි දරුවන් හඳුනා ගැනීම.

*2012 වර්ෂයේ වියදම: රු .මි. 1.4*

## 4.19 ශිෂ්‍ය මාර්ගෝපදේශ හා උපදේශන සේවාව

### 4.19.1 අරමුණු හා ඉලක්ක

- ♦ සිසුන් තුළ වඩා හොඳ මානසික තත්ත්වයක් වර්ධනය කර අධ්‍යාපන සංවර්ධනයක් ඇති කිරීම.
- ♦ අනාගත වැඩ ලෝකය පිළිබඳ සිසුන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම හා වෘත්තිය රුචිකත්වය හඳුනාගැනීමට ශිෂ්‍යයන්ට සහාය වීම.
- ♦ ළමා අපයෝජන වැළැක්වීම හා පාසල් සිසුන්ට සුරක්ෂිත පරිසරයක් බවට පත් කිරීම.
- ♦ වතු ආශ්‍රිත පාසල්වල සිසුන්ගේ ගැටළු විසඳීමට සුදුසු මානසික වාතාවරණය සැකසීම.
- ♦ ආපදාවන්ට මුහුණදීමට සුදුසු මානසික වාතාවරණය සැකසීම.

### 4.19.2. වාර්ෂික කාර්යසාධනය

- පාසල් උපදේශන හා මාර්ගෝපදේශ වැඩසටහන පාසල් පද්ධතිය තුළ ශක්තිමත් කිරීම සඳහා නව චක්‍රලේඛයක් සකස් කිරීම.
- පාසල් 100 ක උපදේශන ඒකක ආරම්භ කිරීම.
- උපදේශන ගුරුවරුන් 110 දෙනෙකු පුහුණු කිරීම.
- ගුරු උපදේශකවරුන් 135ක් බලගැන්වීම.
- වෘත්තිය මාර්ගෝපදේශ නිලධාරීන් 160 දෙනෙකු සෑම කලාපයකට ම අදාළ ව පුහුණු කිරීම.
- විදුහල්පතිවරුන් 157 දෙනෙක් උපදේශනය පිළිබඳ දැනුවත් කිරීම.
- "අපි සුරකෙමු" ළමා ආරක්ෂණ වැඩසටහන හා පාසල සුරක්ෂිත පරිසරයක් බවට පත් කිරීමේ දස පියවර වැඩසටහන සඳහා පුහුණුකරුවන් 150 ක් පුහුණු කිරීම. විදුහල්පතිවරුන් 3,800 ක්, සිසුන් 75,000 ක් සහ දෙමාපියන් 150,000 ක් පමණ දැනුවත් කිරීම.
- පාසල් ආචාර ධර්ම මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.
- ඌව, සබරගමුව, රත්නපුර යන පළාත්වල වතු ආශ්‍රිත පාසල් ගුරුවරුන් 117 දෙනෙකු මනෝසමාජීය වැඩසටහන සඳහා සහ විදුහල්පතිවරු 75 දෙනෙකු නැවත මොඩියුල 3ක් යටතේ පුහුණු කිරීම.
- මනෝසමාජයිය යහපැවත්ම සඳහා ජාතික මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරීම.
- දකුණු පළාතේ තෝරාගත් පාසල් 06ක් සඳහා විශේෂිත ව්‍යවසන හා සම්බන්ධ උපදේශන වැඩසටහනක් ක්‍රියාවට නැංවීම.

*2012 වර්ෂයේ වියදම: රු .මි. 5.7*

## 4.20 විෂය සමගාමී ක්‍රියාකාරකම්

### 4.20.1 අරමුණු හා ඉලක්ක

- ♦ සිසු දරුවන්ගේ දක්ෂතා එළිදැක්වීම සඳහා අවස්ථාව උදාකිරීම සහ ඔවුන්ගේ රසඥතාව වර්ධනය කිරීම.
- ♦ විනයගරුක සහ සමාජ හිතකාමී සිසු පරපුරක් බිහිකිරීම.
- ♦ සෞඛ්‍ය සම්පන්න සිසු පරපුරක් බිහිකිරීම.
- ♦ සිසු දරුවන්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කිරීම.

### 4.20.2 වාර්ෂික කාර්යසාධනය

- සමස්ත ලංකා පාසල් ටවර්හෝල් නාට්‍ය තරගාවලි පවත්වා ත්‍යාග ප්‍රදානය කිරීම.
- 100 වන බාලදක්ෂ ජම්බෝරිය හා 95 වන බාලදක්ෂිකා ජම්බෝරිය පැවැත්වීම.
- සෞඛ්‍යදාන නව ඒකක 50ක් ආරම්භ කිරීම හා ගුරුභවතුන් 250ක් සඳහා ප්‍රථමාධාර පුහුණුව ලබාදීම.
- ශාන්ත ජෝන් කීඩ් ඒකක 200ක් අලුතින් ආරම්භ කිරීම, ඒකක භාර ගුරුභවතුන් 200ක් සඳහා ප්‍රථමාධාර පුහුණුව ලබාදීම.
- කීඩ් හා කැඩෙට් ජාතික කඳවුරු පැවැත්වීමට අදාළ සහාය ලබාදීම, නව ඒකක 100ක් ආරම්භ කිරීම සඳහා ගුරු පුහුණුව ලබාදීම.
- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ඇඹිලිපිටිය නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් සඳහා ශිෂ්‍ය නායක නායිකාවන් යොමුකිරීම.
- මහින්ද රාජපක්ෂ විද්‍යාලයයේ උසස් පෙළ නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහනක් රංටැඹේ ජාතික ශිෂ්‍යභට පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වීම හා ජාතික ශිෂ්‍යභට බලකායේ ඇගයීම් කඳවුරට ශිෂ්‍යභට බාලක බාලිකාවන් සහභාගි කරවීම.
- ජනාධිපති සම්මාන ජාතික උත්සවය රංටැඹේ ජාතික ශිෂ්‍යභට පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වීමට අදාළ සහාය ලබාදීම.

*2012 වර්ෂයේ වියදම : රු .මි. 4.7*

## 4.21 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

### 4.21.1 අරමුණු හා ඉලක්ක

- ♦ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා පිළිබඳ දැනුම පුළුල් කිරීම.
- ♦ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ සිසුන් දැනුවත් කිරීම.

### 4.21.2 වාර්ෂික කාර්යසාධනය

- අල්ගම මහා විද්‍යාලයේ නායකත්ව සංවර්ධන වැඩමුළුව හා හලාවත ආනන්ද ජාතික පාසලේ ශිෂ්‍ය වැඩමුළුව හා විශේෂිත මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ලෝක අමද්‍යප දින නිර්මාණ තරගාවලිය පවත්වා ත්‍යාග බෙදා දීම.
- පාසල් පරිශ්‍රය දුම්, වැටි මධ්‍යසාර හා අනෙකුත් මත් ද්‍රව්‍ය භාවිතයෙන් තොර කලාපයක් බවට පත් කිරීම සඳහා අංක 28/2012 චක්‍රලේඛය 2012.08.30 දින නිකුත් කිරීම.

# 5. මානව සම්පත් සංවර්ධනය

## 5.1 ශ්‍රී ලංකා ගුරු සේවය

**5.1.1 වගුව : ගුරු සේවය සඳහා බඳවා ගැනීම් 2005-2012**

| වර්ෂය | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදුන් ගුරු පත්වීම් | | | | පළාත් සභා මගින් ලබාදුන් උපාධිධාරි ගුරු පත්වීම් |
|---|---|---|---|---|---|
| | ජාතික පාසල් සඳහා ගුරු පත්වීම් | | පළාත් සභා පාසල් සඳහා ගුරු පත්වීම් | | |
| | උපාධිධාරි | විද්‍යාපීඨ | උපාධිධාරි | විද්‍යාපීඨ | |
| 2005 | 2,923 | 383 | 326 | 2,326 | 1,925 |
| 2006 | 2,444 | 887 | 960 | 2,451 | 2,960 |
| 2007 | 0 | 408 | 1,490 | 2,191 | 967 |
| 2008 | 0 | 427 | 671 | 2,191 | 3,070 |
| 2009 | 971 | 1,307 | 0 | 1,613 | 1,498 |
| 2010 | 584 | 829 | 132 | 2,078 | 2,368 |
| 2011 | 1,090 | 1,090 | 2,198 | 1,553 | 2,145 |
| 2012 | 1,000 | 817 | 2,370 | 1,489 | 2,370 |
| එකතුව | 9,012 | 6,148 | 8,147 | 15,892 | 17,303 |

5.1.2 වගුව : **ගුරු සේවය සඳහා බඳවා ගැනීම් සාරාංශය**

| | |
|---|---|
| 2005-2012 දක්වා ගුරු සේවයට බඳවාගනු ලැබූ උපාධිධාරින් සංඛ්‍යාව | 34,462 |
| 2005-2012 දක්වා ගුරු සේවයට බඳවාගනු ලැබූ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරින් සංඛ්‍යාව | 22,040 |
| 2005-2012 දක්වා ගුරු සේවයට බඳවාගනු ලැබූ සමස්ත සංඛ්‍යාව | 56,502 |

## 5.1.2 ගුරු අධ්‍යාපනය සහ ගුරු පුහුණුව

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්, ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනය සහ ගුරු පුහුණුවේ කේන්ද්‍රස්ථාන වේ.

### ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 18ක් ඇති අතර, ඉන් 17ක් මගින් පූර්ව සේවා ගුරු පුහුණුව ලබා දී, පද්ධතියට අවශ්‍ය විවිධ විෂයයන්ට අදාළ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් බිහිකරනු ලබයි. පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ සහ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ ඉංග්‍රීසි භාෂා පුහුණුව සඳහා සුවිශේෂීව වෙන්කර ඇත.

### ගුරු විද්‍යාල

දිවයිනේ ගුරු විද්‍යාල 9ක් ඇති අතර, එමගින් සේවාස්ථ ගුරු අධ්‍යාපන කටයුතු මෙන් ම, නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම ද සිදුකරනු ලබයි.

### ගුරු මධ්‍යස්ථාන

දිවයින පුරා පිහිටුවා ඇති ගුරු මධ්‍යස්ථාන 104ක් මගින් පද්ධතියේ සිටින ගුරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

වාර්ෂික කාර්යසාධනය

- නුපුහුණු උපාධිධාරීන් 360 දෙනෙක් සඳහා පුහුණු අවස්ථා ලබා දීම.
- ගුරු සිසුන් 3100ක් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වලට බඳවාගැනීම.
- ළමා මිතුරු පාසල් ප්‍රවේශය පිළිබඳව විද්‍යුත් ඉගෙනුම් කට්ටලයක් ගුරු සිසුන්ට ලබාදීම.
- වසර 5කට පසු ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- 2013 වර්ෂයේ සිට පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් තෝරාගත් කලාප 23ක ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශ දැනුවත් කිරීම සහ අත්පොත හා චක්‍රලේඛය සකස් කිරීම.

- රජයේ පාසල්, පිරිවෙන්, පෞද්ගලික පාසල්වල නුපුහුණු ගුරුවරුන් 1488ක් 2012/2013 අධ්‍යයන වර්ෂයට අදාළ ව ගුරු විද්‍යාල වලට ඇතුළත් කිරීම.
- 2010/2011 දුරස්ථ ගුරු පුහුණුව හැදෑරූ ගුරු සිසුන් 2500ක් ප්‍රායෝගික පුහුණුවට පාසල්වලට අනුයුක්ත කිරීම හා අවසන් පරීක්ෂණ පැවැත්වීම.
- ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කොට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අනුමැතියට යැවීම.

## 5.2 ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම

- III පන්තියේ පුරප්පාඩු 1759ක් අතරින් 1010ක් පිරවීම සඳහා කටයුතු කිරීම.
- 2 - II පන්තිය සඳහා අධිසේවක පදනම මත 2767දෙනෙකු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ අවසන් කිරීම.
- ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත 3429 දෙනෙකු 2 - I පන්තියට උසස් කිරීම සඳහා පියවර ගැනීම.
- සීමිත හා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පුරප්පාඩු 395ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම.
- ජාතික පාසල් විදුහල්පති තනතුරු 105ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම.
- ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව පළාත්වල නිර්දේශ සහිත ව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට යැවීම.

## 5.3 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම

- III පන්තියේ පුරප්පාඩු 272 ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම.
- 2 - II පන්තියට 241 දෙනෙක් හා 1 පන්තියට 14 ක් උසස් කිරීමට අදාළ ගැසට් නිවේදනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අනුමැතියට යැවීම.
- 2 - I පන්තියට 40 දෙනෙකුන් උසස් කිරීම් සඳහා අයදුම්පත් කැඳවීම.
- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව- සංශෝධනය කොට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අනුමැතියට යැවීම.

## 5.4 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම්

- සීමිත තරඟ විභාග මත III පන්තියේ පුරප්පාඩු 185 න් 147 ක් සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතියට යැවීම.
- ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත III පන්තියේ පුරප්පාඩු 122 න් 108 ක් සඳහා පත්වීම් ලබාදීම.
- විවෘත තරඟ විභාග මත III පන්තියේ පුරප්පාඩු 103 න් 42 ක් සඳහා බඳවා ගැනීම.
- 2011.01.01 දිනට පැවති I පන්තියේ පුරප්පාඩු 08 සඳහා උසස්වීම් ලබා දීම.
- 2012.01.01 දිනට පැවති I පන්තියේ පුරප්පාඩු 24 සඳහා උසස්වීම් ලබා දීමට රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතියට යැවීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව සංශෝධනය කොට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතියට යැවීම.
- විවෘත තරඟ විභාගයෙන් බඳවාගත් III පන්තියේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන පැවැත්වීම.

## 5.5 විවිධ පුහුණු වැඩසටහන්

### 5.5.1 අරමුණු හා ඉලක්ක

- සියලු ම නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය.
- කලාප අධ්‍යාපන කාර්යාලයය පරිපාලන ඒකකයක් ලෙස ද, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයය ඉගෙනුම් සංවර්ධන ඒකකයක් ලෙස ද ශක්තිමත් කිරීම.
- විදුහල්පතිවරුන්ගේ නායකත්ව හා කළමනාකරණ හැකියා වර්ධනය කිරීම.

### 5.5.2 වාර්ෂික කාර්යසාධනය

- අමාත්‍යාංශයීය මාණ්ඩලික නිලධාරීන් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම.
- සංවර්ධන සහකාර, කළමනාකරණ සහකාර, සමාන්තර සේවාවල නිලධාරීන් 265ක් දෙනෙකු සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- දෙමළ භාෂා පාඨමාලාව සඳහා නිලධාරීන් 80දෙනෙකු යොමු කිරීම.
- ද්විතීයික පාසල් 1000ක් සංවර්ධන වැඩසටහන යටතේ විදුහල්පතිවරුන් 69දෙනෙකු සඳහා නායකත්ව සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාල කාර්ය සහායකවරුන් 106දෙනෙක් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

# 6. භෞතික සම්පත් සංවර්ධනය

## 6.1 අරමුණු හා ඉලක්ක

- ජාතික පාසල්වල ඉගෙනුම ලබන සිසු දරු දැරියන්ගේ ඉගෙනුම් උපකරණ අවශ්‍යතා සම්පාදනය.
- විදේශීය පරිත්‍යාග ලෙස ලැබෙන සුවිශේෂ සම්පත් දිවයිනේ සියලු පාසල් වෙත ලබාදීම.
- පිරිවෙන් හා නොවිධිමත් අධ්‍යාපන ආයතන වෙත උපකරණ ලබා දීම.
- සේවකයින්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිණිස ඉසුරුපාය කාර්යාල පරිශ්‍රය වඩා සිත්ගන්නා අයුරින් නවීකරණය කිරීම.
- පාසල්වලට අවශ්‍ය භෞතික පහසුකම් වැඩිදියුණු කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම ව කිරීම.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ එක් ව ප්‍රාථමික පාසල් ළමා මිතුරු පාසල් ලෙස සංවර්ධනය කිරීම .
- ජනාධිපති කාර්යාලයය සමඟ එක් ව වැසී යාමේ තර්ජනයට ලක් වූ කුඩා පාසල් නඟා සිටුවීම.

6.1 වගුව : **ගොඩනැගිලි ඉදිකිරීම්, අළුත්වැඩියා සහ සනීපාරක්ෂණ පහසුකම් සැපයීම**

| *ඉදිකිරීම් විස්තර* | *ආයෝජනය රු.මි.* |
|---|---|
| ප්‍රාථමික පාසල් වැඩිදියුණුව හා නව ඉදිකිරීම් | 60.1 |
| නව ආදර්ශ ප්‍රාථමික පාසල් ව්‍යාපෘතිය | 24.0 |
| ද්විතියික පාසල් නවීකරණය හා සංවර්ධනය | 305.1 |
| ජාතික පාසල් සංවර්ධනය | 279.9 |
| දහසක් පාසල් සංවර්ධනය කිරීම | 792.4 |
| පරිගණක විද්‍යාගාර ඉදිකිරීම හා අළුත්වැඩියා | 172.0 |
| ලීඩ් ව්‍යාපෘති පාසල් සංවර්ධනය | 42.3 |
| ආරක්ෂක සේවා විද්‍යාලවල ඉදිකිරීම් හා අළුත්වැඩියා | 200.9 |
| ඉංග්‍රීසි සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම (RESC) | 24.6 |
| නොවිධිමත් හා විශේෂ අධ්‍යාපනය සඳහා පංති කාමර ඉදිකිරීම | 6.5 |
| පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 150.0 |
| ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන නව ඉදිකිරීම් සහ අළුත්වැඩියා | 26.5 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ඉදිකිරීම් සහ අළුත්වැඩියා | 52.7 |
| EKSP - ADB ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් සහ අළුත්වැඩියා | 838.3 |
| ලෝක බැංකු ආධාර යටතේ ඉදිකිරීම් සහ අළුත්වැඩියා | 157.7 |
| KOICA ආධාර යටතේ ඉදිකිරීම් සහ අළුත්වැඩියා | 3.4 |
| යුනිසෙෆ් ආධාර යටතේ ජල හා සනීපාරක්ෂක පහසුකම් | 124.4 |
| සේව් ද චිල්රන් සහ පොදු රාජ්‍ය මණ්ඩල වැඩසටහන | 3.6 |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩිදියුණු කිරීම් | 75.2 |
| **එකතුව** | **3,339.6** |

6.2 වගුව : **ලී බඩු උපකරණ සහා ගුණාත්මක යෙදවුම් සැපයීම**

| *2012 වර්ෂයේ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය* | *ආයෝජනය රු.මි.* |
|---|---|
| ප්‍රාථමික පාසල් සඳහා ලී බඩු උපකරණ | 13.5 |
| නව ආදර්ශ ප්‍රාථමික පාසල් සඳහා ලී බඩු උපකරණ | 27.3 |
| ප්‍රාථමික සෞන්දර්ය උපකරණ | 15.5 |
| ප්‍රාථමික ගණිත උපකරණ | 2.9 |
| ප්‍රාථමික ක්‍රීඩා උපකරණ | 4.3 |
| ද්විතීයික පාසල් සඳහා ලී බඩු උපකරණ | 42.9 |
| තාක්ෂණික අධ්‍යයන උපකරණ වර්ග 8ක් පාසල් 89ක් සඳහා | 4.4 |
| සෞන්දර්ය උපකරණ වර්ග 35ක් පාසල් 178ක් සඳහා | 14.9 |
| ක්‍රීඩා උපකරණ වර්ග 32ක් පාසල් 252ක් සඳහා | 14.0 |
| විද්‍යා උපකරණ වර්ග 166ක් හා රසායන ද්‍රව්‍ය වර්ග 58ක් සියලු ම අවශ්‍ය පාසල් සඳහා | 22.9 |
| පරිගණක හා උපාංග | 67.3 |
| භාෂා උපකරණ | 1.2 |
| ලීඩ් ව්‍යාපෘති පාසල් සඳහා උපකරණ | 32.4 |
| ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රීසි වැඩසටහන් සඳහා | 44.7 |
| විශේෂ අධ්‍යාපන උපකරණ | 9.0 |
| පිරිවෙන් සඳහා පොත් සහ උපකරණ | 5.3 |
| ගුරු විද්‍යාල හා විද්‍යාපීඨ සඳහා | 30.8 |
| EKSP ව්‍යාපෘතිය යටතේ උපකරණ සැපයීම | 184.2 |
| ලෝක බැංකු ආධාර යටතේ උපකරණ සැපයීම | 16.2 |
| අමාත්‍යාංශය සඳහා වූ විවිධ සේවාවන් | 12.2 |
| එකතුව | 553.7 |
| පියානෝ 255ක් හා ග්‍රීන් බෝඩ් 3200ක් පාසල් සඳහා | රු.මි. 800ක් පමණ වටිනා කොරියානු පරිත්‍යාගයකි. |
| පරිගණක 180ක් පාසල් සඳහා | රු.මි. 15ක් පමණ වටිනා කොරියානු සහ ජපන් පරිත්‍යාගයකි. |

# 7. ඵලදායී සේවා සැපයීම් ශක්තිමත් කිරීම සහ කාර්යසාධනය ඇගයීම

## 7.1 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම හා පළාත් සභා සමඟ සම්බන්ධීකරණය

### 7.1.1 නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය

ජාතික අධ්‍යාපනයේ ඉදිරි ගමන තහවුරු කරමින් දේශීය උසස් සංස්කෘතික ගුණාංග අනාගත පරපුරට පවරා දෙමින් ආර්ථික, සමාජයීය හා ගෝලීය නව්‍යතාවන් ආවරණය කෙරෙන පරිදි ස්ථිරසාර අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක් කෙටුම්පත් කොට අවසන් කරනු ලැබ ඇත.

### 7.1.2 අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය නොනිමි ඉලක්කයක් සේ සලකමින් ගුණාත්මක සංවර්ධනය තහවුරු කරනු වස් සෑම මට්ටමකින් ම ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන වැඩසටහන් අඛණ්ඩ ව හා ක්‍රමානුකූලව නියාමනය කිරීම සඳහා නව ප්‍රවේශයකින් යුතු ව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට පියවර ගන්නා ලදී.

- මාසික අභ්‍යන්තර ප්‍රගති සමාලෝචන රැස්වීම්.
- පළාත් නිලධාරීන් සමඟ පැවැත්වෙන ද්වි මාසික අධ්‍යාපන කමිටු රැස්වීම්.
- ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු පළාත් අධ්‍යාපන ඇමතිවරුන් සමඟ පවත්වනු ලබන මාසික රැස්වීම්.
- ජාතික පාසල් විදුහල්පති රැස්වීම්.
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් සමඟ පවත්වන රැස්වීම්.

### 7.1.3 ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

- වසර 20ක් ඉක්මවා එකම පාසලේ සේවය කර ජාතික පාසල් ගුරුවරුන් 1500ක් ස්ථාන මාරු කිරීමට පියවර ගැනීම.
- ජාතික පාසල් සහ පළාත් පාසල් අතර ගුරු තුලනය සිදු කිරීමට හැකි වන පරිදි, ජාතික ගුරු ස්ථානමාරු ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා ගරු පළාත් අධ්‍යාපන ඇමතිවරුන් ඇතුළු සියලු පාර්ශවවල අදහස් ලබා ගැනීම.

### 7.1.4 මහින්දෝදය අධ්‍යාපන සංවර්ධන මාසය - 2012 ඔක්තෝබර්

පවත්නා අධ්‍යාපන ගැටළු කඩිනමින් විසඳාලමින් නව සංවර්ධනාත්මක ප්‍රවේශයක් තුළ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමෙන් සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කරන දින 31ක කාලයක් ලෙස 2012 ඔක්තෝබර් මාසය මහින්දෝදය සංවර්ධන මාසය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

### 7.1.5 පාසල් පාදක සංවර්ධනය සඳහා පාසල බලවන්ත කිරීම

පාසල් සැලසුම්කරණය , මූල්‍යකරණය ප්‍රසම්පාදනය පිළිබඳ තීරණ ගැනීමේ බලය පාසල් මට්ටමට නිදහස් කිරීම හා එමගින් පාසලෙහි වගවීම හා සේවා සැපයීම ශක්තිමත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය නව ප්‍රතිපත්තීන් අතර ප්‍රධාන වේ. මේ සඳහා පාසල් මූල්‍ය චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය පිළියෙල කරනු ලැබ ඇත.

ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පළමු පියවර සඳහා තෝරාගත් පාසල්වලට ඒවායේ මූලික අවශ්‍යතා සපුරාගැනීම සඳහා පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානයන් ලබාදීමට කටයුතු කරන ලදී.

### 7.1.6 පාසල් පාදක ගුරුවරුන් බඳවා ගැනීම

පාසල් පාදක ව ගුරුවරුන් බඳවාගැනීමේ ක්‍රමවේදයට අනුව ද්විතීයික පාසල් 1000 සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගන්නා ලදී. මෙම ක්‍රමවේදයට අනුව පත්වීම් ලබන පාසලේ ම නියමිත කාලයක් සේවය කිරීම අනිවාර්ය වන අතර එම හේතුව නිසා දුෂ්කර පාසල්වල ගුරු හිඟය මග හැරෙනු ඇත.

## 7.2 විදේශීය සහයෝගිතාව හා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය තුළින් ගුණාත්මක ප්‍රවේශයන් කරා යොමුවීම.

### 7.2.1 දකුණු ආසියාතික කලාපීය ගුරු අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය

2012 ඔක්තෝබර් 09 වන දින මෙම නව දකුණු ආසියානු කලාපීය ගුරු පුහුණු මධ්‍යස්ථානය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මීපේ දී ආරම්භ කරන ලදී. යුනෙස්කෝ සංවිධානය ඇතුළු විදේශ සංවිධාන වල සහයෝගය මත ගුරු පුහුණුව හා බැඳුණු ප්‍රතිපත්ති සංවර්ධනය, පර්යේෂණ ප්‍රවේශයන් සවිබල ගැන්වීම තුළින් ඉතාමත් ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු ගුරු බලකායක් කලාපයේ ඇති කරලීම සඳහා අඩිතාලමක් වනු ඇත.

මෙම විශේෂිත අරමුණු වෙනුවෙන් 2012-10-09 වන දින ඇෆ්ගනිස්තානය, බංගලාදේශය, පකිස්තානය, මාල දිවයින, ඉන්දියාව, නේපාලය යන කලාපීය රටවල අධ්‍යාපන අමාත්‍යවරුන්, අධ්‍යාපන නිලධාරීන් සහ යුනෙස්කෝ වැනි සංවිධානවල නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මෙම මධ්‍යස්ථානයේ සමාරම්භක ප්‍රවේශය නිර්මාණය කරන ලදී.

### 7.2.2 නැණස රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන්

ගුරුභවතුන් හිඟ දුෂ්කර පාසල්වල දරුවන්ට විශේෂයෙන් ම විද්‍යාව, ගණිතය, පළමු බස හා දෙවැනි බස සඳහා ඉගෙනුම් අවස්ථාවන් සම්පාදනයට නැණස අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහන දියත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය හා ඩයලොග් ආයතනය එක් ව අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. ඒ යටතේ මේ වන විට පාසල් 900කට ආසන්න සංඛ්‍යාවකට රූපවාහිනී සපයා දී ඇත.

### 7.2.3 වෙබ් පාඨශාලා වැඩසටහන

ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව හා එට්සලාට් සමාගම සමග අධ්‍යාපන අමාත්‍යාංශය ඇති කරගෙන ඇති අවබෝධතා ගිවිසුමට අනුව ශ්‍රී ලංකාවේ පාසල් සඳහා පරිගණක පහසුකම් හා අන්තර්ජාල පහසුකම් ලබාදීමටත් විෂය මාලාවට අයත් මෘදුකාංග අන්තර්ජාලය හරහා පරිශීලනයට අවස්ථාව ලබා දීමටත් පියවර ගෙන ඇත.

### 7.2.4 පරිගණක පහසුකම් ලබාදීම

කොරියානු ජන රජයේ ග්වැන්ජු මෙට්‍රොපොලිටන් අධ්‍යාපන ආයතනය, කොරියානු අධ්‍යාපන විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සමග අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුමට අනුව පරිගණක 50ක් මෙම වර්ෂයේ දී මහින්ද රාජපක්ෂ විද්‍යාලය වෙත ප්‍රදානය කරන ලදී.

### 7.2.5 පියානෝ සහ ග්‍රීන්බෝඩ් පරිත්‍යාග ලෙස ලැබීම

කොරියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර ඇති කරගත් ගිවිසුමට අනුව නවීන විද්‍යුත් පියානෝ 3000ක් පාසල්වලට බෙදාහැරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දී ඇත.

ග්‍රීන්බෝඩ් වර්ගයේ විශේෂිත කළු ලැලි 30,000 ක් ද කොරියානු දානපතියෙකුගේ පෞද්ගලික ප්‍රදානයක් ලෙස මෙරටට ලැබී ඇත.

මෙම පරිත්‍යාගයන් රු.මිලියන 1000ක පමණ වටිනාකමකින් යුක්ත වේ.

### 7.2.6 නිර්මාණශීලී ගුරුවරුන් හා ශිෂ්‍යයන් සඳහා මෘදුකාංග තරගය - මයික්‍රොසොෆ්ට් සහයෝගීතාව

ගුරුවරුන් හා සිසුන් තුළ නවෝත්පාදන තොරතුරු තාක්ෂණ නිපුණතා ඔප නැංවීමේ අරමුණින් මයික්‍රොසොෆ්ට් සමාගමේ සහයෝගීතාවය යටතේ වාර්ෂික ව මෙම මෘදුකාංග තරගය පවත්වා සම්මාන පිරිනැමේ.

### 7.2.7 ඉන්ටෙල් සහයෝගීතා වැඩසටහන

පාසල් ශිෂ්‍යයින් නව නිපැයුම් බිහි කිරීමට දිරිමත් කොට ජාත්‍යන්තර තරග කරා යොමු කරවීම සඳහා ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සල්පිල හා ප්‍රදර්ශනය ජාතික විද්‍යා පදනම හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය හා එක් ව ඉන්ටෙල් සමාගම පවත්වනු ලබයි.

School.lk වෙබ් අඩවිය හරහා ශිෂ්‍යයින්ට හා ගුරුවරුන්ට ඉගෙනුම් සම්පත් සඳහා ප්‍රවේශවීමට සහ සම්පත් නිර්මාණයට ඉන්ටෙල් දායකත්වය ලබා දී ඇත.

## 7.3 අමාත්‍යාංශය තුළ නව සංවර්ධන ප්‍රවේශයන්

### 7.3.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික මෙහෙයුම් මැදිරිය දියත් කිරීම (National Operations Room)

ජනතා ප්‍රශ්න කඩිනමින් හඳුනාගෙන සැනෙකින් ක්‍රියාත්මකවීම උදෙසා ජාතික මෙහෙයුම් මැදිරියක් අළුතින් හඳුන්වා දෙන ලදී.

එය පහත සඳහන් අරමුණු 05ක් මත ක්‍රියාත්මක වේ.

- සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයන්ට අදාළ මූලික හා ප්‍රධාන තොරතුරු යාවත්කාලීන කිරීම පුළුල් භාවිතයක් උදෙසා සම්බන්ධීකරණය සහතික කිරීමට.
- ජනමාධ්‍ය තොරතුරු මූලාශ්‍රයක් ලෙස යොදා ගැනීමටත්, එය ක්ෂේත්‍රයේ ගැටළු කඩිනමින් විසඳාලීම උදෙසා යොදා ගැනීමේ හැකියාව පුළුල් කිරීමට.
- නවීන තාක්ෂණික ප්‍රවේශ තුළින් කඩිනමින් තොරතුරු ලබා ගනිමින් ඒවා ප්‍රශස්ත තීරණ උදෙසා යොමු කරවන ප්‍රවේශයක් නිර්මාණය කිරීමට.
- අධ්‍යාපන සංවර්ධනය තහවුරු කෙරෙන වාර්තා සැකසීමේ පදනම පුළුල් හා ඵලදායි කරලීමට.

- දෙස් විදෙස් දූත පිරිස් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ ප්‍රධාන පෙළේ තොරතුරු වෙත නවීන ක්‍රමවේදයන් ඔස්සේ ළඟාවීමට ඇති හැකියාව පුළුල් කිරීමට.

මේ සඳහා ජනමාධ්‍ය, දුරකථන, ඊ මේල් ෆැක්ස්, ලිපි ඇතුළු සියලු උපක්‍රම විවර කර ඇති අතර, 1988 ක්ෂණික ඇමතුම් අංකයක් ලෙසින් සෘජු දුරකථන පහසුකම් ප්‍රජාවට ලබා දී ඇත.

### 7.3.2 ඵලදායිතා සංවර්ධන වැඩසටහන

2012 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ඵලදායිතා මෙහෙයුම් ඒකකයක් ආරම්භ කරනු ලැබිණි. මෙම මෙහෙයුම් ඒකකය තුළ අමාත්‍යාංශයේ මූලික අංශ පහම නියෝජනය වන පරිදි නිලධාරීන් 30 දෙනෙකු ගෙන් සමන්විත ඵලදායිතා ප්‍රවර්ධන කමිටුවක් පිහිටුවා ඇත. ඵලදායිතා ප්‍රවර්ධන කමිටුව හරහා මෙම අමාත්‍යාංශයේ සියලු ම ශාඛාවල ඵලදායීතාවය වර්ධනය කොට අධ්‍යාපන අමාත්‍යාංශය විශිෂ්ට කාර්යසාධනීය අමාත්‍යාංශයක් බවට පත් කිරීමට අරමුණු කරගෙන ඇත.

### 7.3.3 e-pension ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

- විශ්‍රාම යන නිලධාරීන් සඳහා එදින ම පාරිතෝෂිත දීමනා ගෙවීමට හැකි වන පරිදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා එක්ව e-pension ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

## 7.4 කාර්යසාධනය ඇගයීම

### 7.4.1 ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් පිළිබඳ ජාතික තක්සේරුකරණ වැඩසටහන්

2012 වර්ෂයේ 8 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඇගයීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ NEREC ආයතනය සමග එක් ව ජාතික තක්සේරුකරණ වැඩසටහන පැවැත්වීමට පියවර ගෙන ඇත.

### 7.4.2 පාසල් සහ අධ්‍යාපන ආයතන ඇගයීම් ක්‍රියාවලිය

- ජාතික පාසල් 51 ක් බාහිර ඇගයීම් ක්‍රියාවලියට ලක් කිරීම .
- ජාතික පාසල් 05ක ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත්වීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු අධ්‍යාපන ආයතන සඳහා ප්‍රමිති, නිර්ණායක හා දර්ශක සකස් කර , එක් විද්‍යාපීඨයක බාහිර ඇගයීම් වැඩ සටහන සිදුකිරීම.
- පාසල් බාහිර ඇගයීම් පුහුණු කරුවන් පුහුණු කිරීම සඳහා අත්පොතක් සකස් කිරීම.
- සියලු ම කලාප අධ්‍යාපන කාර්යාලවල ගුණාත්මක බව වැඩිකිරීම සඳහා පිරික්සුම් ලැයිස්තුවක් සකස් කර කලාප කාර්යාල 02ක ඇගයීම් පැවැත්වීම.

### 7.4.3 අධ්‍යාපන පර්යේෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

- ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ ව පළාත්වල පර්යේෂණ ක්‍රියා වැඩිදියුණු කිරීම

- 2009 සිට ක්‍රියාත්මක වන 'One Laptop per Child' වැඩසටහන සම්බන්ධ ව ජාතික අධ්‍යාපන ආයතනය සමඟ පාසල් 13ක සිදුකළ පර්යේෂණ දත්ත අනාවරණ කිරීම.

- වතු පාසල් පිළිබඳ අධ්‍යයනයක් කිරීම.
- අධ්‍යාපන පර්යේෂණ හැකියා සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන පර්යාලෝක පළමු සඟරාව එළිදැක්වීම.

- කුඩා පාසල් සංවර්ධනය සම්බන්ධ ව ජාතික අධ්‍යාපන ආයතනය සමග සිදු කළ පර්යේෂණ එළි දැක්වීම.

### 7.4.4 පාසල් දත්ත පාදකය වැඩිදියුණු කිරීම.

- 2011 වාර්ෂික පාසල් සංගණනය මගින්ලබා ගත් ගුරු ශිෂ්‍ය සංඛ්‍යා ඇතුළු සියලු ම තොරතුරු අමාත්‍යාංශ දත්ත පාදකයට ඇතුළත් කිරීම සහ 2012 වාර්ෂික පාසල් සංගණනය පැවැත් වීම.

- ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය මොරටුව විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇති ව නව මෘදුකාංගයකට අනුව සකස් කිරීමේ පළමු පියවර ලෙස ගුරු තොරතුරු ඇතුළත් කිරීම සම්පූර්ණ කිරීම.

- ද්විතීයික පාසල් 1000 වැඩසටහන සමග සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්වලට අනුව පාසල් පිහිටීම පිළිබඳ භූගෝලීය තොරතුරු පද්ධතිය(GIS ) යාවත් කාලීන කිරීම.

- 2011 දත්ත හා තොරතුරු ඇතුළත් ප්‍රකාශනය එළි දැක්වීම.



අතිගරු ජනාධිපතිතුමා විසින් ගුරු පත්වීම් ප්‍රදානය කරමින්.....



දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථානය විවෘත කරමින්........



වෙබ් පාඨශාලා ඉගෙනුම් පද්ධතිය හඳුන්වා දෙමින් ....



පාසල් වලට දුරස්ථ අධ්‍යාපනය සඳහා නැණස විද්‍යා උපකරණ බෙදාහැරීම....

# 8. මූල්‍ය ආයෝජනය සහ වියදම් පිළිබඳ ප්‍රගතිය

අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන සහ සංවර්ධන වැඩසටහන යන ප්‍රධාන වැඩසටහන් දෙකක් ඔස්සේ මූල්‍ය ප්‍රතිපාදන වෙන් වේ.

පුනරාවර්තන වියදම් ප්‍රධාන ක්ෂේත්‍ර 9කට අදාළ ව්‍යාපෘති යටතේ දරනු ලබන අතර, 2012 වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 27,213 ක මුදලක් වෙන් වී ඇත. ඒ අතරින් රු. මිලියන 11,095ක් වෙන් වී ඇත්තේ ද්විතියික අධ්‍යාපනය සඳහා ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් ද ඉහත ප්‍රධාන වැඩසටහන් දෙක යටතේ ම ව්‍යාපෘති 8ක් හරහා ක්‍රියාත්මක වේ. 2012 වර්ෂයේ සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදනය රුපියල් මිලියන 6,886ක් විය.

විදේශාධාර සියල්ල ප්‍රාග්ධන වියදම් ලෙස ගැනෙන අතර, එය දළ වශයෙන් රුපියල් මිලියන 3,925ක් පමණ විය.

ජාතික අමාත්‍යාංශය හා පළාත් සභා ද එකතුව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද සමස්ත වියදම් වාර්ෂික ව වැඩි වී ඇත. (8.3.1 රූප සටහන)
පුනරාවර්තන වියදම් 2005 වර්ෂයට සාපේක්ෂ ව 2011 වර්ෂයේ දී දෙගුණයක පමණ වැඩිවීමක් පෙන්වයි. (8.3.1 රූප සටහන)

## 8.1 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් සාරාංශය

8.1.1 වගුව : **අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම්**

| ව්‍යාපෘතිය | | 2012 ඇස්තමේන්තුව රු.මි | ශුද්ධ ප්‍රතිපාදනය | 2012.12.31 ට වියදම රු.මි. |
|---|---|---|---|---|
| 126-1-1 | අමාත්‍ය කාර්යාලය | 54.15 | 48.70 | 45.47 |
| 126-1-2 | පරිපාලන සහ ආයතනික සේවා | 468.40 | 483.98 | 470.45 |
| 126-2-3 | ප්‍රාථමික අධ්‍යාපනය | 2,662.16 | 2,946.90 | 2,946.39 |
| 126-2-4 | ද්විතියික අධ්‍යාපනය | 10,851.57 | 11,905.32 | 11,900.09 |
| 126-2-5 | විශේෂ අධ්‍යාපනය | 2,774.44 | 3,212.04 | 3,205.69 |
| 126-2-6 | අධ්‍යාපනය සඳහා ප්‍රදාන සහ අධාර | 7,111.41 | 7,254.46 | 7,649.00 |
| 126-2-7 | අධ්‍යාපන සැලසුම්,නියාමනය, පර්යේෂණ හා සංවර්ධනය | 19.94 | 22.07 | 12.40 |
| 126-2-8 | ගුරු සංවර්ධනය | 1,220.57 | 1,030.18 | 1,016.03 |
| 126-2-9 | ආයතනික වැඩිදියුණු කිරීම් | 309.50 | 309.50 | 281.08 |
| | මුළු එකතුව | 25,472.92 | 27,213.76 | 26,926.59 |

## 8.2 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් සාරාංශය

8.2.1 වගුව : **අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම්**

| ව්‍යාපෘතිය | **2012 ඇස්තමේන්තුව රු.මි.** | **ශුද්ධ ප්‍රතිපාදන රු.මි.** | **වියදම රු.මි.** |
|---|---|---|---|
| 126-1-1 අමාත්‍ය කාර්යාලය | 5.76 | 6.69 | 6.02 |
| 126-1-2 පරිපාලන සහ ආයතනික සේවා | 78.43 | 104.21 | 86.67 |
| 126-2-3 ප්‍රාථමික අධ්‍යාපනය | 320.90 | 352.04 | 281.35 |
| 126-2-4 ද්විතියික අධ්‍යාපනය | 1,477.45 | 2,281.81 | 1,586.96 |
| 126-2-5 විශේෂ අධ්‍යාපනය | 36.45 | 31.46 | 17.69 |
| 126-2-8 ගුරු සංවර්ධනය | 92.08 | 118.62 | 86.18 |
| 126-2-9 ආයතනික වැඩිදියුණු කිරීම් | 72.50 | 65.98 | 38.11 |
| 126-2-10 අධ්‍යාපනය සඳහා විදේශ අධාර | 3,850.70 | 3,925.49 | 2,266.37 |
| මුළු එකතුව | 5,934.26 | 6,886.28 | 4,369.35 |


8.2.2 වගුව : **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**

| ගිණුම | ආරම්භක ශේෂය **2012.01.01** දිනට | මුළු ලැබීම් රු.මි. | මුළු ණය | **2012.12.31** දිනට ශේෂය |
|---|---|---|---|---|
| **8493/0/0/0126/0011** | 1,776.66 | 430.66 | 766.42 | 1441.09 |
| **0493/0/0/0126/0012** | - | 29.76 | 21.21 | 8546.14 |
| **එකතුව** | | 460.42 | 787.63 | 1449.63 |
| **ඇස්තමේන්තුවේ සීමාව** | | 785.00 | 670.00 | 2700.00 |

## 8.3 සාමාන්‍ය අධ්‍යාපනය සඳහා සමස්ත වියදම

8.3 වගුව : ජාතික අමාත්‍යාංශය හා පළාත් සභා විසින් දරන ලද සමස්ත **අධ්‍යාපන වියදම් 2005 - 2012**

| **වර්ෂය** | **2005** | **2006** | **2007** | **2008** | **2009** | **2010** | **2011** | **2012** |
|---|---|---|---|---|---|---|---|---|
| **සමස්ත අධ්‍යාපන වියදම රු. මිලියන** | 53,294 | 64,182 | 74,528 | 84,713 | 91,192 | 95,487 | 105,552 | 116,704 |




**8.3.1.** රූප සටහන : සමස්ත අධ්‍යාපන වියදම **2005-2012**

## 8.4 අධ්‍යාපන සංවර්ධනය සඳහා විදේශාධාර හා ආයෝජන

8.4.1 වගුව : **අධ්‍යාපන සංවර්ධනය සඳහා විදේශාධාර හා ආයෝජන - 2012**

| මූලාශ්‍රය | වැඩසටහන | 2012 සඳහා ආයෝජන (රු.මි.) |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව ( ADB ) | දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය ( EKSP ) | 2,480 |
| ලෝක බැංකුව (WB) | දැනුම් සමාජයක් කරා පාසල් අධ්‍යාපනය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය( TESP ) | 335 |
| යුනිසෙෆ් ( UNICEF ) | *ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම<br>*වාර්ෂික සැලැස්මේ ඇතුළත් වැඩසටහන්<br>*ළමා ආරක්ෂණ වැඩසටහන් | 176.6<br>16.6<br>5.0 |
| KOICA | *නැගෙනහිර පළාතේ පාසල් ප්‍රතිසංස්කරණය<br>*කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රතිසංස්කරණය<br>*හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රතිසංස්කරණය | 50.5<br>95.5<br>45.5 |
| USAID | කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවල පාසල් ප්‍රතිසංස්කරණය | 99.6 |
| යුනෙස්කො (UNESCO ) | ධාරිතා සංවර්ධන වැඩසටහන | 15 |
| සේව් ද චිල්රන් (Save the Children) | වාර්ෂික සැලැස්මේ ඇතුළත් වැඩසටහන් | 2.8 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය වැඩසටහන (Commonwealth Of Learning) | වාර්ෂික සැලැස්මේ ඇතුළත් වැඩසටහන් | 1.7 |
| එකතුව | | 4323.8 |

සාමාන්‍ය අධ්‍යාපනය සඳහා විදේශාධාර ලබාදෙන ආයතන අතර, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, යුනිසෙෆ් සංවිධානය, යුනෙස්කෝ සංවිධානය, KOICA ආයතනය සහ USAID ආධාර ආයතනය ප්‍රධාන වේ. 2012 වර්ෂයේ දී රුපියල් මිලියන 2480ක විශාල ආයෝජනයක් ආසියානු සංවර්ධන බැංකුව දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය හරහා සිදුකර ඇත. ලෝක බැංකුව අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුවට සමගාමී ව දැනුම් සමාජයක් කරා පාසල් අධ්‍යාපනය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 335ක ආයෝජනයක් 2012 වර්ෂයේ දී සිදුකර ඇත.

කුඩා පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා යුනිසෙෆ් ප්‍රතිපාදන ලබාදීමත්, උතුරු නැගෙනහිර පළාත්වල පාසල් ප්‍රතිසංස්කරණය සඳහා KOICA සහ USAID ආධාර ලබාදීමත් 2012 වර්ෂයේ විදේශාධාර ආයෝජන අතර විශේෂයෙන් සඳහන් කළ හැකි ය.

## 8.5 දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකු ආධාර
## Education for Knowledge Society Project (EKSP) - ADB Funded

**දැක්ම**

ද්විතීයික පාසල් ඉලක්ක කොට රැකියා වෙළඳපල සඳහා උචිත දක්ෂතාවලින් හෙබි උගත් තරුණ පරපුරක් සඳහා ගුණාත්මක බවින්, අදාළ බවින් හා සමානාත්මතාවයෙන් යුතු උසස් ඉගෙනුම්ඵල කරා ළඟාකරවීමේ අවස්ථා සහතික කිරීම.

### 8.5.1. අරමුණු සහ ඉලක්ක

- ♦ දරිද්‍රතා දර්ශකය මත තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ද්විතීයික පාසල් සංවර්ධනය කිරීම තුළින් ගුණාත්මක බවින් සපිරි ද්විතීයික අධ්‍යාපන අවස්ථා සහතික කිරීම
- ♦ තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නංවාලීමත්, පුළුල් භාවිතය සඳහාත් ප්‍රවේශය සලස්වන මධ්‍යස්ථාන බවට පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන පත්කිරීම
- ♦ අත්‍යාවශ්‍ය නඩත්තු හා අළුත්වැඩියා පාසල් මට්ටමින් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහා පාසල බලගන්වාලීම.
- ♦ ද්විතීයික පාසල්වල මහා පරිමාණ ඉදිකිරීම් ආයෝජනවලට සාපේක්ෂ ව අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සහතික කිරීම පෙරදැරි කොටගත් කාර්යසාධනය මත මූල්‍ය ආයෝජන හිමිකම තීන්දු කරමින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් පාසල් මට්ටමින් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේ සංස්කෘතිය ඇති කිරීම.
- ♦ ද්විතීයික පාසල්වල කාර්යක්ෂම හා ඵලදායී ඉගෙනුම් වාතාවරණයක් සහතික කරලීම
- ♦ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනික ප්‍රවේශය ඉගෙනුම් ඉගැන්වීම් මෙවලමක් ලෙස භාවිත කිරීම සඳහා ගුරු සිසු හැකියා පුළුල් කිරීම
- ♦ ඉගෙනුම් දක්ෂතා සහිත අවාසිදායක ආර්ථික පරිසර හිමි 10 - 13 ශ්‍රේණි දරු දැරියන්ගේ අඛණ්ඩ අධ්‍යාපන අවස්ථා සහතික කරලීමට සිසුදිරිය ශිෂ්‍යත්ව ලබාදීම.
- ♦ පාසල් හැරගිය දරුවන්ගේ රැකියා, සමාජීය, නායකත්ව දක්ෂතා හා හැකියා පුළුල් කරමින් ඔවුන්ගේ අනාගතය සඳහා ගුණාත්මක අත්වැලක් සැපයීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- ♦ අධ්‍යාපනික මෘදුකාංග පාසල් මට්ටමට සපයා දෙමින් ගුරු සිසු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාදාමය ප්‍රියජනක අවස්ථාවක් බවට පත්කිරීම.

### 8.5.2 වාර්ෂික කාර්යසාධනය

- ද්විතීයික පාසල්1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පළමු පාසල් 100 සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය මඟින් කරනු ලබන අතර, 2012 වර්ෂයේ 32 ක් සිසු අයිතියට පත්කර ඇති අතර තවත් පාසල් 28 ක ඉදිකිරීම් අවසන් කර ඇත.
- පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන (PICTECs) සංවර්ධනය කිරීම යටතේ ඌව පළාත් මධ්‍යස්ථානය සංවර්ධනය කර අවසන් කර ඇත. මධ්‍යස්ථාන 08ක වැඩ ආරම්භ කර ඇත.
- ද්විතීයික පාසල් සඳහා පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන ( SDMG) පාසල් 1400 ක් සඳහා ලබා දී ඇත.
- පාසල් 1000 වැඩසටහන යටතේ ද්විතීයික පාසල්104 ක් සඳහා විශේෂ සංවර්ධන මූල්‍ය ප්‍රදාන ලබාදීම (SDFG) යටතේ 2011 වර්ෂයේ ආයෝජන ප්‍රගතිය මත2012 වර්ෂයේ දී ආයෝජන දෙගුණ කර ලබා දී ඇත.
- ද්විතීයික පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ඇති පාසල් සඳහා පරිගණක උපාංග ,ලී බඩු හා විද්‍යාගාර උපකරණ ලබාදීම 2012 වර්ෂයේ දී අවසන් කර ඇත.
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව ගුරුභවතුන් සඳහා ICDL/CAL ගුරු පුහුණු ශිෂ්‍යත්ව පිරිනැමීම යටතේ ගුරුභවතුන්5422කට පුහුණුව ලබා දී ඇත.
- ගුරුවරුන් සඳහා උසස් මට්ටමේ International Pedagogical ICT බලපත්‍ර (IPICT) ශිෂ්‍යත්ව පිරිනැමීම යටතේ ගුරුභවතුන්4750 කට පුහුණුව ලබා දී ඇත.
- 10-13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී පවුල්වල දක්ෂ සිසු දරු දැරියන් සඳහා සිසුදිරිය ශිෂ්‍යත්ව පිරිනැමීම (Sisudiriya) යටතේ සිසුන්30,00 0කට ශිෂ්‍යත්ව පිරිනැමීම අවසන් කර ඇත.
- පාසල් හැරගිය සිසුන් සඳහා කුසලතා වැඩිදියුණු කිරීමේ කඩිනම් ශිෂ්‍යත්ව (ASAP) වැඩසටහන යටතේ සිසුන් 7000ක් සඳහා ශිෂ්‍යත්ව ලබා දී ඇත.
- පාසල් හැරගිය සිසුන් සඳහා සංචාරක ක්ෂේත්‍ර රැකියා පුහුණුව ලබාදීම යටතේ (TSTS) සිසුන් 1,045කට ද කෙටිකාලීන වෘත්තීය පුහුණුව ලබාදීම (SPTP) යටතේ සිසුන් 3,317 කට ද ශිෂ්‍යත්ව ලබා දී ඇත.
- 2 වර්ගයේ පාසල් 2,069 ක පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථාන සඳහා පරිගණක ,උපාංග හා ලී බඩු උපකරණ ලබාදීම.

## 8.6 දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම - ලෝක බැංකු ආධාර
## Transforming the School Education System as the Foundation of a Knowledge Hub Project (TSEP) - World Bank Funded

ආංශික සංවර්ධන ප්‍රවේශය (Sector - wide approach) මත ගොඩ නැගුණු අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (2013 - 2016) ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකුව විසින් ඇ.ඩො. මිලියන 100ක් TSEP ව්‍යාපෘති හරහා ආයෝජනය කරනු ලබයි.

TSEP ව්‍යාපෘතියේ සුවිශේෂී අරමුණ වී ඇත්තේ අනාගත දැනුම් පාදක ආර්ථිකයකට හා සමාජයට අවශ්‍ය මානව ප්‍රාග්ධනය පදනම ලෙස ශ්‍රී ලංකාවේ පාසල් පද්ධති ප්‍රදානය කරලීමත් එමගින් මානව සංවර්ධනය ඉහළ නංවමින්, ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම හා දරිද්‍රතාව දුරු කරලීමත්ය.

TSEP ව්‍යාපෘතිය ආංශික සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන ප්‍රතිපත්තිමය තේමාවක් වන ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා ඉහළ නැංවීම, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා යහපාලනය හා සේවා සැපයීම ශක්තිමත් කිරීම යන ආංශික සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන තේමාවන් 3ක් යටතේ ක්‍රියාත්මක වේ.

- ♦ ප්‍රධාන කාර්යසාධන දර්ශක
- ♦ මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක දර්ශක
- ♦ සෘජු නිමවුම් හා ක්‍රියාවලි දර්ශක

පහත සඳහන් වැඩසටහන් සඳහා ලෝක බැංකු ප්‍රතිපාදන නිදහස් කිරීම, ඊට අදාළ ප්‍රධාන කාර්යසාධන දර්ශක මත තීරණය වේ.

- ♦ අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම
- ♦ පාසල් පාදක ගුරු සංවර්ධන රාමුව
- ♦ ද්වි භාෂා අධ්‍යාපනය - අන්තර්ගතය හා භාෂා සමෝධානික ඉගෙනුම් රාමුව (CLIL)
- ♦ පාසල් නගා සිටුවීමේ වැඩසටහන
- ♦ අධ්‍යාපන කලාප හා කොට්ඨාස ශක්තිමත් කිරීම

සමස්ත ප්‍රතිඵල පාදක හා අන්තර් කාලීන ඉලක්ක සම්බන්ධ කාර්යයන් වෙනුවෙන් ප්‍රතිශතක ප්‍රතිපාදන වෙන් කෙරෙන අතර, එම කාර්යයන් පහත දැක් වේ.

- වයස අවුරුදු 5-16 දක්වා අනිවාර්යය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, සහභාගීත්වය අනුපාතයන් ඉහළ නැංවීම, මෙම පාසල් නොඑන දරුවන් හඳුනාගෙන ඔවුන් පාසල් ගත කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනයේ භෞතික හා ගුණාත්මක සංවර්ධනය
- ප්‍රාථමික පාසල් ජාලයක් සඳහා ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල ඉගෙනුම් පහසුකම් හා පරිසරයන් වැඩිදියුණු කිරීම
- නොවිධිමත් අධ්‍යාපන හා විශේෂ අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම.
- පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන්.
- ශිෂ්‍ය මාර්ගෝපදේශ හා උපදේශනය.
- විෂයමාලාව නවීකරණය කිරීම, විද්‍යා, ගණිත, ඉංග්‍රිසි, තොරතුරු තාක්ෂණ යන විෂයයන් හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම.
- ගුරු සංවර්ධනය වැඩසටහන් හා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සාමය සහ සමාජ ඒකාග්‍රතාවය සඳහා ගුරු සංවර්ධනය.
- අධ්‍යාපන ආයතනවල ප්‍රමිති හා කළමනාකරණය ශක්තිමත් කිරීම.
- පාසල් කළමනාකරණය ශක්තිමත් කිරීම.
- විදුහල්පති නායකත්ව පුහුණු හා කළමනාකරණය.
- ජාතික ඇගයීම් වලින් අනාවරණය කරගනු ලබන තත්ත්වයන් පිළිබඳ අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා එම අනාවරණයන් යටතේ හඳුනාගනු ලබන කාර්යයන් අධ්‍යාපන සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කිරීම.

## 8.7 යුනිසෙෆ් ආධාර ලද වැඩසටහන්

- ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධනය.
- ළමා මිතුරු පාසල් නියාමනය සහ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර බෙදා හැරීම.
- මධ්‍යම, ඌව, නැගෙනහිර, බස්නාහිර සහ දකුණු පළාත්වල දුෂ්කර පාසල් සඳහා ජල හා සනීපාරක්ෂණ පහසුකම් ලබා දීම.
- සාක්ෂර උපදේශකවරුන් පුහුණු කිරීම.
- සැමට අධ්‍යාපන අරමුණු නියාමනය සහ දශක අග වාර්තාව සකස් කිරීම.
- නියාමනය සහ ඇගයීම සඳහා අධ්‍යාපන තොරතුරු භාවිතය පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම.
- 2012 වර්ෂයේ වෙන් කරන ලද මුදල රු. මි. 15.4කි.

## 8.8 කොරියන් (KOICA) ආධාර ලද වැඩසටහන්

- නැගෙනහිර පළාතේ පාසල් 11ක ඉදිකිරීම් සහ උපකරණ ලබා දීම සඳහා රු.මි. 200ක ආධාර ලබා දීම.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් 13ක පන්ති කාමර, ක්‍රියාකරකම් කාමර, ගුරු නිවාස ඉදිකොට සංවර්ධනය කිරීම සඳහා රු.මි. 500ක් ලබාදෙන ලදී.

## 8.9 නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය (දේශීය අරමුදල්)

දැක්ම

නගරබද ජනප්‍රිය පාසල් අවට ඇති සම්පත් බහුල අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසල්වලට පහසුකම් ලබා දී සංවර්ධනය කිරීම මගින් ජනප්‍රිය පාසල්වලට ඇති තරගකාරීත්වය අඩු කිරීම, පාසල් අතර විෂමතාවය අවම කිරීම සහ පාසල් හැර යන ශිෂ්‍ය සංඛ්‍යාව අවම කිරීම.

### 8.7.1 අරමුණු හා ඉලක්ක

- ♦ ව්‍යාපෘතියට අයත් පාසල්වල සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ♦ විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය.

### 8.7.2. වාර්ෂික කාර්යසාධනය

- ව්‍යාපෘතියට අයත් පාසල්වල අර්ධ අවසන් ගොඩනැගිලි 50% කින් අවසන් කිරීම.
- ව්‍යාපෘති පාසල්වලට ඡායා පිටපත් යන්ත්‍ර 80, මුද්‍රණ අනුපිටපත් යන්ත්‍ර 16, ලිපි ගොනු කැබිනට්100, ළමා පුටු හා මේස 1713 ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
- බටහිර තූර්යවාදක කට්ටල 30 ලබා දීමට පියවර ගැනීම
- විදුහල්පති හා ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂිත ය.

*වියදම : රු .මි. 47.7*

# 9. ගුණාත්මක දර්ශක ඇසුරින් කාර්යසාධනය විශ්ලේෂණය

## 9.1 තෝරාගත් ප්‍රධාන දර්ශක කිහිපයක් ඇසුරෙන් සංසන්දනයක්

9.1වගුව : ප්‍රධාන දර්ශක කිහිපයක් ඇසුරෙන් සංසන්දනය (1994, 2005, 2011)

| | දර්ශකය | 1994 | 2005 | 2011 |
|---|---|---|---|---|
| 1. | අ.පො.ස (සා.පෙළ) සමත් ප්‍රතිශතය | 22.5 | 49.7 | 60.8 |
| 2. | අ.පො.ස (උ.පෙළ) සමත් ප්‍රතිශතය | 44.4 | 59.2 | 61.7 |
| 3. | 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට ඉහළ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | 8.9 | 10.4 |
| 4. | විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 9,787 | 17,287 | 21,547 |
| 5. | සාක්ෂරතාවය | 87.2 | 91 | 96.4 |
| 6. | තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව | නොමැත | 16.0 | 38.0 |
| 7. | අ.පො.ස. (උ.පෙළ) විද්‍යා, කලා, වාණිජ විෂය ධාරා තුනම සහිත පාසල් (1AB) සංඛ්‍යාව | 566 | 646 | 720 |
| 8. | ගුරු සංඛ්‍යාව | 187,586 | 187,339 | 216,281 |
| 9. | ගුරු ශිෂ්‍ය අනුපාතය | 1:22 | 1:21 | 1:17 |
| 10. | සාමාන්‍ය අධ්‍යාපන වියදම (රු. මිලියන) | | 53,294 | 100,174 |
| 11. | සාමාන්‍ය අධ්‍යාපන ප්‍රාග්ධන වියදම (රු. මිලියන) | | 7,546 | 5,378 |
| 12. | මුළු ජනගහනයෙන් ද්විතීයික අධ්‍යාපනය ලබා ඇති ප්‍රතිශතය | 53.6 | 62.0 | 75.0 |
| 13. | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළත්වීමේ ප්‍රතිශතය | 89.2 | 90.2 | 98.3 |
| 14. | ද්විතීයික අධ්‍යාපනය සඳහා පිවිසීමේ ප්‍රතිශතය | 90.6 | 97.7 | 98.0 |
| 15. | පාසල් නොයන දරුවන්ගේ ප්‍රතිශතය ( ජනගහනයට සාපේක්ෂව) | 11.0 | 8.0 | 3.0 |
| 16. | ප්‍රාථමික අධ්‍යාපනයෙන් ඇදහැලීමේ ප්‍රතිශතය | 1.52 | 0.77 | 0.23 |
| 17. | ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත පාසල් සංඛ්‍යාව මුළු පාසල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 63.58 | 78.16 | 96.4 |
| 18. | පරිගණක පහසුකම් සහිත 1AB සහ1C පාසල් (අ.පො.ස. උ.පෙළ ඇති) සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙසට | 10.0 | 80.0 | 83.5 |
| 19. | පරිගණක පහසුකම් සහිත 2 හා 3 වර්ගයේ පාසල් (ප්‍රාථමික සහ අ.පො.ස. සා.පෙළ සහිත) සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙසට | 2.0 | 8.0 | 20.1 |

## 9.2 පාසල් පද්ධතිය පිළිබඳ තොරතුරු

9.2.1 වගුව

| පාසල් වර්ගය අනුව පාසල් සංඛ්‍යාව - 2011 | | |
|---|---|---|
| 1AB පාසල් | 716 | 7% |
| 1C | 2,027 | 21% |
| 2 වර්ගයේ පාසල් | 4,045 | 42% |
| 3 වර්ගයේ පාසල් | 2,943 | 30% |
| එකතුව | 9,731 | 100% |


9.2.2 වගුව

| ජාතික හා පළාත් සභා පාසල් සංඛ්‍යාව - 2011 | | |
|---|---|---|
| ජාතික පාසල් | 342 | 4% |
| පළාත් සභා පාසල් | 9,389 | 96% |
| එකතුව | 9,731 | 100% |


9.2.3 වගුව

| ඉගැන්වීම් මාධ්‍ය අනුව පාසල් සංඛ්‍යාව - 2011 | | |
|---|---|---|
| සිංහල මාධ්‍ය | 6,312 | 64.9% |
| දෙමළ මාධ්‍ය | 2,808 | 28.9% |
| සිංහල හා දෙමළ | 60 | 0.6% |
| සිංහල හා ඉංග්‍රීසි | 371 | 3.8% |
| දෙමළ සහ ඉංග්‍රීසි | 138 | 1.4% |
| සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි | 42 | 0.4% |
| එකතුව | 9,731 | 100% |

9.2.1 රූපසටහන




9.2.2 රූපසටහන




සිසුන් 50ට අඩු පාසල් සංඛ්‍යාව මෙන් ම සිසුන් 2500ට වැඩි පාසල් සංඛ්‍යාව ද ක්‍රමයෙන් වැඩිවීම පසුගිය වර්ෂ ගණනාවක් තුළ දැකිය හැකි වූ ප්‍රවණතාවයකි. මෙම ප්‍රවණතාවට ගැටළු කිහිපයකට මුල් විය. කුඩා පාසල් වැසීයාම සහ විශාල පාසල් ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යාමට අපහසු ලෙස ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම මේ අතරින් ප්‍රධාන විය. ප්‍රවාහන සහ ආර්ථික අංශයේ සමාජීය වෙනස්වීම් ද මීට බලපෑ නමුත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වෙනස් ප්‍රවේශයක් ඇතිකොට මෙම තත්ත්වය මඟ හැරවීම සඳහා ගනු ලැබූ සුවිශේෂී පියවරක් වනුයේ ද්විතීයික පාසල් දහස සංවර්ධන වැඩසටහන හා ළමා මිතුරු ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන.


9.2.4. වගුව : අ.පො.ස. (උ.පෙළ) විද්‍යාධාරාව සහිත පාසල් සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව - 2011

| දිස්ත්‍රික්කය | උසස් පෙළ විද්‍යාධාරාව සහිත පාසල් සංඛ්‍යාව | උසස් පෙළ විද්‍යාධාරාව හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 68 | 14,920 |
| ගම්පහ | 53 | 8,810 |
| කළුතර | 40 | 6,520 |
| මහනුවර | 50 | 7,470 |
| මාතලේ | 17 | 1,940 |
| නුවරඑළිය | 30 | 2,360 |
| ගාල්ල | 45 | 7,270 |
| මාතර | 32 | 7,070 |
| හම්බන්තොට | 30 | 4,460 |
| යාපනය | 43 | 3,700 |
| කිලිනොච්චිය | 7 | 400 |
| මන්නාරම | 8 | 500 |
| වව්නියාව | 6 | 610 |
| මුලතිව් | 6 | 280 |
| මඩකළපුව | 21 | 2,060 |
| අම්පාර | 26 | 3,540 |
| ත්‍රිකුණාමලය | 18 | 1,370 |
| කුරුණෑගල | 51 | 8,720 |
| පුත්තලම | 21 | 2,550 |
| අනුරාධපුර | 21 | 3,325 |
| පොළොන්නරුව | 13 | 1,487 |
| බදුල්ල | 33 | 4,148 |
| මොණරාගල | 20 | 1,658 |
| රත්නපුර | 32 | 4,730 |
| කෑගල්ල | 25 | 4,183 |
| එකතුව | 716 | 104,081 |

## 9.3 ශිෂ්‍ය ප්‍රවේශය සහ සහභාගිත්වය

### 9.3.1 ශිෂ්‍යයින් රැඳී සිටීම

9.3.1. රූපසටහන : ශ්‍රී ලංකාවේ 5, 9 හා 10 ශ්‍රේණි දක්වා ශිෂ්‍යයින් රැදී සිටීමේ ප්‍රතිශතය – 2011




ශ්‍රී ලංකාවේ ළමයින් ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත්වීම සියයට 98.3ක් පමණ ඉහළ අගයක පැවතීම අධ්‍යාපන ප්‍රවේශය දැනටමත් උසස් මට්ටමක පවතින බව තහවුරු කරන ප්‍රබල සාධකයකි.


එලෙස ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත් වන ළමයින්ගෙන් සියයට 98ක් ම පස්වන ශ්‍රේණිය දක්වා රැදී සිටිති.
9 වන ශ්‍රේණිය දක්වා රැදී සිටීමේ අනුපාතය ගැහැණු සියයට 94ක් ද පිරිමි සියයට 90ක් දක්වා ද වේ. එලෙස ම 10 වන ශ්‍රේණියට යන විට ගැහැණු ළමුන් රැදී සිටීමේ අනුපාතය සියයට 90ක් ද පිරිමි ළමුන් රැදී සිටීමේ අනුපාතය සියයට 85ක් දක්වා ද අඩු වී ඇත.

විශේෂයෙන් ම පිරිමි ළමුන් සැලකිය යුතු ප්‍රමාණයක් 10 වන ශ්‍රේණියට පෙර පාසලෙන් ඉවත් වීම පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානය යොමු ව ඇත.

ද්විතියික පාසල් දහසක් සංවර්ධන ව්‍යාපෘතිය තුළින් ඉදිරිපත් කරන අධ්‍යාපන අවස්ථා මෙම ගැටළුවට විසඳුමක් වේ යැයි අපේක්ෂා කෙරේ.


### 9.3.2 අ.පො.ස (උ.පෙළ) සඳහා ශිෂ්‍ය සහභාගීත්වය

9.3.2 රූපසටහන : අ.පො.ස. (උ.පෙළ) විෂයධාරාවක් සඳහා සහභාගීත්වය




අ.පො.ස (සා.පෙළ) විභාගයේ සාධන මට්ටම අනුව 60%ක් පමණ ශිෂ්‍යයින් එනම් දළ වශයෙන් වාර්ෂික ව 175,000ක් පමණ ශිෂ්‍යයින් අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම සඳහා සුදුසුකම් ලබති. ඒ අතරින් 22%ක් පමණ විද්‍යා අංශයත් 27%ක් පමණ වාණිජ අංශයත්, 51%ක් පමණ කලා අංශයත් තෝරාගන්නා බව ඉහත වගුවෙන් සනාථ වේ. මෙම තත්ත්වය වෙනස් කොට අ.පො.ස (උ.පෙළ) විද්‍යා ධාරාව හැදෑරීම සඳහා ශිෂ්‍යයින් වඩාත් යොමු කිරීම සඳහා පියවර ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රමුඛතාවයෙන් යුතු ව ක්‍රියාත්මක කරන වැඩසටහනකි.

9.2.4. රූපසටහන : අ.පො.ස. (උ.පෙළ) විද්‍යාධාරාව හදාරණ ශිෂ්‍ය ප්‍රතිශතය - 2011





වර්තමානයේ උසස් පෙළ විද්‍යාධාරාව හදාරණ ශිෂ්‍ය ප්‍රතිශතය දිස්ත්‍රික් අතර 13.9% සිට 29.9% දක්වා විචලනයක් පෙන්වයි. එලෙස ම දළ වශයෙන් එක් පාසලකට සිටින අ.පො.ස (උ.පෙළ) ශිෂ්‍ය සංඛ්‍යාව 47 සිට 221 දක්වා දිස්ත්‍රික් මට්ටමින් වෙනසක් පෙන්වයි. ඒ අනුව අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂය හැදෑරීම සඳහා විද්‍යාගාර පහසුකම් ලබා දීම සහ ගුරුවරුන් ලබාදීම වැනි පහසුකම් සැපයීම සාධාරණ ලෙස ඉටුකර විෂමතා අවම කිරීමේ අවශ්‍යතාවය ඉහත සංඛ්‍යා විශ්ලේෂණයෙන් පැහැදිලිය.

ද්විතීයික පාසල් දහස සංවර්ධන ව්‍යාපෘතිය හරහා මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර ඉදිකොට විද්‍යා අධ්‍යාපන පහසුකම් නැංවීමත් පාසල් පාදක ව ගුරුවරුන් බඳවා ගනිමින් ගුරුවරුන් සැපයීමේ විෂමතා අවම කිරීමත් දැනටමත් ක්‍රියාවට නංවා ඇත.

## 9.4 සුදුසුකම් සපිරි ගුරු පරපුරක්

**9.4.1. රූපසටහන : වෘත්තීය සුදුසුකම් අනුව ගුරු ප්‍රතිශත - 2011**




2011 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ පුහුණු හා උපාධිධාරී ගුරු ප්‍රතිශතයන් හි 95% ක පමණ අගයක පැවතීම අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වූ එක් වැදගත් සාධකයකි.

නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අඛණ්ඩ ව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, ඒ අනුව අධ්‍යාපන සුදුසුකම් සපිරි ගුරුවරුන් 100% ක්ම වන සේ පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට නුදුරේදී ම හැකිවනු ඇත.


සමස්ත ලෙස ශිෂ්‍ය ගුරු අනුපාතය 18:1ක් වන අතර සෑම ශිෂ්‍යයින් 50කට ම උපාධිධාරී ගුරුවරයෙකු ද සෑම ශිෂ්‍යයින් 31ක් දෙනෙකුට පුහුණු ගුරුවරයෙකු ද වනසේ ගුරුවරුන් ලබාදීමට හැකි ව ඇත.

**9.4.1 වගුව: ශිෂ්‍ය ගුරු අනුපාතය**

| | ශිෂ්‍ය : උපාධි ගුරු අනුපාතය | ශිෂ්‍ය : පුහුණු ගුරු අනුපාතය | සමස්ත ශිෂ්‍ය : ගුරු අනුපාතය |
|---|---|---|---|
| 2010 | 50 | 31 | 18 |
| 2011 | 49 | 31 | 18 |


## 9.5 ශිෂ්‍ය සාධන මට්ටම් ඉහළයාම

**9.5.1.** රූපසටහන: 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70 ට ඉහළින් ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය - 2008-2012




### පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල ඇසුරින් ප්‍රාථමික ශිෂ්‍ය සාධනය ඇගයීම


පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය ශිෂ්‍යාධාර හා ද්විතීයික පාසල් ලබාදෙන තරගකාරී විභාගයක් පමණක් බවට පත්වීම මග හරවමින් විභාගයෙන් ලකුණු 70ට වඩා වැඩියෙන් ලබා ගන්නා සිසුන්ට සහතික පත් පිරිනැමීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර ඇත. සමස්ත ලෙස ප්‍රාථමික අධ්‍යාපනය දියුණු කිරීම සඳහා සියලු පහසුකම් සැපයීමට අවධානය යොමු කර ඇත. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍ය සාධන මට්ටම 2008 වර්ෂයට සාපේක්ෂ ව 2011 වර්ෂය වන විට ඉහළ මට්ටමකට පැමිණ තිබීම දැකිය හැක.


9.5.2. රූපසටහන : අ.පො.ස.( සා.පෙළ ) විභාගය **2007-2011** අ.පො.ස.( උ.පෙළ ) සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය


### අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

පසුගිය වර්ෂ 5ක අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල සංසන්දනය කිරීමේ දි පෙනි යන්නේ අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍ය ප්‍රතිශතය සාපේක්ෂ ව පෙර වර්ෂයන්ට වඩා 2010-2011 වර්ෂවල ඉහළ ගොස් ඇති බව යි. එමෙන් ම ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රිසි යන විෂයයන්වල ද සාධනය ඉහළ ගොස් ඇති අයුරු නිරීක්ෂණය කළ හැකි ය.

විභාග දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන ප්‍රතිඵල විශ්ලේෂණයන් ජාතික, පළාත්, කලාප හා පාසල් යන සියලු ම මට්ටම්වලට බෙදාහැරීම තුළින් ප්‍රතිඵල දියුණු කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගැනීමට සියලු පාර්ශවයන් ක්‍රියා කර ඇත. පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම, පසුගිය විභාගවල ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කර බෙදාහැරීම, ශිෂ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම, මාධ්‍ය හරහා ඉගෙනුම් අවස්ථා සම්පාදනය මෙම ක්‍රියාමාර්ග අතර වේ.


9.5.3. රූපසටහන : අ.පො.ස.( සා.පෙළ ) විභාගය **2008-2011** ඒ ඒ විෂයය සමත් ශිෂ්‍ය ප්‍රතිශතය



(දත්ත මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව)

## අ.පො.ස. (උ.පෙළ) ශිෂ්‍ය සාධන මට්ටම


ඒ ඒ විෂය ධාරාවට පෙනී සිටි ශිෂ්‍යයින් අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමේ ප්‍රතිශත 10.4 සහ 10.5 ප්‍රස්තාර වලින් පෙන්වයි. ඒ අනුව 2011, 2012 වර්ෂවලදී පළමු හා දෙවන වර විභාගයට පෙනී සිටි සියලු ම පාසල් අපේක්ෂකයින් ගෙන් 50%කට ආසන්න ප්‍රතිශතයක් විද්‍යා අංශයෙන් ද, 70% ආසන්න සංඛ්‍යාවක් කලා අංශයෙන් ද විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලබා ඇත. වාණිජ අංශයේ ශිෂ්‍ය සාධනය 2012 වර්ෂයේ දී 70%ක් ඉක්මවීම ද කැපී පෙනේ.

ද්විතීයික පාසල් දහස හා බැදි මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය වැනි උසස් ඉගෙනුම් ප්‍රවේශ අවස්ථා තුළින් විද්‍යා සහ වාණිජ අධ්‍යාපනය වඩාත් දියුණු කිරීමට ද කලා විෂයධාරාව විවිධාංගීකරණය කිරීමට ද තාක්ෂණ විෂයධාරාවක් හඳුන්වාදීමට ද පියවර ගෙන ඇති අතර, එමගින් ශිෂ්‍ය සාධන මට්ටම තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**9.5.4.** රූපසටහන : අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය විෂයධාරා අනුව (පළමු වර විභාගයට පෙනී සිටි පාසල් ශිෂ්‍යයින්)




**9.5.5** රූපසටහන : අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය විෂයධාරා අනුව (පළමු වර හා දෙවන වර විභාගයට පෙනී සිටි පාසල් ශිෂ්‍යයින්)




(දත්ත මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව)

## 9.6 ජාත්‍යන්තර විද්‍යා ගණිත ඔලිම්පියාඩ් ජයග්‍රහණ

9.6.1 වගුව : 2011, 2012 ඔලිම්පියාඩ් ජයග්‍රහණ

| තරගාවලිය | ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව | ලබාගත් මුළු පදක්කම් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | රන් පදක්කම් | රිදී පදක්කම් | ලෝකඩ පදක්කම් | එකතුව |
| **කණිෂ්ඨ විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරගාවලිය (2011 නොවැම්බර්, පිලිපීනය)** | 12 | 2 | 7 | 2 | 11 |
| **ආසියානු කනිෂ්ඨ ගණිත ඔලිම්පියාඩ් තරගාවලිය (2011 නොවැම්බර්, නේපාලය)** | 8 | - | 2 | 6 | 8 |
| **අන්තර්ජාතික ගණිත තරගාවලිය (2012 ජූලි, තායිවානය)** | 12 | - | 2 | 2 | 4 |
| **අන්තර්ජාතික විද්‍යා හා ගණිත ඔලිම්පියාඩ් තරගාවලිය (2012 ඔක්තෝබර්, ඉන්දියාව)** | 27 | 5 | 11 | 11 | 27 |

ජාත්‍යන්තර විද්‍යා ගණිත ඔලිම්පියාඩ් තරගාවලීන්ට ඉදිරිපත් කිරීම සඳහා පාසල් සිසුන් තෝරාගැනීම හා පුහුණු කිරීම ක්‍රමවත් වැඩසටහනක් අනුව සිදු කෙරේ. ඈත පළාත් වල සිටින දක්ෂ දරුවන්ට තම දක්ෂතා ඔප් නංවා ගැනීමට මේ යටතේ අවස්ථාව සලසා ඇත. 2011 වර්ෂයට වඩා වැඩි ජයග්‍රහණ ප්‍රමාණයක් 2012 වර්ෂයේ දී ලබා ගැනීමට හැකිවීම සුවිශේෂී ව සඳහන් කළ යුතුය.







# 10. මූලික සංඛ්‍යා දත්ත

## 10.1 වගුව : රජයේ පාසල් සංඛ්‍යාව 2007 - 2011

| පළාත | ඒ ඒ වර්ෂය අනුව පාසල් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 ** | 2010 | 2011 |
| බස්නාහිර | 1,351 | 1,340 | 1,340 | 1,338 | 1,333 |
| මධ්‍යම | 1,464 | 1,459 | 1,460 | 1,466 | 1,461 |
| දකුණු | 1,096 | 1,094 | 1,098 | 1,099 | 1,093 |
| උතුරු | 890 | 877 | 597 | 840 | 890 |
| නැගෙනහිර | 948 | 969 | 985 | 1,003 | 1,020 |
| වයඹ | 1,220 | 1,218 | 1,219 | 1,218 | 1,215 |
| උතුරු මැද | 776 | 774 | 776 | 780 | 776 |
| ඌව | 831 | 832 | 831 | 839 | 838 |
| සබරගමුව | 1,102 | 1,099 | 1,104 | 1,102 | 1,105 |
| ශ්‍රී ලංකාව | 9,678 | 9,662 | 9,410 | 9,685 | 9,731 |

*** සටහන : කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක තුළ සියලුම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක තුළ ඇතැම් රජයේ පාසල් ද 2009 ජුනි 01 සංගණන දිනය වන විට තාවකාලිකව වසා තිබුණි.*

## 10.2 වගුව : රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව 2007 - 2011

| පළාත | ඒ ඒ වර්ෂය අනුව ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 ** | 2010 | 2011 |
| බස්නාහිර | 894,752 | 898,299 | 906,240 | 915,872 | 929,403 |
| මධ්‍යම | 519,123 | 517,680 | 520,484 | 522,293 | 522,787 |
| දකුණු | 508,293 | 506,471 | 506,012 | 504,171 | 505,878 |
| උතුරු | 267,856 | 261,499 | 177,463 | 239,633 | 248,263 |
| නැගෙනහිර | 379,072 | 378,317 | 384,137 | 385,506 | 384,743 |
| වයඹ | 468,778 | 469,084 | 471,354 | 472,836 | 476,364 |
| උතුරු මැද | 253,132 | 252,482 | 253,594 | 254,464 | 259,298 |
| ඌව | 282,232 | 280,261 | 279,291 | 277,116 | 279,367 |
| සබරගමුව | 368,947 | 366,358 | 366,249 | 368,181 | 367,744 |
| ශ්‍රී ලංකාව | 3,942,185 | 3,930,451 | 3,864,824 | 3,940,072 | 3,973,847 |

*** සටහන : කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක තුළ සියලුම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක තුළ ඇතැම් රජයේ පාසල් ද 2009 ජුනි 01 සංගණන දිනය වන විට තාවකාලිකව වසා තිබුණි.*

**10.3** වගුව : රජයේ පාසල්වල ගුරුවරුන් සංඛ්‍යාව **2007 - 2011**

| පළාත | ඒ ඒ වර්ෂය අනුව ගුරුවරුන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | **2007** | **2008** | **2009 ****| **2010** | **2011** |
| බස්නාහිර | 42,033 | 41,349 | 40,559 | 40,460 | 41,352 |
| මධ්‍යම | 32,095 | 32,035 | 31,027 | 30,629 | 30,929 |
| දකුණු | 29,137 | 29,565 | 29,557 | 29,357 | 29,492 |
| උතුරු | 12,195 | 12,387 | 10,787 | 13,417 | 14,186 |
| නැගෙනහිර | 17,233 | 17,565 | 19,932 | 20,301 | 20,621 |
| වයඹ | 26,808 | 26,978 | 27,677 | 27,219 | 27,543 |
| උතුරු මැද | 12,491 | 14,138 | 14,484 | 14,720 | 15,082 |
| ඌව | 16,453 | 17,339 | 18,596 | 18,243 | 18,883 |
| සබරගමුව | 21,756 | 21,856 | 21,688 | 21,726 | 21,821 |
| ශ්‍රී ලංකාව | 210,201 | 213,212 | 214,307 | 216,072 | 219,909 |

*** සටහන : කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක තුළ සියලුම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක තුළ ඇතැම් රජයේ පාසල් ද 2009 ජුනි 01 සංගණන දිනය වන විට තාවකාලිකව වසා තිබුණි.*

**10.4** වගුව : උපාධිධාරී , පුහුණු හා නුපුහුණු ගුරු සංඛ්‍යාව පළාත් අනුව **–2011**

| පළාත | උපාධිධාරී ගුරු සංඛ්‍යාව | පුහුණු ගුරු සංඛ්‍යාව | නුපුහුණු ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 18,900 | 21,956 | 496 |
| මධ්‍යම | 9,915 | 18,629 | 2,385 |
| දකුණු | 11,577 | 17,548 | 367 |
| උතුරු | 5,013 | 8,420 | 753 |
| නැගෙනහිර | 6,182 | 13,776 | 663 |
| වයඹ | 9,979 | 16,087 | 1,477 |
| උතුරු මැද | 4,846 | 8,774 | 1,462 |
| ඌව | 6,493 | 10,568 | 1,822 |
| සබරගමුව | 8,043 | 12,937 | 841 |
| එකතුව | 80,948 | 128,695 | 10,266 |

**10.5** වගුව : **පෞද්ගලික පාසල් හා පිරිවෙන් සංඛ්‍යාව 2007 - 2011**

| ආයතන/වර්ෂය | 2007 | 2008 | 2009 | 2010* | 2011 |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පාසල් | 94 | 92 | 98 | 98 | 98 |
| පිරිවෙන් | 658 | 691 | 697 | 719 | 720 |

*තාවකාලිකව ප්‍රකාශිත

**10.6** වගුව : **පෞද්ගලික පාසල් සහ පිරිවෙන් ශිෂ්‍ය සංඛ්‍යාව 2007-2011**

| ආයතන/වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පාසල් | 113,884 | 115,070 | 114,974 | 117,362 | 121,764 |
| පිරිවෙන් | 54,935 | 56,065 | 58,067 | 62,091 | 62,861 |

**10.7** වගුව : **පෞද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන් සංඛ්‍යාව 2007 - 2011**

| ආයතන/වර්ෂය | 2007 | 2008 | 2009 | 2010* | 2011 |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පාසල් | 5,414 | 5,454 | 5,485 | 5,994 | 5,804 |
| පිරිවෙන් | 5,593 | 5,744 | 5,701 | 6,090 | 6,129 |

*තාවකාලිකව ප්‍රකාශිත

# ඇමුණුම්

# ඇමුණුම 1 : සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව

## සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව

| ජාතික පොදු නිපුණතා | [illegible] | ප්‍රාථමික (1-5 ශ්‍රේණි ) | ප්‍රාථමික ශ්‍රේණිවලට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා [illegible] | කණිෂ්ඨ ද්විතීයික (6-9 ශ්‍රේණි) | ජ්‍යෙෂ්ඨ ද්විතීයික: 10-11 ශ්‍රේණි | අ.පො.ස. (සා.පෙළ) විභාගය | ජ්‍යෙෂ්ඨ ද්විතීයික: 12-13 ශ්‍රේණි | අ.පො.ස. (උසස් පෙළ) විභාගය |
|---|---|---|---|---|---|---|---|---|
| 1. සන්නිවේදන නිපුණතා<br>2. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා<br>3 පරිසරයට අදාළ නිපුණතා<br>4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා<br>5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා<br>6. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා<br>7. ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා | | • ආගම (විෂය 5)<br>• මව්බස - සිංහල<br>• මව්බස - දෙමළ<br>• ගණිතය<br>• පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්<br>• ඉංග්‍රීසි (3 ශ්‍රේණියේ සිට)<br>• සිංහල සිසුන් සඳහා දෙමළ<br>• දෙමළ සිසුන් සඳහා සිංහල<br>*(පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, ගණිතය යන විෂයයන් සඳහා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි යොදා ගැනේ)* | | • ආගම (විෂය 5)<br>• සිංහල භාෂාව හා සාහිත්‍යය / දෙමළ භාෂාව හා සාහිත්‍යය<br>• ඉංග්‍රීසි<br>• ගණිතය<br>• විද්‍යාව<br>• ඉතිහාසය<br>• භූගෝල විද්‍යාව<br>• ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය<br>• සෞන්දර්යය (විෂය 7)<br>• ප්‍රායෝගික තාක්ෂණික කුසලතා<br>• සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය<br>• දෙවන බසක් ලෙස සිංහල/දෙමළ | • ආගම<br>• සිංහල භාෂාව හා සාහිත්‍ය / දෙමළ භාෂාව හා සාහිත්‍යය<br>• ඉංග්‍රීසි<br>• ගණිතය<br>• විද්‍යාව<br>• ඉතිහාසය<br>• කාණ්ඩ විෂය<br>විෂය 14 (I) විෂය 13 (II) විෂය 9 (III) | | • කලා විෂය ධාරාව<br>• වාණිජ්‍ය විෂය ධාරාව<br>• විද්‍යා විෂය ධාරාව<br>• ගණිත විෂය ධාරාව<br>• තාක්ෂණ විෂය ධාරාව<br>(සාකච්ඡා මට්ටමේ පවතී) | |
| | | එක් ශිෂ්‍යයෙකු හදාරනු ලබන විෂය සංඛ්‍යාව = 06<br>මුළු විෂය සංඛ්‍යාව = 12 | | එක් ශිෂ්‍යයෙකු හදාරනු ලබන විෂය සංඛ්‍යාව = 12<br>මුළු විෂය සංඛ්‍යාව = 26 | එක් ශිෂ්‍යයෙකු හදාරනු ලබන විෂය සංඛ්‍යාව = 09<br>මුළු විෂය සංඛ්‍යාව = 47 | | එක් විෂය ධාරාවක් යටතේ ශිෂ්‍යයෙකු හදාරනු ලබන විෂය සංඛ්‍යාව = 03<br>මුළු විෂය සංඛ්‍යාව = 56 | |
| | | විෂය සමගාමී ක්‍රියාකාරකම් | | විෂය සමගාමී ක්‍රියාකාරකම් | විෂය සමගාමී ක්‍රියාකාරකම් | | | |

මූලාශ්‍රය : ජාතික අධ්‍යාපන ආයතනය

# ඇමුණුම 2 : 2012 වර්ෂයේ දී නිකුත් කළ චක්‍රලේඛ

| දිනය | චක්‍රලේඛ අංකය | විෂය හා යොමුව |
|---|---|---|
| 2012.01.02 | 2012/01 | සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල |
| 2012.01.02 | 2012/02 | සමස්ත ලංකා සංගීත තරගය |
| 2012.01.02 | 2012/03 | ක්‍රිස්තු ධර්මය විෂය (රෝ.ක.නොවන) ගුරු ඌනතා පවතින පාසල්වල එය ඉගැන්වීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු වැඩ පිළිවෙල |
| 2012.01.09 | 2012/04 | රාජ්‍ය පාසල් නාට්‍ය උළෙල |
| 2012.01.27 | 2012/05 | පාසල් ළමුන් සඳහා ක්‍රියාත්මක වන පෝෂණ වැඩසටහන් |
| 2012.05.25 | 2012/05 (1) | පාසල් ළමුන් සඳහා ක්‍රියාත්මකවන පෝෂණ වැඩසටහන යටතේ ආහාර වේලට බිත්තර දෙකක් ලබා දීම |
| 2012.02.06 | 2012/06 | 2012 ශුද්ධ වූ සතියේ කතෝලික / ක්‍රිස්තියානි ආගමික එක්දින වැඩසටහන |
| 2012.02.15 | 2012/07 | පාසල් සිසුන්ට නිල ඇඳුම් රෙදි නොමිලේ ලබාදීමේ වැඩසටහන |
| 2012.03.02 | 2012/08 | 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය වර්ෂ පූර්ණ සැමරුම් වෙසක් සතිය (2012.02.02 – 2012.05.08 දක්වා) |
| 2012.03.08 | 2012/09 | අ.පො.ස.(උසස් පෙළ) විෂය නිර්දේශයේ ඇතැම් කොටස් 2012 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ඇගයීමෙන් ඉවත් කිරීම |
| 2012 | 2012/10 | ALL ISLAND WESTERN MUSIC AND DANCE COMPETITION 2012 |
| 2012.03.19 | 2012/11 | ජාතික බලශක්ති සංරක්ෂණ වැඩසටහන |
| 2012.03.22 | 2012/12 | අ.පො.ස (උසස් පෙළ) සංශෝධිත විෂය නිර්දේශය අනුව 2012 වර්ෂයේ සිට ඉදිරියට විභාග පැවැත්වීම |
| 2012.05.04 | 2012/13 | ප්‍රාථමික අධ්‍යාපන විෂයය නිර්දේශ නිසි ලෙස ක්‍රියාත්මක කිරීම |
| 2012.05.08 | 2012/14 | අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුලත් කිරීම |
| 2012/05/10 | 2012/15 | ප්‍රාථමික පාසල් 5000ක් පෝෂණය සඳහා වූ ද්විතියික පාසල් 1000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහනට අයත් ද්විතියික පාසල් 1000ක් සහ උතුරු පළාතේ ද්විත්යික පාසල් 400 ක් සඳහා ලබාදෙනු ලබන පාසල් සංවර්ධන සහ පාසල් සංවර්ධන මූල්‍ය ප්‍රදාන |
| 2012.05.17 | 2012/16 | බාහිර පාර්ශවයන්ට පාසල් වල නාට්‍ය, සෞන්දර්ය සංදර්ශන ශාබාව හෝ වැඩසටහන් සඳහා අවසර ලබාදීම ප්‍රමිතිගත කිරීම |
| 2012.05.22 | 2012/17 | පාසල පදනම් කරගත් ඇගයීම් මගින් සිසුන්ගේ ඉංග්‍රීසි කථන හා ශ්‍රවන කුසලතා පරීක්ෂා කිරීම |
| 2012.05.25 | 2012/18 | පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන |
| 2012.06.14 | 2012/19 | පාසල් වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීම |
| 2012.06.18 | 2012/20 | සමස්ත ලංකා ජාතික සමාජ විද්‍යා තරගාවලිය |
| 2012.06.25 | 2012/21 | 2012 අ.පො.ස (උ.පෙ) විභාගයේ සිට ක්‍රියාත්මක වන සංයුක්ත ගණිතය හා ගණිතය විෂය නිර්දේශ |
| 2012.07.30 | 2012/22 | ලිපි ගොණු කටයුතු වල යෙදෙන නිලධාරීන් අනිවාර්යෙන්ම පිලිපැදිය යුතු නියෝග |
| 2012.07.31 | 2012/23 | මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව අනාගත ශ්‍රී ලංකාවේ දූනුම කේන්ද්‍රීය සංවර්දන අරමුණු සාක්ෂාත් කර ගනු වස් ප්‍රාථමික පාසල් දහසක් ප්‍රතිනිර්මානය කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල් සංවර්ධන මාසයක් ප්‍රකාශයට පත් කිරීම |
| 2012.08.09 | 2012/24 | සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පරිගණක මධ්‍යස්ථාන ප්‍රශස්ත මට්ටමින් භාවිතය |
| 2012.08.13 | 2012/25 | පරිගණක සම්පත් මධ්‍යස්ථාන භාවිතය |
| 2012.08.22 | 2012/26 | අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය - “1988” විශේෂ ක්ෂණික ඇමතුම් අංකය |
| 2012.08.30 | 2012/27 | ගුරු සහායකයින් සඳහා ගෙවනු ලබන මාසික දීමනාව වැඩි කිරීම |
| 2012.08.30 | 2012/28 | පාසල් පරිශ්‍රය දුම් වැටි,මධ්‍යසාර,හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර කලාපයක් බවට පත් කිරීම |
| 2012.09.18 | 2012/29 | සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය හා ප්‍රදර්ශනය |

| දිනය | චක්‍රලේඛ අංකය | විෂය හා යොමුව |
|---|---|---|
| 2012.09.18 | 2012/30 | අධ්‍යාපන අමාත්‍යාංශය මෙහෙයවන සමස්ත ලංකා පාසල් සංගීත තරගය |
| 2012.09.18 | 2012/31 | සමස්ත ලංකා පාසල් නර්තන හා මුද්‍රා නාට්‍ය තරගය 2013 |
| 2012.09.18 | 2012/32 | සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල 2013 |
| 2012.09.18 | 2012/33 | රාජ්‍ය පාසල් නාට්‍ය උළෙල |
| 2012.09.24 | 2012/34 | පාසල්වල පිහිනුම් තටාක/ශ්‍රවනාගාර/රඟහල් සහ ක්‍රීඩා සංකීර්ණ කළමනාකරණය |
| 2012.10.01 | 2012/35 | මහින්දෝදය අධ්‍යාපන සංවර්ධන මාසය - 2012 ඔක්තොම්බර් කලාප අධ්‍යාපන කාර්යාලය හරහා ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන වැඩසටහන් හා සේවා සැපයීම් ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන කඩිනම් සමාරම්භක අදියර |
| 2013.10.03 | 2012/36 | අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන වැඩමුළු සඳහා ගෙවීම් කිරීම |
| 2012.10.05 | 2012/37 | ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නිති මාලාව |
| 2012.10.15 | 2012/38 | ද්විතියික පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ඉවත් කළ පාසල්වල දෙමව්පියන්ගේ / ආදි ශිෂ්‍යයන්ගේ පෝෂිත පාසල්වල 01 වන ශ්‍රේණියට ඇතුලත් කිරීම |
| 2012.10.16 | 2012/39 | අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (2012 – 2016) යටතේ සමසාධාරණත්වය තහවුරු වන පරිදි පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රදානය (School – Based Learning Improvement Grant) – 2012 |
| 2012.10.17 | 2012/40 | රජයේ පාසල් සඳහා විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය මිල දී ගැනීම හා බෙදාහැරීම |
| 2012.11.01 | 2012/41 | පාසල් වාර සටහන - 2013 |
| 2012.11.14 | 2012/42 | විශේෂ අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය සඳහා බඳවාගත් අධ්‍යාපන වෘත්තිකයන් එම ක්ෂේත්‍රයෙහි ම සේවයෙහි යෙදවීම |
| 2012.11.15 | 2012/43 | පාසල් පුස්තකාල සඳහා උපදෙස් සංග්‍රහය |
| 2012.11.26 | 2012/44 | පාසල් පෙළපොත් බෙදාදීමේ දිනය සංවිධානය 2012/12/06 |
| 2012.11.29 | 2012/45 | 2012 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම |
| 2012.11.30 | 2012/46 | පාසල් පරිගණක ජාල (School Net) වැඩසටහන |
| 2012.12.05 | 2012/41(i) | පාසල්වාර සටහන - 2013 |
| 2012.12.11 | 2012/47 | පාසල් පාදක සංවර්ධනය සඳහා සැලසුම්කරණය මූල්‍යකරණය හා ප්‍රතිසම්පාදනය |
| 2012.12.19 | 2012/48 | සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය (2013 සිට බලපැවැත්වෙන පරිදි) |

# ඇමුණුම 3 : අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරු හා නිලධාරීන් 2012.12.31 දිනට

## සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය

| | |
|---|---|
| අතිරේක ලේකම් | - එස්.යූ. විජේරත්න මයා |
| **ගුරු අධ්‍යාපන හා විද්‍යාපීඨ ශාඛාව** | |
| ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) | - ඩබ්.පී.ආර්. සිල්වා මිය |
| **දත්ත කළමනාකරණ හා පර්යේෂණ ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ඩබ්.එස්. පෙරේරා මයා |
| **සැමට අධ්‍යාපන සහ සහශ්‍ර සංවර්ධන ඉලක්ක ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - බී.පී. විතානගේ මිය |
| **විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එල්.ටී. ලාල් පද්මසිරි මයා |
| **මානව සම්පත් සංවර්ධන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - පුෂ්පා විජේසූරිය මිය |
| **නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ලලනි එන්. විජේසේකර මිය |
| **පිරිවෙන් ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - පූජ්‍ය වලස්වැවේ ඥාණරතන හිමි |
| **ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එම්.එම්. වේහැල්ල මිය |
| **පර්යේෂණ හා සංවර්ධන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - සී.එම්.පී.ජේ. තිලකරත්න මිය |
| **නීති ඒකකය** | |
| නීති නිලධාරී | - සුරංගි පෙරේරා මෙනවිය |
| **පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - අනුර ජයලත් ද සිල්වා මයා |
| **සංඛ්‍යා ලේඛන ශාඛාව** | |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යා ලේඛනඥ | - කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මිය |
| **ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - පී.ආර්.පී. සිල්වා මිය |

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය

| | |
|---|---|
| අතිරේක ලේකම් | - එච්.යූ. ප්‍රේමතිලක මයා |
| **සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ඩබ්.පී.එන්.ටී. ගුණතිලක මයා |
| **කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - බී.එල්.ඩී. බාලසූරිය මෙනවිය |
| **ද්වි භාෂා අධ්‍යාපන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ප්‍රියතා නානායක්කාර මිය |
| **විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන සහ සාම අධ්‍යාපන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ජී.ඩී.එම්.ඩී. බණ්ඩාර මයා |
| **වාණිජ අධ්‍යාපන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එම්. කමනි පෙරේරා මිය |
| **අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය** | |
| ලේකම් | - විජිත වෙලගෙදර මයා |

**ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.එම්. වීරසූරිය මිය

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ජී.එම්. නීල් ගුණදාස මයා

**ගණිත ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.ඩී.සී. බියන්විල මයා

**කළමනාකරණ හා ප්‍රමිති ඒකකය**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්.එම්.එල්.කේ. සෙනවිරත්න මිය

**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන ඒකකය**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ආර්.එම්.එම්. රත්නායක මයා

**නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එච්.පී.එන්. ලක්ෂ්මන් මයා

**ජාතික පාසල් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ජී.එන්. සිල්වා මයා

**වතු පාසල් සංවර්ධන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්. සහාරංජන් මිය

**ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය

**ආගමික හා සාරධර්ම ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්.බී.එම්. නිමල් ධර්මසිරි මයා

**විද්‍යා ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.පී. විපුලසේන මයා

**පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - රේණුකා පීරිස් මෙනවිය

**පාසල් කටයුතු ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.කේ.ඩබ්. විජේතුංග මයා

**ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ (වැ.බ.) - ඒ.ඩී.එම්.ඩී. බණ්ඩාර මයා

**දෙමළ පාසල් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්. මුරලිදරන් මයා

**මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඉසෙඩ්. තාජුඩීන් මයා

**නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය**
ව්‍යාපෘති අධ්‍යක්ෂ - එල්.ආර්.වී. ගුණරත්න මයා

**තාක්ෂණ අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඒ.ඩී. නන්දසේන මයා

## අධ්‍යාපන සේවා ආයතන අංශය

අතිරේක ලේකම් **- එච්.එම්.ආර්.බී හේරත් මයා**

**අධ්‍යාපන සේවා ආයතන ශාඛාව හා විදුහල්පති ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - තුෂාරා පතිරණගේ මිය

**ගුරුමාරු ඒකකය**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පී. සලාහුදීන් මයා

**ගුරු ආයතන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ආර්.ඩී.එම්.පී. වීරතුංග මයා

**ගුරු අධ්‍යාපනඥ සේවය**
සහකාර ලේකම් - ජේ.කේ. අතුකෝරල මිය

## පාසල් සැපයීම්, සේවා හා ඉදිකිරීම් අංශය

අතිරේක ලේකම් - අනුර දිසානායක මයා

**ප්‍රසම්පාදන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - දීප්තිකා ගුණරත්න මිය
ගණකාධිකාරී - වයි.එම්.එස්. ගුණසේකර මයා

**පාසල් ගොඩනැගිලි ශාඛාව**
අධ්‍යක්ෂ - අයි.එම්. ප්‍රනාන්දු මිය

**පාසල් සැපයීම් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බි.ඩී.සී. බියන්විල මයා

**පාසල් සැපයීම් ඒකකය**
ගණකාධිකාරී - වයි.එම්.එස්. ගුණසේකර මයා

**ගොඩනැගිලි කළමනාකරණ ශාඛාව**
ගොඩනැගිලි කළමනාකරු - ඒ.එච්.එච්.කේ. විරකෝන් මයා

## පාලන හා මුදල් අංශය

අතිරේක ලේකම් - එන්.එච්.එම්. චිත්‍රානන්ද මයා

ප්‍රධාන ගණකාධිකාරී - බී.ඒ.කේ. ජයසිංහ මයා

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවා නොවන, විනය සහ විමර්ශන)**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - පී.එච්.ඒ. විමලවීර මයා

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවය) සහ ඉඩම් ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ආර්.බී. ගන්කේවල මිය

**පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රවාහන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ඒ.පී. ගුරුගේ මිය

**මුදල් ශාඛාව**
ගණකාධිකාරී - එස්.පී.එන්. සමරසිංහ මිය

**විවිධ ගිණුම් ශාඛාව**
ගණකාධිකාරී - ජේ.කේ.එස්.එන්. පෙරේරා මයා

**ගෙවීම් ශාඛාව**
ගණකාධිකාරී - ගීතා හේමන්ති රුබසිංහ මිය

**විශ්‍රාම වැටුප් ශාඛාව**
ගණකාධිකාරී - වයි.එම්.එස්. ගුණසේකර මයා

**සැපයීම් ශාඛාව**
ගණකාධිකාරී - ඕ.පී.ආර්. දමයන්ති මිය

## විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය

**දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP)**
ව්‍යාපෘති අධ්‍යක්ෂ - අනුර දිසානායක මයා

**ජර්මන් සහයෝගීතා සංවර්ධන ව්‍යාපෘතිය (GIZ)**
ව්‍යාපෘති අධ්‍යක්ෂ - එස්. මුරලිදරන් මයා

**ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව**
ලේකම් ජනරාල් - ආර්.පී. පෙරේරා මයා

## විගණන අංශය

**රජයේ විගණන ශාඛාව**
විගණන අධිකාරී ඩබ්.එන්.ජී. මැණිකේ මිය

**අභ්‍යන්තර විගණන ශාඛාව**
ගණකාධිකාරී ඒ.ටී.කේ. අධිකාරි මිය